# නාට්‍ය හා රංග කලාව

# 11 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2016 සිට ක්‍රියාත්මක වේ)



සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# නාට්‍ය හා රංග කලාව

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සෞන්දර්ය දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

නාට්‍ය හා රංග කලාව

**11 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2015**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂය හැඳින්වීම

අපේ මාතෘභූමියටත්, සංස්කෘතියටත්, සොබාදහම හා සමස්ත ජීව, අජීව විශ්ව ධාතුවටත් හිතකාමී පුරවැසියකු නිර්මාණය කිරීමේ පුළුල් ජාතික පරමාර්ථයෙන් පාසල් පද්ධතිය තුළ දරුවන්ට ඉගෙනීමට ලැබෙන සුවිශේෂතම විෂයය සෞන්දර්ය විෂයයි. එය ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ලෙස අප විසින් හඳුනා ගන්නා ලද පහත දැක්වෙන සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම කියැවීමෙන් ඔබට මැනවින් අවබෝධ වනු ඇත.

සෞන්දර්යයෙන් සංස්කෘතිකමය ලැදියා පුබුදුවා, එමගින් නිර්මාණශීලී බව, සංවේදීතාව, දරා ගැනීම, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා දේශානුරාගය වඩවා මාතෘ භූමිය කෙරෙහි සංවේදී වූ දරු කැලක් හා සමාජයක් බිහි කිරීම.

("To sensitize students and the community through aesthetics to the Mother Land, endowed with cultural pride, creativity, sensitivity, tolerance, partriotism and a sense of national identity")

දේශය ගොඩනැංවීමේ දී විශ්වය සමග යහ සබඳතා පවත්වා ගනිමින් පෙරට යන අනාගත පුරවැසියා කෙසේ විය යුතු ද යන්න ගැඹුරින් විමසා බැලීමත් සමඟ මෙතෙක් පැවති සෞන්දර්ය විෂයයේ ජාතික දැක්ම අතික්‍රමණය කොට මෙම 2015 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය දෙස නවමු දෘෂ්ටියක් හෙළා ඇති බව එනයින් ම ඔබට පැහැදිලි වනු ඇත.

උසස් රසඥතා ඥානයකින් යුතු මානව හිතවාදී චින්තනයෙහි හෙබි ක්‍රියාශීලී සමාජානුයෝගී පුරවැසියකු ලෙස වැඩ ලෝකයට පිවිසීමට සෞන්දර්ය අධ්‍යාපනයෙන් ලබන ආධ්‍යාත්මික හා ශාරීරික ප්‍රබෝධය ඉවහල් කර ගැනීම අද්‍යතන සමාජ අවශ්‍යතාවකි.

සෞන්දර්ය අධ්‍යාපනයෙන් දරුවකු තුළ සොඳුරු මෙන් ම නිර්මාණශීලී හැකියාවන් හා චින්තනය ප්‍රවර්ධනය කිරීම ද විනය ගරුක, සදාචාරවත් අභිමානවත් පුරවැසියකු තැනීමේ වගකීම ඉටු කිරීම ද දෙවැනි වන්නේ ආගමෙන් මිනිසාට සැලසෙන සේවාවට පමණි.

එබැවින් විද්‍යා, ගණිත, වාණිජ, තාක්ෂණ හා භාෂා විෂයයන්ගෙන් ඥානනය වන මිනිස් සත්ත්වයාට මිනිස් ගුණ උරුම කරදෙන සෞන්දර්ය අධ්‍යාපනික විෂයයන් ඉගෙනීම එදාටත් වඩා අදට සහ හෙටට අත්‍යවශ්‍ය ම බැව් තරයේ ම කිව යුතු ව ඇත.

මෙම විෂයමාලා ප්‍රතිසංස්කරණයත් සමග අභිනවයෙන් 6 ශ්‍රේණියට පැමිණෙන දරුවන් නවමු චින්තනයක් ඇති අළුත් පරපුරක් ලෙස තැනුම උදෙසා පළමු ක්‍රියාකාරකමින් ම ස්වයං පෙලඹවීමක් ඇති වන පරිදි කැමැත්ත හා විශ්වාසය ගුරුවරයා විසින් දිනා ගත යුතු ය. ඒ සඳහා ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් අතින් විරචිත "ප්‍රාර්ථනාව" නම් වූ කුඩා ළමා ගීයක් දරුවාගේ ජීවන ප්‍රතිඥාවක් ලෙස දිනපතා පාඩම ඇරඹුමට පෙර ගැයුමට අපි යෝජනා කරමු.

| | | | |
|---|---|---|---|
| ස ස ස - | ස ස ස - | රි රි රි - | රි රි රි - |
| හො ඳ දේ s | හි ත මි s | හි තු දේ s | කි ය මි s |
| ස රි ස රි | ස ස රි - | රි ස රි ස | ස ස ස - |
| කි යු දේ s | ක ර මි s | ක ර මි න් | හැ දෙ මි s |

මෙම ප්‍රවේශයත් සමග ඇරඹෙන සෞන්දර්යයේ වින්දනාත්මක ඉගෙනුම ජාතික, සංස්කෘතික අනන්‍යතා හා විවිධ සම්ප්‍රදායයන් ස්පර්ශ කරමින් විශ්ව චින්තනයක් කරා දරුවාගේ දැනුම, හැකියා හා ආකල්ප පුළුල් කර ගැනීමට හැකි වන පරිදි විෂය කරුණු අප අධ්‍යාපනික මෙහි දී මනෝ විද්‍යාත්මක පදනමින් යුතු ව ක්‍රමික ව පෙළ ගස්වා ඇත.

එහි දී නායකත්වය, සහභාගිත්වය, ඉදිරිපත් වීම, සුහදත්වය, සාමූහිකත්වය, ඇගැයීම, සවන්දීම, පිළිගැනීම, බෙදාහදා ගැනීම, අන්‍යයන්ට ගරු කිරීම ආදී ආකල්ප සෑම සිසුවකු තුළ ම වර්ධනයට අවස්ථාව සැලසෙන පරිදි අප විසින් යෝජිත ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරය සකසා ගැනීමට ගුරුවරයා වශයෙන් ඔබට ද ඉඩකඩ ඇත.

තව ද දෛනික ජීවිතයේ දී මුහුණ දෙන විවිධ ගැටලුවලට සාර්ථකව මුහුණ දී තර්කානුකූල ව හා නිර්මාණාත්මක ව චින්තනය මෙහෙයවා ඒවා විසඳා ගැනීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීමට ද අප විසින් වත්මන් පරපුරට දායකත්වය සැපයිය යුතු ව ඇත.

එබැවින් ගුරු භවතුන් ලෙස ඔබ මෙම ගුරු මාර්ගෝපදේශය පෙරට වඩා හොඳින් පරිශීලනය කරන්නේ නම් ඔබගේ ද චින්තනයට අලුත් ආලෝකයක් හා ප්‍රබෝධයක් ලැබෙනු ඇත. ඒ ආලෝක කිරණ ජාතියේ දරු කැල මත පතිත ව ඔවුන් ද ඉමහත් ප්‍රබෝධයෙන් මෙම විෂයය ඉගෙනීමට යොමු වනු නොඅනුමාන ය.

එසේ ම කායික හා මානසික සමබරතාවෙන් හෙබි සෞඛ්‍ය සම්පන්න මෙන් ම නීරෝගී දිවිපෙවතක් ගත කිරීමට අවශ්‍ය පුද්ගල ශක්‍යතා සංවර්ධනය කිරීම හා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනංවා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර තලයේ නොසැලී කටයුතු කිරීමට විචාරශීලී මනසකින් හෙබි පුද්ගලයකු බිහි කිරීමට වගවීම සෞන්දර්ය අධ්‍යාපන විෂය භාර ව කටයුතු කරන ඔබ අප සැමගේ වගකීම වේ.

ඒ සඳහා 2015 වසරේ සිට 6 ශ්‍රේණියෙන් ඇරඹී ක්‍රියාත්මක වන මෙම නව ප්‍රතිසංස්කරණය දරුවන් හරහා අපි සැම නවමු ලොවකට පිවිසීමේ වැදගත් අවස්ථාවක් ලෙස දකිමින් උද්යෝගයෙන් හා කැපවීමෙන් වඩාත් ඵලදායි සේවාවක් සැලසීමට කැප වෙමු.

**අධ්‍යක්ෂ (සෞන්දර්ය)**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය :

**ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය**
ජාතික අධ්‍යාපන ආයතනය

සම්බන්ධීකරණය :

**කේ. ජී. අජිත් රූපසේන මයා**
ව්‍යාපෘති කණ්ඩායම් නායක (නාට්‍ය හා රංග කලාව)
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

විෂය නිර්දේශ විශේෂඥ උපදෙස් :

**මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (විශ්‍රාමික)

**මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා**
කොළඹ විශ්වවිද්‍යාලය

**මහාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය**
කැලණිය විශ්වවිද්‍යාලය

**විජයරත්න පතිරාජ මහතා**
ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)
ජාතික අධ්‍යාපන ආයතනය

ලේඛක මණ්ඩලය අභ්‍යන්තර :

**කේ. ජී. අජිත් රූපසේන මහතා**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

බාහිර

**වරුණ අලහකෝන් මහතා**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞන්දර්ය අංශය
ඉසුරුපාය, බත්තරමුල්ල

**ක්ලයිව් ශාන්ත මහතා**
ගුරු සේවය, ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල

**සෙනෙවිරත්න රුදිගු මහතා**
ගුරු උපදේශක - කොළඹ කලාපය

**රණසිංහ අධිකාරි මහතා**
ගුරු සේවය, මහින්ද විද්‍යාලය, ගාල්ල

**අනෝමා කුමාරි සමරක්කොඩි මහත්මිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
කලාප අධ්‍යාපන කාර්යාලය, ගිරිඋල්ල

**ලලිතා ජයරත්න මහත්මිය**
ගුරු උපදේශක - ඇඹිලිපිටිය කලාපය

**ඩී. පී. ස්වර්ණලතා මහත්මිය**
ගුරු උපදේශක - ඇල්පිටිය කලාපය

**සමන් කස්තුරිරත්න මහත්මිය**
ගුරු සේවය (විශ්‍රාමික)

**ජී. කරුණාවතී මහත්මිය**
අධ්‍යාපන පරිපාලන සේවය
ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය, කොළඹ

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නාට්‍ය හා රංග කලාව විෂයය පාසල් මට්ටමින් 6 වැනි ශ්‍රේණියට ඇතුළත් කරනු ලැබුවේ 2007 වර්ෂයේ දී ය. 11 වැනි ශ්‍රේණිය වන විට වඩාත් පුළුල් අයුරින් නිපුණතා ගොඩ නැංවීම සඳහා එය බෙහෙවින් ඉවහල් වී ඇත. නාට්‍ය හා රංග කලාව ගුරු අත්පොත සැකසෙනුයේ එම නිපුණතා සංවර්ධන ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා ගුරු භවතාට උපකාරකයක් වශයෙනි. එහි දී සිද්ධාන්ත, නිර්මාණ, කුසලතා, සංස්කෘතික පසුබිම, වින්දනය මෙන් ම ප්‍රායෝගික බව පාදක කොට ගෙන ක්‍රියාකාරකම් ගොඩ නංවා ඇත. විශේෂයෙන් ම මෙවර නව නිර්දේශය යටතේ තවදුරටත් මෙම විෂය ක්ෂේත්‍රය පුළුල් වන අතර, එහි දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානය යොමු කොට තිබේ.

මෙම ක්‍රියාකාරකම් තුළින් දැනුම, ආකල්ප හා කුසලතා මෙන් ම, චර්යා සංවර්ධනය ද සිදු කෙරේ. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් සම්පාදනය කර දීම අවශ්‍ය වේ. නාට්‍ය හා රංග කලාව විෂයය පිළිබඳ ව ලියැවුණු පොත් පරිශීලනය කිරීම සඳහා පුස්තකාල පහසුකම් සැලසීම, නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා රංග පීඨ භාවිත කිරීම. ක්‍රියාකාරී පන්ති කාමරයක් සැලසුම් කිරීම. නාට්‍ය තරග සංවිධානය කිරීම, රංග කලාව සම්බන්ධ ප්‍රදර්ශන, විවාද ආදී විවිධාංග සංවිධානය කිරීම මෙන් ම ජාතික තලයේ නාට්‍ය නැරඹීම සඳහා සිසුන් යොමු කිරීම ද මගින් තවදුරටත් මෙම නිපුණතා සංවර්ධනය කළ හැකි ය. එසේ ම පැවරුම් මගින් විෂය කරුණු ගවේෂණය කිරීමේ අවස්ථා ද සිසුන්ට ලබා දිය හැකි ය.

එමෙන් ම ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉගෙනුම් පල සාධනය සඳහා තක්සේරුකරණය (ඇගයීම් ක්‍රම) සෑම පාඩමක් සඳහා ම අන්තර්ගත කොට තිබේ. ඒ අනුව ශිෂ්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් ඔවුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම පිළිබඳ විනිශ්චයකට එළඹිය හැකි ය. ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමත්, එය ප්‍රතිපෝෂණය කිරීමත් යන අංශ දෙකකින් මෙම ඇගැයීම් ක්‍රියාවලිය සමන්විත වෙයි.

ගුරු මාර්ගෝපදේශයට පරිහරණය කිරීමේ දී මෙම මූලික රාමුව තුළ තමාට ලැබෙන සීමිත සම්පත් කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීමේ නිදහස ගුරු භවතා සතු වේ. උදාහරණයක් ලෙස සිසුන් කණ්ඩායම් කිරීමේ දී පන්තියේ ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගෙන සුදුසු පරිදි කණ්ඩායම් කිරීම කළ හැකි ය. එමෙන් ම වාර තුනට අදාළ ව කාලච්ඡේද සැලසුම් කර ගැනීමේ දී, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් පහසු වන ආකාරයෙන් එය සකස් කර ගත හැකි ය. මෙහි ක්‍රියාකාරකම් සඳහා දී ඇති ගීත, කවි, කතාන්දර ආදිය වෙනුවට ගුරු භවතාට අභිමත පරිදි වෙනත් ගීත, කවි, කතාන්දර ආදිය යොදා ගැනීමට නිදහස තිබේ.

විශේෂයෙන් ම ගුරු මාර්ගෝපදේශයට සීමා නොවී ශ්‍රේණිවලට උචිත පරිදි නව නිර්මාණ සකස් කර ගැනීමට ගුරු භවතාට අවස්ථාව ඇත. මෙම සියලු කාර්යයන් මගින් දරුවාට වඩාත් ප්‍රියජනක පන්ති පරිසරයක් හා ඉගෙනුම් අවස්ථා ලබා දීම ගුරු භවතාගේ වගකීම වන්නේ ය.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| හැඳින්වීම | v -vi |
| විෂයමාලා කමිටුව | vii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශය | x-xxiv |
| ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-89 |
| විවිධ සහාය | 90 |

# නාට්‍ය හා රංග කලාව

## විෂය නිර්දේශය

## 11 ශ්‍රේණිය

**(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**

# හැඳින්වීම

නාට්‍ය හා රංග කලාව යනු අතිශයින් නිර්මාණශීලී වූත්, ප්‍රායෝගික වූත්, වින්දනීය වූත්, විෂය ක්ෂේත්‍රයකි. පාසල් පද්ධතියේ වර්තමානයේ ක්‍රියාත්මක වන නිපුණතා පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමය හා අනුගත විෂය නිර්දේශයක් ලෙස නාට්‍ය හා රංගකලාව විෂය නිර්දේශය හැඳින්විය හැකි ය.

මුල් කාලයේ දී අ.පො.ස. උසස් පෙළ ශ්‍රේණි සඳහා පමණක් සීමා වී තිබුණු මෙම විෂයය, 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පසුව 10,11 ශ්‍රේණි දක්වා ද ව්‍යාප්ත විය. එය වඩාත් පුළුල් පරාසයක විකාශය වෙමින් 2007 වසරේ දී 6 වැනි ශ්‍රේණියෙන් ඇරඹෙන විෂය නිර්දේශය, නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය හා මැනවින් බද්ධ වී ඇත. මෙම විෂයය ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ, නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි ක්‍රියාකාරකම් පාදක කොටගත් විෂයයක් වන බැවින්. සමාජ ගැටලු නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනා ගෙන වින්දනාත්මක ව ග්‍රහණය කරගැනීමේ හැකියාව වර්ධනය කිරීම මෙමගින් අපේක්ෂිත ය.

නිර්මාණාත්මක හැකියාවන් හා ප්‍රායෝගික කුසලතාවන් වර්ධනය කිරීමත්, විචාරශීලී රසාස්වාදයට හුරු කිරීමත් අරමුණු කොට ගෙන ඇති මෙම විෂයය මගින් නාට්‍ය සිද්ධාන්ත, නිර්මාණාත්මක හැකියාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම, හා වින්දනීය මානව හිතවාදියකු බිහිකිරීම යන පංචවිධ නිපුණතා සාධනය කර ගැනීම අපේක්ෂා කෙරේ.

ළමා මනසට ගෝචර වන විචිත්‍ර ලෝකය හා වීරක්‍රියා වැනි සංකල්ප ගොඩ නැගීමට නාට්‍ය හා රංගකලාව විෂයය යොදා ගැනීම බෙහෙවින් සාර්ථක ය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී ප්‍රියජනක ඉගැනුම් අත්දැකීම් සමීප කරමින්, නිර්මාණශීලී පරපුරක් ගොඩ නැගීම හා එමගින් සමස්ත පුද්ගල පෞරුෂය ගොඩ නැගීමේ කාර්යය සඳහා ද මෙම විෂයය ඉවහල් වේ. නව ලෝකයේ සංකීර්ණ වූත්, වේගවත් වූත්, වැඩ පරිසරයට අවශ්‍ය වන ශ්‍රමදායකයා ද, විචාරශීලී නිර්මාණකරුවා ද, වින්දනය හා ස්වාභිමානය/ආත්මාභිමානය පුරුදු පුහුණු කළ මානව හිතවාදියා ද ගොඩ නැගීමට අවශ්‍ය දේශීය අනන්‍යතාව හා සංස්කෘතික උරුමය, ප්‍රායෝගිකත්වය හා නිර්මාණශීලීත්වය ගැබ් වූ ක්‍රමවේදයක් නාට්‍ය හා රංගකලාව විෂයය තුළ අන්තර්ගත වේ.

සමාජ ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට යථාර්ථවාදී හා ශුභවාදී විසඳුම් ලබා ගැනීමට අවශ්‍ය පෙර සූදානම මෙමගින් ලබාදෙන අතර, වින්දනීය මානව හිතවාදියකු මෙන් ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවකින් හෙබි අභිමානවත් පුරවැසියකු ගොඩනැගීමේ අභියෝගය නාට්‍ය හා රංගකලාව විෂය භාර ගුරුභවතුන් හමුවේ පවතින භාරදූර වගකීමක් බව අවසන් වශයෙන් සඳහන් කළ යුතු ය.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. (උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම



තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ස්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



**(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

**(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

**(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබාදීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව - 2003)

# විෂය අරමුණු

පරිසරයේ ඇති සියලුම වස්තූන් ඇසුරෙන් වින්දනයක් ලබා ගැනීමේ ශක්තිය ඇති එකම සත්ත්වයා, මිනිසා ය. මිනිසා හා මිනිසා අතර ඇති වන විවිධ ගැටීම් නාට්‍යමය දෘෂ්ටි කෝණයකින් හඳුනාගෙන, ඒවා වින්දනාත්මක ව ග්‍රහණය කර ගැනීමේ හැකියාව ශිෂ්‍යයා තුළ වර්ධනය කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

**නිර්මාණාත්මක ශක්ති වර්ධනය**

නාට්‍යමය සංසිද්ධීන් වින්දනයේ දී මෙන් ම නිර්මාණයේ දී ද ප්‍රබල තේමාවලින් යුක්ත වේ. එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් හා මිනිස් ඇසුර මගින් ලබන අත්දැකීම් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමට හැකි අනුභූතීන් ගොඩ නගා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි තවත් අපේක්ෂාවකි.

**ප්‍රායෝගික කුසලතා වර්ධනය**

නාට්‍යානුසාරී අභ්‍යාස මගින් නිර්මාණය වූත්, එසේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයන් සඵල කර ගැනීමට සරිලන්නා වූත්, ස්වකීය චාලක හැකියාවන් පෝෂණය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රායෝගික අවස්ථා මෙහි දී සැලසුම් කෙරේ.

**විචාර ශක්ති වර්ධනය**

සාහිත්‍යමය හා රංගමය වශයෙන් ද ජනසන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය වශයෙන් ද ඉදිරිපත් කෙරෙන නාට්‍යමය සංසිද්ධීන්, විමර්ශනාත්මක ව තර්කානුකූල ව විචාරයට ලක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද මෙහි මූලික අපේක්ෂාවකි.

**විෂයානුබද්ධ දේශීය හා විදේශීය අනන්‍යතාවන් හඳුනා ගැනීම**

ඉගැනුම් කාර්යයේ දී මෙන් ම, ඵලදායී දෛනික ජීවිතයට වැදගත් වන ඒ ඒ විෂයානුබද්ධ දේශීය අනන්‍යතාව පිළිබිඹු කෙරෙන සංස්කෘතික උරුමයන් පිළිබඳවත්, එම දැනුම පෝෂණය කෙරෙන වෙනත් විදේශීය උරුමයන් පිළිබඳවත් නිවැරදි චින්තනයකින් යුත් චරිතායනයක් සිසුන් තුළ ජනිත කිරීම අවශ්‍ය කරුණකි. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක විඳගැනීම මගින් සමාජයට අවශ්‍ය කරන මානව හිතවාදියකු ගොඩනැගීම ද මෙම විෂයයේ මුඛ්‍ය අරමුණක් වේ. නාට්‍ය හා රංග කලා විෂයානුබද්ධ දැනුම හා එමගින් මනා ආකල්ප ඇති කිරීම ද මෙම විෂය නිර්දේශයේ අපේක්ෂාව වන්නේ ය.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි | 1.1 ''ප්‍රාසංගික කලාව'' හඳුන්වයි. | 1.1.1 ප්‍රාසංගික කලාවට අයත් වන විෂයයන් හඳුනා ගැනීම.<br>1.1.2 ප්‍රාසංගික කලාවන්හි මූලික ලක්ෂණ හඳුනා ගැනීම.<br>1.1.3 සෙසු ප්‍රාසංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂී බව හඳුනා ගැනීම. | ♦ ප්‍රාසංගික කලා යනු කුමක්දැයි හඳුනා ගෙන සෙසු ප්‍රාසංගික කලා අතර නාට්‍ය කලාව සුවිශේෂ වන අයුරු විමසයි.<br>♦ රංග ආලෝකකරණය හා උපකරණ භාවිතය පිළිබඳ ව කරුණු ගවේෂණය කරයි.<br>♦ වේෂභූෂණ හා අංග රචනය භාවිත කරන ආකාරය නිරීක්ෂණය කරයි.<br>♦ නාට්‍ය, සංගීතය, රංග වින්‍යාසය, රංග භූමි අලංකරණය ආදී කරුණු පිළිබඳ ව විස්තර විමසයි.<br>♦ නාට්‍ය - ප්‍රේක්ෂක සහසම්බන්ධය නිරීක්ෂණය කරයි. | 15 |
| | 1.2 රංග ආලෝකකරණය හඳුනා ගනියි. | 1.2.1 රංග ආලෝකකරණය අධ්‍යයනය කිරීම.<br>1.2.2 ඉන් නාට්‍යයට සිදුවන මෙහෙය විස්තර කිරීම.<br>1.2.3 රංගාලෝක උපකරණ හඳුනා ගැනීම. | | |
| | 1.3 වේෂභූෂණ හඳුනා ගනියි. | 1.3.1 වේෂභූෂණ යනු කුමක් දැ යි හඳුනා ගැනීම.<br>1.3.2 වේෂභූෂණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කිරීම.<br>1.3.3 වේෂභූෂණවලින් නාට්‍යයකට ලැබෙන දායකත්වය විමසීම. | | |
| | 1.4 අංග රචනයෙහි යෙදෙයි. | 1.4 අංග රචනය සඳහා යොදා ගන්නා මූලික ශිල්පක්‍රම භාවිතය | | |
| | 1.5 නාට්‍ය සංගීතය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසයි. | 1.5 නාට්‍ය, සංගීතය හා රංග වින්‍යාසය අධ්‍යයනය කිරීම. | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.6 රංග භූමි අලංකරණය පිළිබඳ ව විමසයි.<br><br>1.7 නාට්‍ය කලාවෙහි ප්‍රේක්ෂක සහභාගිත්වය පිළිබඳ අවධානය යොමු කරයි. | 1.6.1 රංගභූමි අලංකරණය හැඳින්වීම<br>1.6.2 එහි දී සැලකිලිමත් වියයුතු කරුණු හා නාට්‍යයට ඉන් ලැබෙන දායකත්වය අධ්‍යයනය කිරීම.<br>1.7.1 ප්‍රෙක්ෂකයා යනු කවරෙක් දැ යි හැඳින්වීම.<br>1.7.2 ප්‍රේක්ෂකයාගේ අරමුණු හා නාට්‍ය - ප්‍රෙක්ෂක සහ සම්බන්ධය වටහා ගැනීම. | | |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි. | 2.1 ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි.<br><br>2.2 අභිරූපණ ඉදිරිපත් කරයි.<br><br>2.3 විවිධ චරිත නිරූපණයන්හි යෙදෙයි. | 2.1.1 සුදුසු චරිත හා අවස්ථා තෝරා ගැනීම.<br>2.1.2 නිර්මාණාත්මක ක්ෂණික නිරූපණයන්හි යෙදීම.<br>2.2.1 "අභිරූපණ" යන්නෙහි අර්ථ නිරූපණය කිරීම.<br>2.2.2 අභිරූපණය මගින් අත්දැකීම් ඉදිරිපත් කිරීම.<br>2.2.3 නියම කරන ලද චරිත ඇසුරින් අභිරූපණ ඉදිරිපත් කිරීම.<br>2.3.1 චරිත නිරූපණය නාට්‍යයක ප්‍රධාන අංගයක් බව හඳුනා ගැනීම. | ♦ ස්වකීය අත්දැකීම් අභිරූපණ මගින් ඉදිරිපත් කරයි.<br>♦ මිනිසුන්, සතුන්, වස්තූන් හා අවස්ථා යොදා ගනිමින් පරිකල්පනය උපයෝගි කොටගෙන චරිත නිරූපණයෙහි හා ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි.<br>♦ නාට්‍යමය අවස්ථා නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>♦ නාට්‍ය පෙළක් රචනාකොට නළු නිළියන්, වේෂභූෂණ , අංග රචනා වේදිකා අලංකරණ, ආදී නාට්‍ය අංග උචිත පරිදි යොදා ගෙන පෙළ රංගයක් බවට පත් කරයි.<br>♦ කෙටි නාට්‍ය පෙළක් රචනා කොට එය නිෂ්පාදනය කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 2.3.2 චරිත නිරූපණයෙහිලා වැදගත් වන කරුණු සාකච්ඡා කිරීම.<br>2.3.3 මිනිසුන්, සතුන් හා වස්තූන් පදනම් කරගෙන චරිත නිරූපණය කිරීම.<br>2.3.4 පරිකල්පනය උපයෝගි කර ගනිමින් චරිත නිරූපණය කිරීම. | | |
| | 2.4 නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 2.4.1 නාට්‍යමය අවස්ථා යනු කුමක්දැ යි හැඳින්වීම<br>2.4.2 අවස්ථා රැසකින් නාට්‍යමය අවස්ථා වෙන්කර ගැනීම.<br>2.4.3 එම අවස්ථා නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම. | | |
| | 2.5 පෙළ රචනා කරයි. | 2.5 විවිධ කතා පුවත් හා ඇසූ දුටු දේ ඇසුරින් නව අර්ථකථන සහිත ව පෙළක් රචනා කිරීම. | | |
| | 2.6 නළු - නිළියන් තෝරා ගනියි. | 2.6 නාට්‍ය පෙළට අදාළ අයුරින් නළු නිළියන් තෝරා ගැනීම. | | |
| | 2.7 වේෂභූෂණ නිර්මාණය කරයි. | 2.7 නාට්‍යයට උචිත අයුරින් වේෂභූෂණ සැලසුම් කිරීම. | | |
| | 2.8 අංග රචනය සැලසුම් කරයි. | 2.8 නාට්‍යෝචිත අංග රචනය සැලැසුම් කිරීම. | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.9 වේදිකා අලංකරණ සැලසුම් කරයි.<br><br>2.10. පෙළ රංගයක් බවට පත්කරයි.<br><br>2.11 කෙටි නාට්‍ය සංකල්පය හඳුනාගෙන නිර්මාණ කරයි. | 2.9 වේදිකා අලංකරණ නිර්මාණය කිරීම.<br><br>2.10 රචනා කරන ලද නාට්‍ය පෙළ රංගයක් බවට පත්කිරීම.<br><br>2.11.1 කෙටි නාට්‍ය සංකල්පය හඳුනා ගැනීම.<br>2.11.2 කෙටි නාට්‍ය පෙළක් නිර්මාණය කිරීම.<br>2.11.3 එම පෙළ නිෂ්පාදනය කිරීම. | | |
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි. | 3.1 රංග අභ්‍යාසවල යෙදෙයි.<br><br>3.2 නාට්‍ය පෙළ කියවයි.<br><br>3.3 සංවාද භාවිතයෙහි යෙදෙයි.<br><br>3.4 නාට්‍ය ගීත ගායනා කරයි. | 3.1.1 රංග අභ්‍යාසවල වැදගත්කම හඳුනා ගැනීම.<br>3.1.2 ශාරීරික අභ්‍යාස, මානසික අභ්‍යාස හා රංග ක්‍රීඩාවල යෙදීම.<br><br>3.2 නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් නාට්‍ය පෙළක නාට්‍ය අංග ග්‍රහණය කරගනිමින් පෙළ කියැවීම.<br><br>3.3 විවිධ නාට්‍යවලින් තෝරාගත් සංවාද භාවිත කිරීම.<br><br>3.4 පැරණි හා නව නාට්‍ය ගීත භාවාත්මක අයුරින් ගායනා කිරීම. | ♦ ශාරීරික - මානසික රංග අභ්‍යාසයන්හි සහ රංග ක්‍රීඩාවන් හි යෙදෙයි.<br>♦ නාට්‍ය පෙළ කියවමින්, සංවාද භාවිත කරයි.<br>♦ නාට්‍ය ගීත භාවාත්මක ව ගායනා කරයි.<br>♦ චරිත ප්‍රතිනිර්මාණය කිරීමෙහි සහ නාට්‍ය පෙළක් රචනා කොට නිෂ්පාදනය කිරීමෙහි ප්‍රායෝගික ව යෙදෙයි.<br>♦ වාද්‍ය ඛණ්ඩයකට අනුව ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.5 චරිත ප්‍රතිනිර්මාණය කරයි.<br><br>3.6 නව නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි.<br><br>3.7 ප්‍රකාශනාත්මක නිරූපණයන්හි යෙදෙයි. | 3.5.1 නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් නාට්‍ය පෙළක එන චරිත ප්‍රතිනිර්මාණය කිරීම.<br>3.5.2 විවිධ රංග ශෛලීන්ට අනුව චරිත ප්‍රතිනිර්මාණය කිරීම<br><br>3.6.1 නාට්‍ය පෙළ රචනා කිරීම<br>3.6.2 නළුවරණය, රූපණය හා රංග පුහුණුව<br>3.6.3 අදාළ ආනුෂංගික අංග සකසාගැනීම<br>3.6.4 රූපණයේ දී රංගභූමිය භාවිත කළ යුතු අයුරු ප්‍රායෝගික ව අත්විඳීම<br>3.7 සංයුක්ත තැටි මගින් සපයනු ලබන වාද්‍ය ඛණ්ඩයකට අනුව ප්‍රකාශනාත්මක නිරූපණයෙහි යෙදීම. | | |
| 4.නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි. | 4.1 දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි.<br><br>4.2 දේශීය ජනනාට්‍ය කලාව හඳුනාගනියි. | 4.1 ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ හඳුනාගැනීම (කොහොඹා කංකාරිය හා මඩු ශාන්ති කර්ම)<br><br>4.2.1 සොකරි<br>4.2.2 කෝළම් | | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.3 නාඩගම් කලාව පිළිබඳ ව විමසයි. | 4.3.1 නාඩගම් කලාවේ ආරම්භය<br>• නාඩගම් කලාවේ රංග ශෛලිය<br>• නාඩගම් කලාවේ විශේෂ ලක්ෂණ | | |
| | 4.4 නූර්ති කලාවේ විශේෂ ලක්ෂණ විමසයි. | 4.4.1 නූර්ති ආරම්භය<br>• නූර්ති රංග ශෛලිය<br>• නූර්ති විශේෂ ලක්ෂණ | | |
| | 4.5 නාට්‍ය වර්ග පිළිබඳ ව අධ්‍යයනය කරයි. | 4.5.1 පරිවර්තන නාට්‍ය<br>4.5.2 අනුවර්තන නාට්‍ය<br>4.5.3 ස්වතන්ත්‍ර නාට්‍ය | | |
| | 4.6 ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍ය කරුවන් හඳුනා ගනියි. | 4.6. පහත සඳහන් නාට්‍ය කරුවන් පිළිබඳ ව ගවේෂණය කිරීම<br>4.6.1 ජයලත් මනෝරත්න<br>4.6.2 ආර්.ආර්.සමරකෝන්<br>4.6.3 ගාමිණී හත්තොට්ටුවේගම | | |
| | 4.7 ශ්‍රී ලංකාවේ ප්‍රගමනයට දායක වූ රංග ශිල්පීන් පිළිබඳ ව විමසයි. | 4.7 පහත සඳහන් රංග ශිල්පීන් හඳුනා ගැනීම.<br>4.7.1 රත්නා ලාලනී ජයකොඩි<br>4.7.2 නීල් අලස්<br>4.7.3 මැණිකේ අත්තනායක<br>4.7.4 රම්‍යා වනිගසේකර<br>4.7.5 දීපානි සිල්වා<br>4.7.6 චාන්දනී සෙනෙවිරත්න<br>4.7.7 සුමින්ද සිරිසේන | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගැනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.8 සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | 4.8 බෞද්ධ/හින්දු/කතෝලික/ඉස්ලාම් සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමාවන්ට අනුව නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම. | | |
| 5. නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානවහිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ සාමූහික රස විඳීම හා ඒ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br><br>5.2 නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් පෙළක් නිෂ්පාදනයක් ලෙස රස විඳියි.<br><br>5.3 නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ඇගැයීමට ලක් කරයි. | 5.1.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි තේමාව, කතා වස්තුව හා යටිපෙළ ආදි කරුණු පිළිබඳ ව අදහස් ප්‍රකාශ කිරීම.<br><br>5.1.2 සංවාද, ශෛලිය, චරිත, ගැටුම් අවස්ථා, රංග විධාන, අපූර්වත්වය, සූච්‍ය කොටස්, හා ප්‍රයෝජ්‍ය කොටස් පිළිබඳ ව අවධානය යොමු කරමින් පෙළ රසවිඳීම.<br><br>5.2.1 නිර්දිෂ්ට නාට්‍යය නැරඹීම. (වේදිකාවේ හෝ සංයුක්ත තැටි මඟින්)<br><br>5.2.2 රංග ශෛලිය, චරිත නිරූපණය, සතර අභිනය භාවිත කිරීම ආදිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම<br><br>5.3 නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ගෙන නාට්‍ය දෘෂ්ටිය විග්‍රහ කිරීම | ♦ නිර්දිෂ්ට නාට්‍ය පෙළ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>♦ පෙළෙහි සියලු අංග පිළිබඳ ව අවධානය යොමු කරමින් පෙළ රසවිඳියි. නාට්‍ය නැරඹීමේ අවශ්‍යතාව අත්විඳියි. (ප්‍රදර්ශනය කරයි.)<br>♦ නාට්‍යයේ ශෛලය චරිත නිරූපණය, සතර අභිනය භාවිත කිරීම ආදී කරුණු අධ්‍යයනය කරයි.<br>♦ සමස්ත නාට්‍ය දෘෂ්ටිය විග්‍රහ කරයි. | 15 |

## 11ශ්‍රේණිය

| 1 වාරය | | 2 වාරය | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | මුළු කාලච්ඡේද |
| 1.1.1<br>1.1.2<br>1.2<br>1.2.1<br>1.3<br>1.4<br>1.5.1<br>1.5.2<br>1.6<br>1.7 | 17 | 2.1<br>2.2<br>2.3<br>2.4 | 08 | 2.5<br>2.6<br>2.7<br>2.8<br>2.9<br>2.10 | 12 | 37 |
| 3.1<br>3.1..2<br>3.1.3 | 05 | 3.2<br>3.3<br>3.4<br>3.5 | 11 | 3.6<br>3.7 | 04 | 20 |

## 11ශ්‍රේණිය

| 1 වාරය | | 2 වාරය | | 3 වාරය | | |
|---|---|---|---|---|---|---|
| නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | නිපුණතා මට්ටම | කාලච්ඡේද | මුළු කාලච්ඡේද |
| 4.1.1<br>4.1.2<br>4.2<br>4.2.2 | 07 | 4.3<br>4.4<br>4.5.1<br>4.5.2<br>4.6 | 12 | 4.7<br>4.8 | 05 | 24 |
| | | | | 5.1<br>5.2<br>5.3 | 09 | 09 |
| | 29 | | 31 | | 30 | 90 |

# ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ''ප්‍රාසංගික කලාව'' හඳුන්වයි.

**ක්‍රියාකාරකම** : ප්‍රාසංගික කලා හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ප්‍රාසංගික කලාව යන්න නිර්වචනය කරයි.
- ප්‍රාසංගික කලාවට අයත් විෂය ක්ෂේත්‍ර හඳුනාගනියි.
- ඒ ඒ කලාංගයට ආවේණික සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන ලේඛනගත කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සංගීත සංදර්ශනයක, නර්තන දර්ශනයක, මුද්‍රා නාට්‍යයක, ඔපෙරාවක, වේදිකා නාට්‍යයක පින්තූර හෝ දෘශ්‍ය පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 පින්තූර හෝ දෘශ්‍යපට පෙන්වමින් පහත සඳහන් කරුණු සිසුන්ට පැහැදිලි කරන්න.

පියවර 02 ප්‍රේක්ෂක හෝ ශ්‍රාවක පිරිසක් ඉදිරියේ ජීවමාන ව ඉදිරිපත් කරනු ලබන කලාව ප්‍රාසංගික කලාව ලෙසින් හඳුන්වන්න.

නැටුම්, සංගීතය, නාට්‍යය වැනි කලා ප්‍රාසංගික කලා ලෙස හඳුනාගත හැකි බව විස්තර කරන්න. ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියා ගේ පෞරුෂය මැනවින් හසුරුවා ගනිමින් රංග භූමියක කෙරෙන නිරූපණ කලාවක් ලෙස ප්‍රාසංගික කලාව හඳුන්වාදෙන්න.

සංගීත ප්‍රසංගයක් ඒකල හෝ සාමූහික වශයෙන් සජීවී ලෙස වේදිකාවක ඉදිරිපත් කැරුණත්, ශබ්ද විකාශන යන්ත්‍ර හා ශබ්ද පරිපාලනය වැදගත් වන බවත්, වේදිකා සැරසිලි හා රංගාලෝකය එහි ප්‍රසංගාත්මක ස්වරූපය තීව්‍ර කරන බවත්, ප්‍රධාන මාධ්‍යය නාදය බවත් පැහැදිලි කරන්න.

නර්තන කලාව ඉදිරිපත් කිරීමේ දී ආංගික අභිනය ප්‍රධාන වන අතර, විවිධ භූ හැඩතල, අවකාශමය හැඩතල සමුච්චයකින් නිර්මාණය වී ගොඩ නැගෙන සජීවී කලාවක් බව ද, මෙහි දී තාල වාද්‍ය භාණ්ඩ සංගීතය සඳහා යොදා ගැනෙන බව ද පහදන්න.

මුද්‍රා නාට්‍යයක් ද සජීවී කලාවකි. මුද්‍රා නාට්‍යයකින් කථාවක් හෝ අදහසක් නිරූපණය කරන අතර, නර්තන ශිල්පීන් විසින් රූපණය ඉදිරිපත් කෙරේ. මෙහි දී ආංගික වාචික අභිනය භාවිත නොකරන බවත්, සංගීතය හා රංගාලෝකය ඉතා වැදගත් වන බවත්, වේදිකා සැරසිලි අත්‍යවශ්‍ය නොවන බවත් පැහැදිලි කරන්න.

ඔපෙරාව ජීවමාන කලාවක් වන අතර, වේදිකා සැරසිලි අත්‍යවශ්‍ය නොවීම, ගායනය වැදගත් වීම, සංගීතය යොදාගනිමින් කථාවක් හෝ සිද්ධියක් නිරූපණය කිරීම වැනි කරුණු පැහැදිලි කරන්න.

ප්‍රාසංගික කලාවක් ලෙස නාට්‍යය ඉතා සුවිශේෂී බව විස්තර කරන්න. මෙහි දී නළුවන් සතර අභිනය යොදා ගන්නා බවත්, එය සජීවී කලාවක් බවත්, නළු-ප්‍රේක්ෂක සහසම්බන්ධය ඉතා වැදගත් බවත් පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සංගීත සංදර්ශනයක ප්‍රාසංගික බව හඳුනාගැනීම.
- නැටුම් සංදර්ශනයක ප්‍රාසංගික බව හඳුනාගැනීම.
- මුද්‍රා නාට්‍යයක ප්‍රාසංගික බව හඳුනාගැනීම.
- ඔපෙරාවක ප්‍රාසංගික බව හඳුනාගැනීම.
- වේදිකා නාට්‍යයක ප්‍රාසංගික බව හඳුනාගැනීම.

**පැවරුම** : ප්‍රාසංගික කලා වශයෙන් සැලකෙන විවිධ කලාංග ඇතුළත් පින්තූර එකතුවක් සකස් කරන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.1** : 'ප්‍රාසංගික කලාව'' හඳුන්වයි.

**ක්‍රියාකාරකම 1.1.3** : සෙසු ප්‍රාසංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂ ලක්ෂණ හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නාට්‍යයක අන්තර්ගත කලාංග පිළිබඳ ව විමසයි.
- විවිධ කලා මාධ්‍යයන්ගේ භාවිතය පිළිබඳ අවශ්‍යතාව තේරුම් ගනියි.
- විවිධ කලාවන් අතර නාට්‍යයට හිමි තැන අවබෝධ කරගනියි.
- ඍජු ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ක්ෂණික ව වෙනස්වීම් කළ හැකි බව වටහාගනියි.

**ගුණාත්මක යෙදවුම්** :
- වේදිකා නාට්‍යයක දෘශ්‍ය පටයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** නාට්‍යයක් යනු සාමූහික පිරිසක ගේ සහභාගිත්වය සහ විවිධ කලා මාධ්‍යයන්ගේ මනා වූ සුසංයෝගයක් බව පැහැදිලි කරන්න.

**පියවර 02** දෘශ්‍ය පටය (කොටසක්) නැරඹීමට අවස්ථාව සලසන්න. එහි දී භාවිත කලා මාධ්‍යයන් නිරීක්ෂණය කිරීමට සිසුන්ට උපදෙස් සපයන්න.

පියවර 03 නාට්‍යය සඳහා සතර අභිනය යොදාගැනීම, කතා වස්තුවට ප්‍රබල ස්ථානයක් හිමි වීම, ආකෘතිය, ශෛලිය හා තේමාව අනුව නාට්‍ය ප්‍රභේද වෙනස් වන බව, නාට්‍ය පෙළක භාවිතය, පෙළෙහි ඇතුළත් රංග විධානවල විශේෂත්වය, නිශ්චිත ස්ථානයක, නිශ්චිත කාල සීමාවක් තුළ නැරඹිය යුතු වීම, ප්‍රේක්ෂක ප්‍රතිචාර මත නාට්‍යයක වෙනස්වීම් පවා සිදුකළ හැකි වීම, ප්‍රේක්ෂකයා රසිකයකු මෙන් විචාරකයකු වන බවත් පහදන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයක ප්‍රාසංගික බව හඳුනාගැනීම.
- නාට්‍යයක ඇතුළත් විවිධ කලා මාධ්‍යයන් හඳුනාගැනීම.
- සජීවී බවෙහි ඇති සුවිශේෂත්වය අවබෝධ කරගැනීම.
- නාට්‍යය වෙනත් කලා මාධ්‍යයන් සමග සැසැඳීම.
- නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සහභාගී වන පිරිස නම් කිරීම.

පැවරුම : සෙසු ප්‍රාසංගික කලාවන් අතර නාට්‍යයට හිමි ස්ථානය පිළිබඳ සවිස්තරාත්මක රචනයක් ලියන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.2.3** : රංගාලෝකකරණය හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : වේදිකාවට ආලෝකය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ප්‍රොසීනියම් වේදිකාවක අඳුර පලවා හැරීමට උපක්‍රම යෝජනා කරයි.
- ආහාර්ය අභිනයේ විශේෂ අංගයක් වශයෙන් රංගාලෝකය වැදගත් වන බව පිළිගනියි.
- වේදිකා නාට්‍යයකට රංගාලෝකයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- නළු කාර්යය පහසු කිරීම පිණිස ''රංගාලෝකය'' සහාය කරගනියි.

**ගුණාත්මක යෙදවුම්** : නාට්‍යයක් දැක්වෙන දෘශ්‍ය පටයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 අතීතයේ රාත්‍රි කාලයේ පවත්වනු ලැබූ ශාන්තිකර්ම, ගැමි නාටක සඳහා ආලෝකය යොදා ගැනීම අත්‍යවශ්‍ය වීම, පන්දම්, කොප්පරා පහන්, දුම්මල කීරි ගැසීම වැනි දෑ භාවිතයෙන් ආලෝකය සපයාගැනීම, අනතුරුව කිට්සන් පහන්, ගෑස් ආලෝක භාවිතයේ සිට වර්තමානයේ ඉතා දියුණු ආකාරයෙන් විදුලිය ආලෝකය යොදාගත් ආකාරය සාකච්ඡා කරන්න.

පියවර 02 දෘශ්‍ය පටය ආධාරයෙන් නාට්‍ය කොටසක් ප්‍රදර්ශනය කිරීමට සලස්වා ආලෝකය භාවිත කර ඇති ආකාරය පිළිබඳ සිසු අවධානය යොමු කරවන්න.

පියවර 03 පින්තූර රාමු වේදිකාවක් තිර මගින් තුන් පැත්තකින් ආවරණය වී ඇති බවත්, ඒ නිසා ම පැතිරෙන අඳුර බැහැර කරගැනීම පිණිස විදුලිය ආලෝකය යොදාගත යුතු ව ඇති බවත් පැහැදිලි කරන්න.

විදුලිය ආලෝකයෙන් වේදිකාව ආලෝකවත් කිරීම ප්‍රධාන කාර්යයක් වුවත් රංගාලෝකය භාවිතය නාට්‍යයේ ගලායාම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව පැහැදිලි කරන්න.

පියවර 04 සමූහයක් අතුරෙන් පුද්ගලයකු විශේෂ කර පෙන්වීම, විශේෂ කාර්යයක් හුවා දැක්වීම, අවස්ථාව වඩා තීව්‍ර කිරීම, පරිසරය හුවා දැක්වීම, සියුම් රංගන අවස්ථා කෙරෙහි අවධානය යොමු කිරීම, පසුතල සවි කිරීම, ඉවත් කිරීම, දර්ශන මාරු කිරීම, ක්ෂණික ව වර්ණ වෙනස් කිරීම යනාදී වශයෙන් සුවිශේෂ කාර්යයන් කිරීමට රංගාලෝකය යොදාගත හැකි බව පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංගාලෝකය යන්න පැහැදිලි කිරීම.
- රංගාලෝකයේ ඇති වැදගත්කම සාකච්ඡා කිරීම.
- නාට්‍ය දෘශ්‍ය පටයේ ආලෝක භාවිතය හඳුනාගැනීම.
- ආදේශ උපකරණ භාවිතයෙන් ආලෝකය සපයාගැනීම.
- නාට්‍යය සජීවීකරණය කිරීම සඳහා රංගාලෝකයේ වැදගත්කම සාකච්ඡා කිරීම.

පැවරුම : රංගාලෝක භාවිතයේ සුවිශේෂ අවස්ථා සනාථ කෙරෙන ඡායාරූප එකතුවක් සකස් කරන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.2.3** : රංගාලෝක උපකරණ හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : ආලෝක උපකරණ හා භාවිතය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රංගාලෝක උපකරණ හඳුනාගනියි.
- ඒ ඒ උපකරණවල කාර්යභාරයන් විස්තර කරයි.
- රංගාලෝකය උපකරණ භාවිතය පිළිබඳ විවිධ අත්හදා බැලීම්හි නිරත වෙයි.
- තමන් ගේ නාට්‍ය නිෂ්පාදන සඳහා රංගාලෝකය භාවිත කරයි.
- වෙනත් නාට්‍ය නිෂ්පාදන සඳහා දායක වෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- රංගාලෝක උපකරණ රූගත් පින්තූර
- වේදිකා නාට්‍යයේ ආනුෂංගික අංග - ජගත් පද්මසිරි
- නාට්‍ය කලාවේ රංගාලෝකය - චන්ද්‍රසේන දසනායක
- වේදිකාවට ආලෝකය - සෙනෙවිරත්න රොඩ්‍රිගෝ
- වේදිකා කළමනාකරණය - එම්. සෆීර්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 රංගාලෝක බල්බ හා උපකරණ සහිත පින්තූර ප්‍රදර්ශනය කරමින් හඳුන්වාදෙන්න.

(ගුණාත්මක යෙදවුම් වශයෙන් යෝජිත ග්‍රන්ථ පරිශීලනයෙන් විෂය කරුණු වැඩිදුරටත් පැහැදිලි කරගත හැකි ය.)

ප්‍රධාන වශයෙන් භාවිත ආලෝක බල්බ හා උපකරණ

| | | |
|---|---|---|
| ධාරාලෝක පහන් | - | Flood light |
| යොමු පහන් | - | Spot light |
| වර්ණ චක්‍රය | - | Colour wheel |
| ඩිමරය | - | Dimmer |

''ගලා යන එළිය'' යන අර්ථය ඇතිව, පුළුල් කෝණ ආලෝකයක් සැපයීමත්, පසුබිම හා අවකාශය ද පොදුවේ මුළු වේදිකාව ද ආලෝක කිරීමට ධාරා පහන් යොදාගැනීමත් සිදු කරන බව පැහැදිලි කරන්න.

ඉලක්කය වෙත විහිදී යන ආලෝකය සහිත යොමු පහන, කාචයක් සහිත බැවින් විහිදෙන එළිය ලොකු කුඩා වශයෙන් ද තියුණු /මද/අධික වශයෙන් ද, ළඟ, දුර වශයෙන් ද, යොමු පහන හෙවත් තිත් පහනට ඉදිරියෙන් වර්ණ චක්‍රය සවි කිරීමෙන් බහුවර්ණ ලබාගත හැකි බව පෙන්වාදෙන්න.

ඩිමරය යනු ආලෝකය අඩු වැඩි කරන පාලක උපකරණයක් බව පැහැදිලි කරන්න.

පියවර 02 වේදිකා ආලෝක උපකරණ භාවිතය පිළිබඳ නව අත්හදා බැලීම් නිරන්තරයෙන් සිදුවන බව, පාවී යන වලාකුළ, ගින්දර, වැස්ස, හිම වැටීම, ගොඩනැගිලි හා භූමි දර්ශන සඳහා ප්‍රක්ෂේපණ යන්ත්‍ර භාවිත වන බව සහ ස්ට්‍රිප් (Strip) ලාම්පු, මිරර් බෝල් (Mirror ball), අල්ට්‍රා වයලට් ලාම්පු (Ultra violet), බබල් මැෂින් (Bubble maching) වැනි විශේෂ රංගාලෝක උපකරණ භාවිත වන බව පැහැදිලි කරන්න.

වේදිකා නාට්‍යයකට ආලෝක භාවිතය සඳහා රංග ආලෝක සැලසුම් පතක් සකස් කරගත යුතු බව, එහි ආලෝක සැලසුම් පත (cute sheet) නම් වන බව ඒ සඳහා විශේෂ ආලෝක සැලසුම් ශිල්පියෙකු ගේ සහාය ලබාගන්නා බව විස්තර කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංගාලෝකය සැපයීමේ දී භාවිත කරන ප්‍රධාන පහන් හා උපකරණ පිළිබඳ අවබෝධය.
- ආලෝක උපකරණ සහිත පින්තූර රැස් කිරීම.
- ආලෝක උපකරණ පිළිබඳ ගවේෂණය කිරීම.
- නාට්‍ය පෙළකට, විදුලිය ආලෝක භාවිතය සම්බන්ධ යෝජනා කිරීම හා සටහන් කිරීම.
- විදුලි ආලෝක පරිපථ පිළිබඳ නිවැරදි දැනුමක් ලබාගැනීම.

පැවරුම : වේදිකා නාට්‍යයක් සජීවී ව නරඹමින් හා ආලෝක භාවිතය පිළිබඳ නිරීක්ෂණය කරන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.3** : වේෂභූෂණ හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක වේෂභූෂණ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- වේෂභූෂණ යන්න පැහැදිලි කරයි.
- වේෂභූෂණවලින් නාට්‍යයකට ලැබෙන දායකත්වය විමසයි.
- වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු සාකච්ඡා කරයි.
- වේෂභූෂණ නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍යවල පින්තූර / චිත්‍ර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- සපයාගත් පින්තූර හා චිත්‍ර ප්‍රදර්ශනය කරමින් නළු-නිළියන් ගේ ඇඳුම් - පැළඳුම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- වේෂ යනු ඇඳුම් බවත්

  භූෂණ යනු පැළඳුම් බවත්

  ලියා දක්වන්න.
- වේෂභූෂණ අභ්‍යන්තර හා බාහිර සමාරෝපයට බලපාන බවත්, පෞද්ගලිකත්වයෙන් මිදී චරිතයට පිවිසීම සඳහා නළු-නිළියනට මෙය අත්‍යවශ්‍ය බවත්, ප්‍රේක්ෂකයන්ට නාට්‍යයේ චරිත හඳුනාගැනීමට වේෂභූෂණවලින් ප්‍රබල ඉගියක් ලැබෙන බවත්, එය ආහාර්ය අභිනයේ ප්‍රධාන අංගයක් බවත් විස්තර කරන්න.
- වේෂභූෂණ නිර්මාණය කිරීම සඳහා වේෂභූෂණ ශිල්පියකු සම්බන්ධ වීම.
- වේෂභූෂණ නිර්මාණය කිරීමේ දී නාට්‍යයේ ශෛලිය, කාලය, දේශය, යුගය හා චරිත ස්වභාවය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වීම,

  නළුවා ගේ ශරීර ප්‍රමාණය, ඡවි වර්ණය ආදී කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු වීම, පසුතල වර්ණ හා රංගලෝකය සමග ගැළපීම, පහසුවෙන් පරිහරණය කිරීමට හැකි අයුරින් සකස් විය යුතු වීම,

  ඇඳුමට ගැළපෙන ආකාරයෙන් භූෂණ හෙවත් ආභරණ සකස් විය යුතු වීම ආදි කරුණු පිළිබඳ ව විස්තර කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වේෂභූෂණ යන්න පැහැදිලි කිරීම.
- නාට්‍යයකට වේෂභූෂණ යොදාගැනීමේ වැදගත්කම විස්තර කිරීම.
- ලෝකධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දක්වීම.
- නාට්‍යධර්මී ශෛලියට අදාළ ව වේෂභූෂණ ඇඳ දක්වීම.
- වේෂභූෂණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු පෙළ ගැස්වීම.

පැවරුම : ඔබට වේෂභූෂණ නිර්මාණය කිරීමේ කාර්යය පැවරුණහොත් අනුගමනය කරන ක්‍රියාමාර්ගය අනුපිළිවෙළින් පහදන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.4** : අංග රචනයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : අංගරචනා මූලධර්ම හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- අංග රචනය හා ආනුෂංගික අංග අතර සම්බන්ධතාව විස්තර කරයි.
- ප්‍රධාන අංග රචනා ප්‍රභේද 04 හඳුනාගනියි.
- අංගරචනය සම්බන්ධ මූලධර්ම හඳුනාගනියි.
- චරිත අංග රචනය කරයි.
- ලෝකධර්මී හා නාට්‍යධර්මී ශෛලිය අතර වෙනස නිරීක්ෂණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ චරිත ඇතුළත් පින්තූර
- ලෝකධර්මී හා නාට්‍යධර්මී ප්‍රභේදයන්ට අයත් නාට්‍ය පින්තූර
- වේදිකා නාට්‍යයක කොටසක් සහිත දෘශ්‍ය පටයක්
- අංගරචනා ද්‍රව්‍ය හා උපකරණ කට්ටලයක්
- ආනුෂංගික කලා - ජගත් පද්මසිරි
- රූපණ ප්‍රවේශය - ජයන්තා රණවක

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- පින්තූර හෝ නාට්‍ය දෘශ්‍ය පට සිසුන්ට පෙන්වීමෙන් අංග රචනා විධි කෙරෙහි අවධානය යොමු කරවන්න.
- ප්‍රධාන අංග රචනා ප්‍රභේද 4 කි.
  - Straight - සරල, සෘජු, ස්වාභාවික
  - Character - චරිතාංග
  - Stylized - ශෛලිගත
  - Fantastic - මනඃකල්පිත
- අංගරචනා ද්‍රව්‍ය භාවිත කරන අන්දම ඉතා හොඳින් දැනගත යුතු වීම.
- පින්සල් මගින් වර්ණ, රේඛා නිවැරදි ව හැසිරවීමට දැනගත යුතු වීම.
- රූපවාහිනී නාට්‍ය සඳහා අංගරචනයන්, වේදිකා නාට්‍ය සඳහා අංගරචනයන් එකිනෙකට වෙනස්වීම.
- අංගරචනය කිරීමට පෙර පූර්ව සැලසුම් සකස් කළ යුතු වීම.
- නිසි පරිදි අංග රචනය ඉගෙන ගැනීමට අභ්‍යාසයෙහි යෙදිය යුතු වීම.
- චරිතයට සහ රංග ශිල්පියා ගේ මුහුණට ගැළපෙන ආකාරයට වර්ණ, රේඛා, හැඩතල යෙදිය යුතු වීම.
- අංග රචනය කිරීමේ දී ඇඳුම් නිර්මාණයට, පසුතල නිර්මාණයට, රංගාලෝකයට උචිත ලෙස වර්ණ ගැලපිය යුතු වීම.
- වර්ණ සමග කටයුතු කරන ශිල්පීන් හතර දෙනා වන අංගරචනා ශිල්පියා, වේෂභූෂණ ශිල්පියා, පසුතල නිර්මාණ ශිල්පියා හා රංගාලෝක ශිල්පියා යන ශිල්පීන් ගේ එකඟතාවක් තිබිය යුතු වීම.
- ලෝකධර්මී නාට්‍යයක අංග රචනයත්, නාට්‍යධර්මී නාට්‍යයක අංග රචනයත් එකිනෙකට වෙනස් වීම

යනාදි කරුණු සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අංග රචනා මූලධර්ම හඳුනාගැනීම.
- අංග රචනා ප්‍රභේද නම් කිරීම.
- වර්ණ මගින් චරිතයක ගති ලක්ෂණ හඳුනාගැනීම.
- පින්සල හා වර්ණ රේඛා නිවැරදි ව භාවිත කිරීම.
- ''චරිත'' අංග රචනය කර පෙන්වීම.

**පැවරුම** : ගුණාත්මක යෙදවුම් වශයෙන් නම් කළ ග්‍රන්ථ පරිශීලනය කර, දැනුවත් වීමෙන් යුතු ව අංගරචනය කිරීමේ අභ්‍යාසයෙහි නිරත වන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.5.1** : නාට්‍ය සංගීතය පිළිබඳ විමසමු.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක සංගීතය ගැන සොයා බලමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නාට්‍යයක සංගීතය යෙදිය යුතු ආකාරය වටහාගනියි.
- නාට්‍ය ගීතයක් ගායනා කරයි.
- නාට්‍යයකට සංගීතය වැදගත් වන අයුරු ප්‍රකාශ කරයි.
- සංගීතය සුවිශේෂ ලෙස යොදාගෙන ඇති නාට්‍ය නරඹයි.
- නාට්‍ය ගීතවලට අනුව රංගනයෙහි යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය ගීත ඇතුළත් ශ්‍රව්‍ය, දෘශ්‍ය පට කීපයක්
- නාට්‍ය ගීත හා පසුබිම් සංගීතය මනා ලෙස යොදාගත් නාට්‍ය දෘශ්‍ය පට කීපයක්
- නාට්‍ය ගීත ලියන ලද පත්‍රිකා කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- සංගීත කොටස් ඇතුළත් නාට්‍ය සංයුක්ත තැටියකට හෝ සජීවී ගායනයකට සිසුන්ට ඇහුම්කන්දීමට සලස්වන්න.
- එම ගායනයෙන් හෝ සංගීත පසුබිම් වාදනවලින් සිසුන්ට දැනුණු දේ පිළිබඳ ව විමසන්න.
- සිසුන්ගේ පිළිතුරුවල ඇති කරුණු ද පහත දැක්වෙන කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නාට්‍ය සංගීතය අයත් වන්නේ ආහාර්ය අභිනයට වන අතර නාට්‍ය ගීත අයත් වන්නේ වාචික අභිනයට බව.
- නාට්‍යයේ ශෛලියට අනුව සංගීතය යොදාගත යුතු බව හා නාට්‍ය ධර්මී ශෛලියේ දී සංගීතය සුවිශේෂ බව.
- තේමාවට උචිත ලෙසින් සංගීතය භාවිත කළ යුතු බව.
- නාට්‍යයේ අවස්ථා තීව්‍ර කිරීමට දායක විය යුතු බව.
- ප්‍රේක්ෂකයා තුළ රස ජනනය සඳහා සංගීතය දායක විය යුතු බව.
- නිර්මාණාත්මක බව, විවිධත්වය හා විචිත්‍රත්වය මැවීම නාට්‍ය සංගීතයේ මූලික අභිප්‍රායයන් විය යුතු බව.
- නාට්‍යමය අවස්ථා අතර සම්බන්ධතාව රැකගැනීමට ද නාට්‍ය සංගීතය යොදා ගත හැකි බව.
- නාට්‍ය ගීත සඳහා යොදන සංගීතය මෙන් ම පසුබිම් සංගීතය ද නළු-නිළියන්ගේ රංගය අබිබවා නොයන සේ යොදා ගත යුතු බව.

යනාදි කරුණු සාකච්ඡා කරන්න.

පියවර 02
- මනමේ, සිංහබාහු වැනි නාට්‍ය ධර්මී නාට්‍යයක සංයුක්ත තැටියකට හා ලෝක ධර්මී නාට්‍යයක් (විෂය නිර්දේශයට අදාළ විකෘති නාට්‍යය) සිසුන්ට නැරඹීමට හෝ ඇසීමට සලස්වන්න.

නරඹන ලද හෝ අසන ලද නාට්‍යයේ සංගීතයේ සුවිශේෂතා පිළිබඳ ව සාකච්ඡා කරන්න. සිසුන් ගෙන් ඒ පිළිබඳ ව අදහස් විමසමින් පහත කරුණු ද උපයෝගී කරගෙන සිසුන් ලවා සටහනක් සකස් කරවන්න.

- නාට්‍යධර්මී ශෛලියේ දී වඩාත් ප්‍රබල ලෙස හා සංගීතය මූලික කොට ගෙන නාට්‍ය රඟ දක්වන බව.
- මෙහි දී ගීත ගායනා (ගමන් තාල) පසුබිම් සංගීතය මෙන් ම සංවාද භාවිතය පවා තාලානුකූ ල ව රිද්මයානුකූල ව සිදු කරනු ලබන බව.
- සංගීතය රසෝත්පාදනයට ඉවහල් වන අතර ම අනවශ්‍ය ලෙස සංගීතය යොදාගැනීමෙන් රසයට බාධා පැමිණෙන බව.
- ලෝකධර්මී ශෛලියේ දී සංගීතය අවම වශයෙන් යොදා ගැනීම මෙන් ම සංගීතය යොදා නොගන්නා අවස්ථා ද දක්නට ලැබෙන බව (කැළණි පාලම නාට්‍යය එසේ සංගීතය යොදා නොගත් නාට්‍යයකි)
- නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ උපදෙස් පරිදි සංගීත අධ්‍යක්ෂ තම සංගීතය නිර්මාණය කළ යුතු බව.
- පිටපතට අනුව අවශ්‍ය නම් පමණක් සංගීතය යොදාගත යුතු බව.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍ය සංගීතය හඳුනාගැනීම.
- නාට්‍ය සංගීතය ශෛලිය අනුව වෙනස්වන ආකාරය දැක්වීම.
- නාට්‍යයේ සංගීතයෙන් ලැබෙන ප්‍රයෝජන දැක්වීම.
- නාට්‍ය නැරඹීමට ඇති රුචිකත්වය වර්ධනය.
- නාට්‍ය ගීත ගායනය හා රංගන කුශලතාව.

පැවරුම : නරඹන ලද නාට්‍යයක සංගීතය පිළිබඳ ව විචාරයක් කරගෙන ඒමට පැවරීම.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.5.2**: රංග වින්‍යාසය පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : රංග රචනයේ යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රංග වින්‍යාසය කුමක් ද යි විස්තර කරයි.
- රංග වින්‍යාසයේ මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- නාට්‍යයකට රංග වින්‍යාසය වැදගත් වන අයුරු විස්තර කරයි.
- නාට්‍යයක රංග වින්‍යාසය සකසයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය දර්ශන කිහිපයක් සහිත සංයුක්ත තැටි කිහිපයක්
- නාට්‍ය ඡායාරූප කිහිපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- නාට්‍ය දර්ශන කිහිපයක් ප්‍රදර්ශනය කරමින් පාඩම ආරම්භ කරන්න. වීඩියෝ පටවල දක්නට ලැබුණු නාට්‍ය දර්ශනතල නළු-නිළි චලන සිදුවන ආකාරය විමසමින් පාඩමට පිවිසෙන්න.
- නාට්‍යයක යම් අවස්ථාවක් නිරූපණය කර දක්වන විට එම අවස්ථාවට අදාළ ව නළු-නිළි චලනයන් තර්කානුකූල වත්, තාලාන්විත හෝ රිද්මයානුකූල වත් පෙළ ගැස්වීම රංග වින්‍යාසය ලෙස කෙටියෙන් ම දැක්විය හැකි බව පෙන්වාදෙන්න.
- නාට්‍යයෙහි දැකිය හැකි සංචලනය පදනම් කොටගෙන නළු-නිළියන් ගොනු කරමින් ද ආනුෂංගික කලාවන් ඊට සංයෝජනය කරමින් ද නිර්මාණය කරනු ලබන වේදිකා චිත්‍රය රංග වින්‍යාසය ලෙස සැලකිය හැකි බව පෙන්වාදෙන්න.

පියවර 02
- ගුරුවරයා ළඟ ඇති නාට්‍ය ඡායාරූප ද භාවිත කරමින් වේදිකාව තුළ නළු-නිළි චලනය මගින් රංග වින්‍යාසය සිදුවන අයුරු තව දුරටත් පහදන්න.
- විශේෂයෙන් රංග වින්‍යාසයේ දී වේදිකාවේ පිහිටීම (භූගෝලය) සැලකිල්ලට ගනිමින් වේදිකා සමබරතාව ද සැලකිල්ලට ගනිමින් චලන පද්ධතිය නිර්මාණය කළ යුත්තේ ප්‍රබල අර්ථයක් සහ දෘශ්‍ය රූපයක් මැවෙන අයුරින් බව පෙන්වාදෙන්න.
- රංග රචනයේ දී චලන වර්ග, හැඩතල පිළිබඳ ව අවබෝධය සහ ඇතැම් විට යම් යම් නර්තනාංග පිළිබඳව ද ශිල්පියාට අවබෝධයක් තිබිය යුතු බවත්, වේදිකා පසුතල හා රංගාලෝකය ද ඇතැම් විට වේෂභූෂණ ද රංගවින්‍යාසය සාර්ථක කරගැනීමේ දී ඉවහල් වන බවත් පෙන්වා දෙන්න.

පියවර 03
- රංග වින්‍යාසය සඳහා දේශීය නාට්‍ය නිෂ්පාදන කිහිපයක් උදාහරණ වශයෙන් ඉදිරිපත් කරන්න. මනමේ නාට්‍යයේ වැදි රජු හා මනමේ කුමරු අතර සටන ඉදිරිපත් කර ඇත්තේ නර්තනානුකූල රංග වින්‍යාසයකින් බවත්, හුණුවටයේ කථාවේ මයිකල් කුමාරයා හුණුවටයේ තියා දෙපැත්තට අදින අවස්ථාව නර්තානුකූල නොවන චලන පෙළකින් රංග වින්‍යාසය ගොඩ නගා ඇති බවත් පෙන්වාදෙන්න.
- නළු-නිළියන් සමූහයක් සිටියත් තනි හෝ දෙදෙනෙක් සිටියත් ඔවුන් වේදිකා අවකාශය තුළ චලනය කරවන ආකාරය රංග වින්‍යාසය ලෙස හඳුන්වන බව පෙන්වාදෙන්න.

**පියවර 04** රංග වින්‍යාස කාර්ය පැහැදිලි කරලීමෙන් අනතුරු ව සිසුන් කණ්ඩායම් 4 කට සමාන වන සේ බෙදා ගුරුවරයා විසින් නම් කරන ලද වේදිකා නාට්‍ය දැක්වෙන වීඩියෝ පට නරඹා නළු-නිළියන්ගේ චලන රටාවන් සිදුවන ආකාරය පිළිබඳ ව නිරීක්ෂණය කිරීමටත් ඒවා කණ්ඩායමක් වශයෙන් ද නිරූපණය කර දැක්වීමටත් අවස්ථාව සලසා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග වින්‍යාසය යනු කුමක් ද යි විස්තර කරයි.
- රංග වින්‍යාසය තුළ ඇති අංග ලක්ෂණ වෙන් වෙන් ව දක්වයි.
- නාට්‍යයක අර්ථයට රංග රටා නිර්මාණය වැදගත් බව පිළිගනියි.
- නාට්‍ය දර්ශනයකට අදාළ රංග වින්‍යාසය නිර්මාණය කරයි.
- රංග වින්‍යාසය තුළින් ගොඩ නැගෙන සෞන්දර්යාත්මක බව විස්තර කරයි.

පැවරුම : සිසුන් කණ්ඩායම් කර ලබා දුන් නාට්‍ය වීඩියෝ දර්ශන භාවිත කරමින් නළු-නිළි චලන සහිත අවස්ථා නිර්මාණය කර පෙන්වීමට යොමු කරවන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.6** : රංගභූමි අලංකරණය පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම** : රංගභූමි අලංකරණ හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- රංගභූමි අලංකරණය යන්න විස්තර කරයි
- රංගභූමි අලංකරණයෙහි විවිධතා හඳුනාගනියි.
- රංගභූමි අලංකරණ නිර්මාණය කිරීමේ මූලික සිද්ධාන්ත හඳුනාගනියි.
- නිර්මාණකරණය සඳහා යොදාගත හැකි අමු ද්‍රව්‍ය විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය කීපයක පසුතල දර්ශන සහිත පින්තූර
- සාර්ථක පසුතල නිර්මාණයන්ගෙන් යුක්ත වූ නාට්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 නාට්‍ය පසුතල සහිත පින්තූර හා දෘශ්‍ය පට පෙන්වමින් පාඩමට ප්‍රවේශ විය හැකි ය.

පියවර 02
- එම පසුතල පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවකාශ සලසමින් පහත දැක්වෙන කරුණු සාකච්ඡාවට බඳුන් කරන්න.
- නාට්‍යයෙන් ඉදිරිපත් වන විවිධ අවස්ථාවන්ට උචිත අයුරින් රංගභූමිය සකස් කිරීම රංගභූමි අලංකරණය යනුවෙන් හැඳින්වෙයි.
- නළු කාර්යය ඉස්මතු වන ලෙසත්, රඟපෑමට අපහසුතා ඇති නොවන ලෙසත්, රූපණ රටාවට ගැළපෙන ලෙසත් රංගභූමි අලංකරණ කළ යුතු ය.
- එය හුදු සැරසිල්ලක් නො ව, දර්ශනයට උචිත පරිදි වේදිකාව සැරසීමකි.
- රංගභූමි අලංකරණය නිර්මාණාත්මක ව, නාට්‍යෝචිත ව, අලංකාර ලෙස, සරල ව සකස් කළ යුතු වේ.
- නාට්‍ය පෙළෙන් කියැවෙන දේශයට, කාලයට හා යුගයට ගැළපෙන අයුරින් මෙන් ම රංග ශෛලියට උචිත අයුරින් රංගභූමි අලංකරණය කළ යුතු වේ.
- රංගභූමි අලංකරණයේ දි වත්මනෙහි චිත්‍ර වස්ත්‍ර මෙන් ම ස්ලයිඩ්ස් (වර්ණ විනිවිදක), ප්‍රක්ෂේපණ වැනි විවිධ තාක්ෂණයන් ද භාවිත කරයි.
- රංගභූමි අලංකරණ සහිත ව මෙන් ම රහිත ව ද නාට්‍යයක් ඉදිරිපත් කළ හැකි ය.
- රංගභූමි අලංකරණ සංකේතාත්මක ව ද ඉදිරිපත් කළ හැකි ය.
- ජීවමාන නළුනිළියන් යොදා ගැනීමෙන් ද රංගභූමි අලංකරණ සිදුකරනු ලබයි.
- රංග අලංකරණය සඳහා යොදා ගන්නා සෑම භාණ්ඩයක් ම නාට්‍යයේ ක්‍රියාවලිය හා බැඳී පැවතිය යුතු ය.
- පරිහරණයේ පහසුව, ඉක්මනින් සවි කිරීම, ගැලවීම, ප්‍රවාහනය, ඇසිරීම වැනි කාර්යන්හි පහසුව සලකා නිර්මාණය කළ යුතු වේ.
- රංගභූමි අලංකරණ හා වේෂභූෂණ නිර්මාණය රංගාලෝකය සමග සුසංයෝගී විය යුතු වේ.
- අධික වියදම් නොදරා සරල සහ ශක්තිමත් අමුද්‍රව්‍ය යොදා ගනිමින් අලංකරණ සකස් කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ.

පියවර 03 සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා, මාතෘකා බෙදා දෙමින්, අදාළ පසුතල ඇඳ දක්වීමට සිසුන් යොමු කරන්න. නිර්මාණ අගය කරන්න.

- වන අරණක්
- ප්‍රධාන නගරයක්
- පූජ්‍ය ස්ථානයක්
- කාර්යාලයීය පරිසරයක්
- දිය ඇල්ලක් සහිත භූමියක්

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වේදිකා අලංකරණය යන්න පැහැදිලි කිරීම.
- වේදිකා නාට්‍ය සඳහා අලංකරණ යොදා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කිරීම.
- අලංකරණ නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු අවධාරණය කිරීම.
- නිර්මාණාත්මක හා සංකේතාත්මක අලංකරණ ඇඳදක්වීම.
- වේදිකා අලංකරණ සහිත පින්තූර රැස් කිරීම.

පැවරුම : ඔබට වේදිකා නාට්‍යයක් සඳහා පසුතල නිර්මාණය කිරීමේ කාර්යය පැවරුණ හොත් ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ගය අනුපිළිවෙළින් පැහැදිලි කරන්න.

**නිපුණතාව 1.0** : නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 1.7** : නාට්‍ය කලාවෙහි ප්‍රේක්ෂක සහභාගිත්වය පිළිබඳ අවධානය යොමු කරයි.

**ක්‍රියාකාරකම** : බලමු, විඳිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :

- ප්‍රේක්ෂකයා යනු කවරෙක් දැ යි නිර්වචනය කරගනියි.
- ප්‍රේක්ෂකයා, විචාරකයකු ච රසිකයකු මෙන් ම විනිශ්චයකරුවකු ද වන බව ප්‍රකාශ කරයි.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක ගුණාත්මක බව මැනගැනීමට හේතු වන නිර්ණායක වන බව පවසයි.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයට අවශ්‍ය ම අංගයක් බව පෙන්වාදෙයි.

**ගුණාත්මක යෙදවුම්** : වේදිකා නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂක පිරිසක ගේ පින්තූරයක්, නාට්‍යයක් නරඹන ප්‍රේක්ෂක පිරිසක ගේ වීඩියෝ පටයක්, ක්‍රීඩා තරගයක් නරඹන පිරිසක ගේ පින්තූරයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 සිසුන් පිරිසකට පෙර දුන් උපදෙස් අනුව සිසු අත්දැකීමක් නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දෙන්න. අනෙක් සිසුන්ට එය නැරඹීමට අවස්ථාවක් ලබා දෙන්න.

එම අවස්ථාව නැරඹීමෙන් පසු ඒ පිළිබඳ සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න. සිසුන් ඉදිරිපත් කළ අත්දැකීම ගැන ගුණාත්මක යෙදවුම් වශයෙන් තෝරාගත් සියල්ල ද භාවිත කරමින් සාකච්ඡා කරන්න.

ඉගැනුම් අවශ්‍යතාවකට, කාලය ගෙවාදැමීමට, විනෝද වීමට, නාට්‍යයක් හෝ වෙනත් සංදර්ශනයක් නැරඹීම සඳහා විශේෂයෙන් සූදානම් ව පැමිණෙන පුද්ගලයා ප්‍රේක්ෂකයා වශයෙන් සලකන බව පහදාදෙන්න.

පියවර 02 සිසුන් කණ්ඩායම් කර මාතෘකාවක් ලබා දී හෝ සිසුන් ලැබූ අත්දැකීමක් නාට්‍යයක් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාවක් (සූදානම් වීමට විනාඩි 2 ක්) ලබා දීමෙන් පසු, ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ ලබාදෙන්න)

- විශේෂයෙන් එම ඉදිරිපත් කරන අදහස් විචාරයට මෙන් ම, රස විඳීමටත්, අන් අය ගේ නිර්මාණ අගය කිරීමට සිසුන් මෙහෙයවා ගැනීමටත් ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක අත්‍යවශ්‍ය අංගයක් බව තහවුරු කරන්න.
- නාට්‍ය දර්ශනයකට ප්‍රේක්ෂකයා අවශ්‍ය බවටත්, ප්‍රේක්ෂකයා නැතිනම් නාට්‍යයක් නොමැති බවටත් කරුණු සාකච්ඡා කරන්න.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක් පිළිබඳ යම්කිසි තක්සේරු කිරීමක් ලෙසට කරුණු පහදන්න.
- ප්‍රේක්ෂකයා යනු විචාරකයකු / රසිකයකු / පමණක් නො ව විනිශ්චයකරුවකු ද වශයෙන් හඳුන්වා දී සාධාරණ විචාරය හා ප්‍රතිචාර නාට්‍යයේ ඉදිරි ගමනට හේතුවන වග ද පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ප්‍රේක්ෂකයා යන්න හැඳින්වීම.
- ප්‍රේක්ෂකයා විචාරකයකු මෙන් ම රස විඳින්නකු බව ප්‍රකාශ කිරීම.
- ප්‍රේක්ෂකයා නාට්‍යයකට අවශ්‍ය ම අංගයක් බව ප්‍රකාශ කිරීම.

- අන් අය ගේ නිර්මාණ රසවිඳීමටත් අගය කිරීමටත් කැමති වීම.
- සාධාරණ විචාරය හා ප්‍රතිචාර නාට්‍යයක සාර්ථකත්වයට හේතු වන අයුරු විස්තර කිරීම.

**පැවරුම** :

- ඔබ දුටු නාට්‍යයක් පිළිබඳ විචාරයක් කරන්න.
- ප්‍රේක්ෂකයකු වශයෙන් ඔබ ලැබූ අත්දැකීමක් කෙටියෙන් සඳහන් කරන්න.

**අතිරේක උදව්** :

1. ළමා නාට්‍යකරණය - චන්ද්‍රසේන දසනායක
2. වෙස් මුහුණ ද සැබෑ මුහුණ ද - (ප්‍රේක්ෂකයා පාඩම කියවන්න)
   මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
3. ප්‍රේක්ෂකයා සඟරාව (අංක 01) - පසන් කොඩිකාර
4. නාට්‍ය ප්‍රවේශය - රංජිත් ධර්මකීර්ති
5. නාට්‍ය හා රංග භූමි ශිල්පය - දූරස්ථ මොඩියුලය - විජේරත්න පතිරාජ

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.1.1** : ක්ෂණික නිරූපණයෙහි යෙදෙයි.
**2.1.2**

**ක්‍රියාකාරකම** : සුදුසු චරිත හා අවස්ථා තෝරාගැනීම සහ නිර්මාණාත්මක ක්ෂණික නිරූපණයන්හි යෙදීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ක්ෂණික නිරූපණය යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- ක්ෂණික නිරූපණයේ මූලික විධික්‍රම වටහාගනියි.
- ක්ෂණික නිරූපණ ක්‍රියාවලියේ යෙදෙයි.
- අවස්ථා හා චරිත ක්ෂණික ව නිරූපණය කිරීමට පරිකල්පනය සහ නිර්මාණාත්මක චින්තනය අවශ්‍ය බව පවසයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. සිසුන් කවයක ආකාරයට සිටුවා කවය මැද පුටුවක් තබන්න. පුටුව පුටුවක් ලෙස නොගෙන වෙනත් භාණ්ඩයක් ලෙස සිතා එම භාණ්ඩය හා බැඳුණු ක්‍රියාවක් නිරූපණය සඳහා සිසුන් කිහිප දෙනකුට අවස්ථාව ලබා දෙන්න. සිසුන් කිහිප දෙනකු ගේ නිරූපණයන් නරඹා ඉන් අනතුරු ව එම නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ ව විමසමින් ක්ෂණික නිරූපණය යනු කුමක් ද යන්න වටහාදෙන්න.

පියවර 02
- ''පිටපතකින් තොර ව සීමිත කාලයක් තුළ දෙන ලද ඉඟියකට අනුව කිසියම් අවස්ථා නිරූපණයක් කිරීම ක්ෂණික නිරූපණය'' බව ප්‍රකාශ කරන්න.
- අවස්ථාවට හෝ සිද්ධියට අදාළ ව තම පරිකල්පන ශක්තිය මෙහෙයවා නිර්මාණාත්මක චරිත හා සිද්ධි ගොඩනගා ගැනීම ක්ෂණික ව කළ යුතු බවත්, එය අභිනයට භාවිතා කරමින් ඒ මොහොතේ ම රඟ දැක්වීම කළ යුතු බවත් පෙන්වාදෙන්න.
- මේ අනුව ක්ෂණිකව ලැබෙන මාතෘකාවට අනුව පරිකල්පන ශක්තිය මෙහෙයවා ස්වකීය අත්දැකීම් ද පදනම් කරගෙන අනුකරණ මාර්ගයෙන් අවස්ථාවක් ප්‍රතිනිර්මාණය කර දැක්වීම මෙමගින් සිදු වේ. මෙම හැකියාව තුළින් රංගන ශිල්පියකු ගේ දක්ෂතාව මැනිය හැකි බව ප්‍රකාශ කරන්න. සංවිධානගත නාට්‍ය රංගනයක දී හෝ නාට්‍ය වැඩමුළුවල දී මෙම ක්ෂණික නිරූපණ හැකියාව නළුවාට බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව පෙන්වාදෙන්න. මෙය ඒකල වශයෙන් ද සාමූහික වශයෙන් ද ඉදිරිපත් කළ හැකි බව සඳහන් කරන්න.

පියවර 03
- සිසුන් කණ්ඩායම් 3 කට හෝ 4 කට බෙදන්න. එම කණ්ඩායම්වලට ක්ෂණික ව නිරූපණය කළ හැකි වෙළඳපොළක්, මළ ගෙදරක්, රෝහලක අවස්ථාවක් වැනි මාතෘකා ලබා දෙන්න. විනාඩි 5-10 ක් අතර කාලයක් තුළ අවස්ථාවක් ගොඩ නගා ගෙන ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

පියවර 04
- සිසුන්ගේ ක්ෂණික නිරූපණ අවස්ථා නරඹා මුලින් ම සිසුන්ගෙන් ඒ පිළිබඳ ව අදහස් විමසන්න. දෙවනුව ගුරු අදහස් ඉදිරිපත් කරන්න. මූලිකව ම ඔවුන්ගේ නිරූපණයේ අගය කළ යුතු සාධනීය ලක්ෂණ පෙන්වා දී සිසුන් දිරිමත් කරන්න. ඉන්පසු අඩුපාඩු ද පෙන්වා දෙන්න.

- දෙන ලද මාතෘකාවට අදාළ ව ක්ෂණික නිරූපණ අවස්ථාවක් ගොඩනගාගන්නා විට ක්ෂණික නිරූපණය තුළ ඇති පහත සඳහන් ලක්ෂණ පිළිබඳ ව ද අවධානය යොමු කරවන මෙන් දන්වන්න.

- නිරූපණ අවස්ථාව තුළ යම්කිසි සිදුවීමක්, ක්‍රියාකාරිත්වයක් තිබිය යුතු ය. කථාවක් ප්‍රකාශ වන අකාරයට අවස්ථාව ගොඩ නගන්න උපදෙස් දෙන්න. නාට්‍යෝචිත අවස්ථාවක් විය යුතු බව ප්‍රකාශ කරන්න.

- අවස්ථාව හා බැඳෙන, ඒ තුළ ආරම්භ වී අවසන් වන නාට්‍යමය ක්‍රියාකාරිත්වයට අදාළ වන චරිත තෝරා ගැනීමට උපදෙස් දෙන්න.

- ක්ෂණික නිරූපණ අවස්ථාවක් යනු හුදු අවස්ථාවක් අනුකරණයට වඩා චරිත ගැටෙන නාට්‍යෝචිත අවස්ථාවක් නිරූපණය වීම බව පෙන්වා දෙන්න.
- මේ අනුව සිසුන් විසින් ඉදිරිපත් කරන ලද ක්ෂණික නිරූපණ නැවත මේ කරුණු ද සලකා බලා වඩාත් නාට්‍යමය ආකාරයට ගොඩනංවා නැවත රඟ දක්වා පෙන්වීමට යොමු කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ක්ෂණික නිරූපණය යනු කුමක් ද යි ප්‍රකාශ කිරීම.
- ක්ෂණික නිරූපණ අවස්ථා නිරූපණය කිරීම.
- ක්ෂණික නිරූපණ ක්‍රියාවලියට අදාළ මූලික ක්‍රමවේදයන් ප්‍රකාශ කිරීම.
- ක්ෂණික නිරූපණය වැදගත් වන අවස්ථා ප්‍රකාශ කිරීම.
- ක්ෂණික නිරූපණය කවරාකාර ද යි විමසීම.

පැවරුම : ළමුන් විසින් පන්ති කාමරයේ ඉදිරිපත් කරන ලද ක්ෂණික නිරූපණය වඩාත් හොඳින් ගොඩ නංවා ගෙන කෙටි නාට්‍යමය අවස්ථාවක් නිර්මාණ කිරීම.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.2 :** අභිරූපණ ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම 2.2.1 2.2.2 2.2.3** : අභිරූපණ යන්නෙහි අර්ථ නිරූපණය කිරීම සහ අභිරූපණය මගින් අත්දැකීම් ඉදිරිපත් කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- අභිරූපණය යන්න අර්ථ නිරූපණය කරයි.
- අභිරූපණ රංගනය සඳහා භාවිත කෙරෙන ක්‍රමශිල්ප සිය රංගන සඳහා භාවිත කරයි.
- විවිධ අත්දැකීම් අභිරූපණය මගින් ඉදිරිපත් කරයි.
- අභිරූපණ ශිල්පීන් නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- අභිරූපණ රංගන ශිල්පියකු ගේ ඡායාරූපයක්
- අභිරූපණ රංගනයක වීඩියෝ පටයක්

(ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරන ලද වීඩියෝ පටය ද ඇතුළුව)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ගුරුවරයා විසින් පන්තියට රැගෙන එන ලද අභිරූපණ ශිල්පියකු ගේ ඡායාරූපයක් හෝ වීඩියෝ දර්ශනයක් පෙන්වීම තුළින් පාඩමට පිවිසෙන්න. මුලින් ම ''අභිරූපණය'' යන්න නිර්වචනය කොට එහි අර්ථය පහදා දෙන්න. එහි මූලික ස්වභාවය පැහැදිලි කරන්න. ඒ සඳහා අතිරේක උදව් 1 යොදා ගන්න.

පියවර 02 අභිරූපණ රංගනයක් සඳහා විවිධ අත්දැකීම් පදනම් කරගන්නා බවත් විශේෂයෙන් ම නළුවාට අභිනය පෑමට හැකි සහ නරඹන්නාට මවා පෑමට හැකි සිදුවීම් සහ අවස්ථා එසේ නිර්මාණය කර ගන්නා බවත් ප්‍රකාශ කරන්න. අභිරූපණ රංගනයක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පෙන්වාදෙන්න. අතිරේක උදව් 2 යොදා ගන්න.

පියවර 03 අභිරූපණ රංගනයේ දී භාවිතා කරන මූලික ශිල්පීය ක්‍රම පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබාදෙන්න. අතිරේක උදව් 03 භාවිත කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අභිරූපණ රංගය අර්ථ නිරූපණය කිරීම.
- අභිරූපණ රංගයට අදාළ අවධානයට ගත යුතු කරුණු ප්‍රකාශ කිරීම.
- අභිරූපණ රංගයේ ක්‍රමශිල්ප කර දැක්වීම.
- අභිරූපණයේ දී ප්‍රමුඛ වන අභිනය නම් කිරීම.
- අභිරූපණයක් ඉදිරිපත් කරන ආකාරය විස්තර කිරීම.

**පැවරුම** : පන්තියේ සිසුන් කණ්ඩායම් කර සුදුසු මාතෘකා ලබා දෙන්න. සාමූහික අභිරූපණ රංගයක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

**අතිරේක උදව් 01** : අභිරූපණය යනුවෙන් හැඳින්වෙන්නේ ආංගිකාභිනය මූලික කරගෙන වාචිකාභිනයෙන් තොර ව යම්කිසි සිද්ධියක් හෝ ක්‍රියාකාරකමක් නිර්මාණශීලී ව රඟ දක්වා පෙන්වීම යි. සාත්ත්වික අභිනය ද මේ සඳහා යොදා ගනු ලබන අතර ප්‍රමුඛ වන්නේ ආංගිකාභිනය යි.

ශිල්පියා කිසිදු විටක සැබෑ ලෝකයේ ද්‍රව්‍ය පරිහරණය නොකර හිස් අවකාශයේ සියලු ම ද්‍රව්‍යයන්හි හැඩය, බර, ප්‍රමාණය පැහැදිලි ලෙස මවාපායි. අභිරූපණ ශිල්පියා කිසියම් අවස්ථාවක් හෝ සිදුවීමක් සම්බන්ධ ක්‍රියා පද්ධතිය අංගහාරය (Gesture) සහ ඉරියව් භාවිත කරමින් ද ඒ තුළ යම්කිසි ගැටුමක් සහිත ක්‍රියාකාරිත්වයක් ගොඩ නැගෙන අයුරින් ද නිර්මාණ කළ යුතු වේ.

උදා: ළමයා සරුංගලයක් යවනවා පමණක් ප්‍රමාණවත් නැත. ඒ හා බැඳුණු යම් සට්ටනාත්මක ක්‍රියාවලියක් නිරූපණය වන සේ අභිරූපණය ගොඩ නැගිය යුතු යි.

අභිරූපණ රංගනයන් ප්‍රධාන වශයෙන් ම ඒකල ව ඉදිරිපත් කිරීමක් ලෙස දැකිය හැක. එහෙත් ඉඳහිට සාමූහික අභිරූපණ රංග ඉදිරිපත් වේ.

**අතිරේක උදව් 02 :**

අභිරූපණ රංගනයක් නිර්මාණය කිරීමේ දී යොදාගනු ලබන අභ්‍යන්තර ශිල්ප ක්‍රම සහ බාහිර ශිල්ප ක්‍රම වශයෙන් ශිල්ප ක්‍රම ද්විත්වයෙක් වේ.

අභ්‍යන්තර ශිල්ප ක්‍රම යනු අභිරූපණ රංගනයට අදාළ කරගත් සිද්ධියේ අවස්ථාවන් පිළිබඳ ව ඉතා සියුම් මනසින් මෙනෙහි කිරීමයි.

බාහිර ශිල්ප ක්‍රම යනු මනසින් නිර්මාණය කරගත් සිද්ධිය සිරුර උපයෝගී කරගෙන ඉදිරිපත් කිරීමයි.

අභිරූපණ රංගනයක් නිර්මාණය කරගැනීමේ දී විශේෂයෙන් ම මිනිස් සිරුර භාවිතය තුළින් විවිධ දේ මවා පෑමට හැකි ආකාරයේ අවස්ථාවන් හා සිදුවීම් තෝරාගත යුතු යි. නිරූපණය තාත්ත්විකත්වය ඉක්ම වූ අධිරංගන ස්වභාවයක් ගනී. එනම් අතිශයෝක්තියෙන් යුක්ත නිරූපණයකි. චලනයන් තුළ ද යම්කිසි රිද්මානුකූලභාවයක් ඇත.

තෝරා ගන්නා සිද්ධිය නාට්‍යමය ගුණයෙන් යුක්ත ව ගොඩනගා ගත යුතු යි. සාමාන්‍යයෙන් අභිරූපණ රංගයක් විනාඩි 5-10 ත් අතර කාල සීමාවකට සීමා කරගත යුතු වේ.

අංග රචනය ද සුවිශේෂී භාවයක් ගනී. විශේෂයෙන් මුහුණු රචනය කරන්නේ චරිතයක් මතුවන ආකාරයට මුහුණේ උපාංග වඩාත් හොඳින් ඉස්මතු වන අන්දමට යි.

භාවිත කරනු ලබන ඇඳුම්වල ස්වභාවය ද වර්ණය ද ශිල්පියා වඩාත් කැපීපෙනීමට හේතු වන අයුරින් යොදාගනී. චරිතයේ ස්වභාවයට අනුව ඇඳුම් භාවිත කරන්නේ නැත. ශරීරාංග මැනවින් ඉස්මතු වන අයුරින් ඇඳුම් භාවිත කරයි. ඉදිරිපත් කරනු ලබන අභිරූපණ රංගය වඩාත් තීව්‍ර කිරීමට සහ අර්ථවත් කිරීමට රංගයට අදාළ ශබ්ද සහ නාදයන් (සංගීතය) ඇතැම් විට භාවිත වේ.

සීමිත අවකාශයක් තුළ නරඹන ප්‍රේක්ෂකයාට විවිධ රසභාව සහ අර්ථ ජනනය වන සේ සමස්ත රංගය ගොඩනගා ගැනීම සිදු වේ.

**අතිරේක උදව් 03 :**

අභිරූපණ රංගනය සාමාන්‍ය තාත්ත්වික රංගනයට වඩා වෙනස් වේ. තාත්ත්විකත්වය ඉක්මවූ අතිශයෝක්තියක් ද චලන යම් රිද්මයානුකූල භාවයකින් ඉදිරිපත් කිරීම ද අභිරූපණ රංගවල දැකිය හැකි ලක්ෂණයකි. මෙවන් ආකාරයකට ඉදිරිපත් වීමේ දී ඒ සඳහා ම වූ ශිල්ප ක්‍රම ඇත.

සාමාන්‍යයෙන් අභිරූපණවල ඇවිදීම සිදුවන්නේ සාමාන්‍ය ආකාරයට නොවේ. අභිරූපණය පුහුණු වීමේ දී ගමන් රටා කිහිපයක් ඇත.

සැහැල්ලු ඉදිරි ගමන
පැති ගමන
දුෂ්කර ගමන
ආපසු ගමන

එමෙන් අභිරූපණයේ දී විවිධ වස්තූන් අභිනයෙන් නිරූපණය කිරීමේ දී අත් සහ පාද චලනය කිරීම ද යම් රිද්මයානුකූල භාවයකින් සිදු කරයි.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.3 :** විවිධ නිරූපණයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : චරිත නිරූපණය හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය පිටපත් කිහිපයක්
- නාට්‍යයක විවිධ චරිත නිරූපණය කෙරෙන ඡායාරූප කිහිපයක්

**ඉගෙනුම් පල** :
- චරිත නිරූපණය යනු කුමක්දැයි පවසයි.
- චරිත නිරූපණයේ ලා වැදගත් වන කරුණු ප්‍රකාශ කරයි.
- මිනිස්, සත්ත්ව සහ වෙනත් විවිධාකාරයේ චරිත නිරූපණයන් ඉදිරිපත් කරයි.
- චරිත නිරූපණයේ දී පරිකල්පනය, බුද්ධිය, නිර්මාණශීලී බව, චින්තනය යනාදිය වැදගත් වන බව පවසයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ගුරුවරයා අත ඇති නාට්‍ය පිටපත් සිසුන්ට පෙන්වා එහි ඇති චරිත ගැන විමසීමෙන් හෝ විවිධ චරිත නිරූපණ දක්වෙන ඡායාරූප පෙන්වීම මගින් පාඩමට පිවිසිය හැකි ය.

මුලින් ම සිසුන්ට නාට්‍යයක චරිත නිරූපණය ප්‍රධාන අංගයක් වන බව වටහාදෙන්න. කථාව, ක්‍රියාව ප්‍රේක්ෂකයා අවබෝධ කරගන්නේ චරිත මගින් බවත්, චරිත ඉවත් කළ විට කතාව දැකිය නොහැකි බවත් පෙන්වා දෙන්න. සෑම නාට්‍යයක ම චරිත ඇති බවත් පෙන්වාදෙන්න. නාට්‍ය පිටපත්වල ඇති විවිධ චරිත නම් කරන්න. ඉන් චරිත නිරූපණය දක්වෙන අවස්ථා කිහිපයක් පෙළ කියැවීම තුළින් තහවුරු කරන්න.

පියවර 02 නාට්‍ය පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයාට ප්‍රදර්ශනය වන්නේ චරිත මගින් ය. විවිධ චරිත සමුදායක් නාට්‍ය තුළ ඇති අතර චරිත නිරූපණය කරදක්වන්නෝ නළු-නිළියෝ ය. එසේ චරිත නිරූපණය කරන විට චරිතය හොඳින් අධ්‍යයනය කළ යුතු ය. නාට්‍යයේ ශෛලියට අනුව රූපණ කාර්යය ගොඩ නගා ගත යුතු ය. චරිත නිරූපණයේ දී නිර්මාණශීලී චින්තනය, පරිකල්පනය, ශක්තිය අවංක බව යන ආදී කරුණු සිසුන්ට පැහැදිලි කර දෙන්න.

චරිත නිරූපණයේ දී අභිනය පෑම සහ සංවාද භාවිතය ගැන ද සැලකිලිමත් විය යුතු බව දක්වන්න. සංවාද චරිත ලක්ෂණ මතු වන ආකාරයට නිවැරදි ව ප්‍රකාශ කිරීම කළ යුතු බව ද, පිටපතෙහි එන චරිතය මනාව ඉදිරිපත් කිරීම සඳහා නිරන්තර පුහුණුවීම්වල යෙදිය යුතු බව ද පෙන්වාදෙන්න.

පිටපතෙහි එන චරිතය නිරූපණය සඳහා මනා වූ පරිකල්පනයක් අවශ්‍ය බව ද, ඒ තම ජීවන අත්දැකීම් ද ඉවහල් කරගෙන චරිත ගොඩනගා ගෙන නිරූපණය කිරීම සිදුකරන බව ද පෙන්වාදෙන්න.

පියවර 03 නාට්‍යවල දී චරිත නිරූපණයන් සලකා බලන විට මිනිස් චරිත, සත්ත්ව චරිත, දේව සහ යක්ෂ චරිත ද පරිකල්පනය කරගත් චරිත ද නිරූපණය කරන බවත් ඇතැම් විට ගස්, මල්, ගංගා වැනි අජීවී වස්තූන් ද චරිත බවට

පත් කර නිරූපණය කරන බවත් නාට්‍ය කෘති උදාහරණ කොටගනිමින් පහදා දෙන්න.

**පියවර 04**

- සිසුන් කණ්ඩායම් කර ගුරුවරයා කලින් සකස් කරගත් නාට්‍ය පිටපත්වල එන චරිත නිරූපණය සඳහා යොදවන්න. මෙහි දී හොඳ අවස්ථා නිරූපණය වන ආකාරයේ නාට්‍යමය අවස්ථා තෝරාගෙන එම අවස්ථාවන්ට අදාළ චරිත නිරූපණය කරවන්න. මෙහි දී හඬ භාවිතය, චරිත ලක්ෂණ මතු කිරීම. උචිත අභිනය පෑම යන අංග පිළිබඳ ව සැලකිලිමත් වෙමින් චරිත නිරූපණය යන කාර්යය අවබෝධ කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- චරිත නිරූපණය යන්න කුමක් ද යි ප්‍රකාශ කිරීම.
- චරිත නිරූපණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ප්‍රකාශ කිරීම.
- නාට්‍යවල එන චරිත වර්ගීකරණය කිරීම.
- ළමුන් චරිත නිරූපණය කිරීම.
- චරිත නිරූපණයේ දී වැදගත් වන කරුණු විමසීම.

පැවරුම : ශිෂ්‍ය කණ්ඩායම්වලට තෝරාගත් නාට්‍ය කොටසක් නිරූපණය කිරීමට අවස්ථාව ලබා දීම.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.4 :** නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යමය අවස්ථා හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ගුණාත්මක යෙදවුම්** : නාට්‍ය පිටපතක්, නාට්‍යයක වීඩියෝ පටයක්

**ඉගැනුම් පල** :
- නාට්‍යමය අවස්ථාව යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- නාට්‍යමය අවස්ථාවක ස්වභාවය පැහැදිලි කරයි.
- නාට්‍යමය අවස්ථා වෙන් කරදක්වයි.
- නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** සිසුන්ට නාට්‍ය පිටපතක ඇති නාට්‍යමය ගුණයෙන් පූර්ණ අවස්ථාවක් සහිත කොටසක් කියවීමට දීම මගින් හෝ වේදිකා නාට්‍යයක නාටකීය ගුණයෙන් අනූන අවස්ථාවක් නිරූපණය වන වීඩියෝ දර්ශනයක් නැරඹීමට ඉඩ සලසාදෙමින් පාඩමට ප්‍රවිෂ්ට වන්න.

**පියවර 02** සිසුන් වෙත පමුණුවන ලද නිදර්ශනයන් මගින් යම්කිසි ගැටුමක ගැටළුවක් සහිත අවස්ථාවක් නිරූපණය කරලීමෙන් නාට්‍යමය අවස්ථාව බිහිවන බව පෙන්වා දෙන්න.

ඒ අනුව යම්කිසි නාට්‍යයක කතා ප්‍රවෘත්තිය ගොඩ නැගෙන්නේ අවස්ථාවන් රැසකගෙන් යුක්ත ව වන අතර, එහි මූලික අවස්ථාවන් භාවිත වන්නේ චරිත හා ක්‍රියා ගොඩනංවමින් බවත්, එයට ගැටුම්කාරී බවක් ඇතුළත් වීමත් සමග නාට්‍යමය අවස්ථාව නිර්මාණය වන බවත් පෙන්වා දෙන්න.

**පියවර 03** මේ සඳහා උදාහරණ වශයෙන්, මනමේ නාට්‍යයේ වැදි රජු සහ මනමේ කුමරු අතර සටන් අවස්ථාව හෝ හුණුවටයේ කතාව නාට්‍යයේ වැල් පාලමේ ගීතය අවස්ථාව ඉදිරිපත් කරන්න. ඒ මගින් ගැටුමක්, කුතුහලයක්, දෙගිඩියාවක්, ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලීන් දෙකක් පවතින ආකාරයට අවස්ථාව ගොඩ නැගී ඇති අයුරු පැහැදිලි කරන්න. මෙවැනි ස්වභාවයක් ගන්නා අවස්ථා නාට්‍යමය අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි බව පෙන්වාදෙන්න.

**පියවර 04** නාට්‍යයක ඇති විවිධ අවස්ථා සහ නාට්‍යමය අවස්ථා වෙන් වෙන් ව ''විකෘති'' වැනි නාට්‍යයක් මගින් පැහැදිලි කරවන්න. අතිරේක උදව් කොටසෙහි ඇති සිදුවීම් පදනම් කරගෙන නාට්‍යමය අවස්ථාවන් නිර්මාණය කරවන්න. ලිඛිත රචනයක් වශයෙන් හෝ ක්ෂණික නිරූපණයක් වශයෙන් ඉදිරිපත් කරන්නට අවකාශය සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- යම්කිසි සිදුවීමක් අතුරින් නාට්‍යමය අවස්ථා තෝරා බේරාගන්නා ආකාරය අවබෝධ කරගැනීම.
- නාට්‍යමය අවස්ථා විස්තර කිරීම.
- නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීමට යොමු වීම.

- කතාන්දරයක් තෝරා ගෙන එය නාට්‍යමය අවස්ථා ගොඩ නැගෙන අයුරින් නිර්මාණය කිරීම.
- නාට්‍යමය අවස්ථාවක ලක්ෂණ විස්තර කිරීම.

පැවරුම : අතිරේක උදව්වල දී ඇති සිදුවීම් ආශ්‍රිත ව නාට්‍යමය අවස්ථා නිර්මාණය කරන්න.

**අතිරේක උදව්** : **කට්ටලය 01**

මන්ද්‍රී දේවිය පලවැල නෙළාගෙන ඒමට ගිය අතර ජූජක බමුණා වෙස්සන්තර රජු ඉදිරියට පැමිණ දරුවන් දෙදෙනා ඉල්ලා සිටී. රජ දරුවන් ගේ විරෝධය නොතකා දරුවන් දන් දීමට පෙළඹේ. දරු දෙදෙනා එයට විරෝධය පාති.

**කට්ටලය 02**

විවේකය අවසන් වෙයි. ළමයි පන්ති කාමරයට පැමිණෙති. එහි දී එක් ශිෂ්‍යයකු ගේ පාට පැන්සල් පෙට්ටිය නැති වී ඇති බව ප්‍රකාශ වේ. විවේකය තුළ පන්තියෙන් බැහැර ව නොගිය සිසුවකු සියලු දෙනා සැක කරති. ගුරුතුමිය ඔහු ගෙන් පාට පැන්සල් පෙට්ටිය ගැන අසා ඇත්ත කියන ලෙස තරවටු කරයි. ඔහුට දඬුවම් දීමට සූදානම් වේ. මොහොතකින් පාට පැන්සල් පෙට්ටිය අයිති ළමයාගේ සහෝදරයකු එය ගෙදර දී රැගෙන තමා ගේ බෑගය තුළ දමාගත් බව ප්‍රකාශ කරමින් ඔහුට එය ආපසු ගෙනදෙයි.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.5** : පෙළ රචනා කරයි.

**ක්‍රියාකාරකම 2.5** : නාට්‍ය පෙළක් ලියමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ගුණාත්මක යෙදවුම්** : පත්තරයක්, කතාන්දර පොතක්, කෙටි කතාවක්, පොතක්, මනමේ, සුභ සහ යස හෝ වෙනත් මුද්‍රිත නාට්‍ය පොත්

**ඉගැනුම් පල** :
- නාට්‍යයක් රචනා කිරීමට සුදුසු කතා ප්‍රවෘත්ති තෝරාගනියි.
- නාට්‍යෝචිත ව සිදුවීම් ගළපාගනියි.
- තෝරාගත් කතා පුවතට නව අර්ථකථනයක් ලබා දේ.
- නාට්‍ය පෙළක් රචනා කරයි.
- නාට්‍ය පෙළක තිබිය යුතු මූලිකාංග වටහාගනී.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** පෙර දිනක කරන ලද දැනුම් දීමකට අනුව සිසුන් විවිධ ප්‍රවෘත්ති ලබා ගැනීම සඳහා පත්තර කොටස්, කෙටි කතා හෝ කතාන්දර පොත් ගෙනැවිත් ඇත. එයින් එක් කතා පුවතක් හෝ සිද්ධියක් තෝරා ගෙන ඒ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. එම සිද්ධිය හෝ කතාන්දරයෙන් ප්‍රකාශිත අර්ථය සාකච්ඡා කොට එයට වෙනත් අර්ථයක් ලබා දෙන ලෙස කතාව වෙනස් කිරීමට ඇති හැකියාව විමසන්න.

චුල්ලධනුද්ධර ජාතක කතාවෙන් ප්‍රකාශ වන අදහස මනමේ නාට්‍ය රචනා කිරීමේ දි වෙනස් කර ඇති අයුරු පෙන්වාදෙන්න.

**පියවර 02** තෝරාගත් කතා පුවත නාට්‍ය රචනයට ගැළපෙන ආකාරයට අවස්ථාවලට වෙන් කරගන්න. මෙහි දී මුල, මැද, අග සම්බන්ධතාව රැකෙන පරිදි අවස්ථා ගළපා ගැනීමට අවශ්‍ය අවබෝධය ලබා දී යම්කිසි ගැටලුවක් ප්‍රකාශ වන සේ අවස්ථා නිර්මාණය කිරීම, පෙළ රචනයේ දී සිදුවීම් ආරම්භය, ගැටලුවක වර්ධනය උච්ච අවස්ථාවක් සහ අවසානයක් ගොඩ නැගෙන ආකාරයට සකස් කරන්න.

චරිත, රංග විධාන, සංවාද පැහැදිලි වන සේ පෙළ නිර්මාණය කරන්න. මෙහි දී කතාව නාට්‍යයට අදාළ ව සකස් කරන විට යම් වෙනස් අර්ථයක් අදහසක් ඒ මගින් ප්‍රකාශ වන ආකාරයට පෙළ නිර්මාණය කිරීමට යොමු කරවන්න.

**පියවර 03**
- සංවාද රචනා කරන විට, ඒවා උච්චාරණයට පහසු වන සේත්, කතාවෙහි අර්ථය ප්‍රකාශ වන ආකාරයටත් චරිතවලට උචිත ආකාරයටත් නිර්මාණය කිරීමට මග පෙන්වන්න.
- කතා පුවත තුළ අවස්ථා සහ සිදුවීම් රැසක් තිබුණ ද නාට්‍ය රචනයේ දී එය එක් අවස්ථාවකට හෝ දෙකකට සීමාවන පරිදි සිද්ධි ගැළපීමට අවශ්‍ය මගපෙන්වීම කරන්න. නාට්‍ය ශෛලිය ගැන අවධානය ද පෙළ රචනය කිරීමේ දී සැලකිල්ලට ගන්න.

**පියවර 04** තෝරා ගත් කතා පුවතින් ප්‍රකාශිත අදහසට වඩා වෙනත් අදහසක්, අර්ථයක් ප්‍රකාශ වන ආකාරයට කතාව ගොඩනගා ගෙන සිදුවීම්, අවස්ථා 1 කට හෝ

2 කට සීමාවන අයුරින් පිටපත රචනා කිරීමට අවශ්‍ය අවබෝධය ලබා දෙන්න. ඉන් පසු සිසුන් විසින් රචනා කරන ලද නාට්‍ය පිටපත් අතරින් කිහිපයක් තෝරාගෙන පිටපත් රචනයට අදාළ මූලික අංග ලක්ෂණ අන්තර්ගත වී ඇති ආකාරය පෙන්වාදෙන්න. දුර්වලතා පෙන්වා දෙමින් රංගනය සඳහා සුදුසු ආකාරයට තවදුරටත් පිටපත සකස් කරගත යුතු ආකාරය අවබෝධ කරවන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කතා පුවතකින් නාට්‍යෝචිත අවස්ථා වෙන්කර ගැනීම.
- නාට්‍ය පෙළ රචනය කිරීම.
- චරිත තීරණය කර එයට ගැළපෙන සංවාද රචනා කිරීම.
- නාට්‍ය රචනයකට අදාළ වන සේ තර්කානුකූල ව අවස්ථා පෙළ ගැස්වීම.
- පවතින කතාවකට නව අර්ථකථනයන් ලබා දීම.

පැවරුම : කිසියම් කතා පුවතක්, කෙටි කතාවක්, ජන කතාවක් තෝරා ගෙන කෙටි නාට්‍ය පෙළක් රචනා කරන්න.

**අතිරේක උදව්** : කෙටි නාට්‍ය විමර්ශනය - මංගල සේනානායක

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම** 2.6 : නළු-නිළියන් තෝරාගනියි.
2.7 : වේෂභූෂණ සැලසුම් කරයි.
2.8 : අංග රචනය සැලසුම් කරයි.

**ක්‍රියාකාරකම** : තෝරා ගෙන නළු-නිළියන් - හැඩ කරගමු සිත සතුටින්

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- රචනා කරන ලද නාට්‍ය පෙළට අදාළ නළු-නිළියන් තෝරාගනියි.
- නාට්‍යෝචිත අයුරින් වේෂභූෂණ සැලසුම් කරයි.
- තෝරා ගත් නළු-නිළියන් සඳහා අංග රචනා සැලසුම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ නාට්‍යයන්හි රංගනයේ යෙදෙන නළු-නිළියන් ගේ පින්තූර කීපයක්
- විවිධ භූමිකා නිරූපණයේ දී භාවිතයට ගන්නා ඇඳුම්-පැළඳුම් හෝ ඒවායේ පින්තූර
- අංගරචනා සඳහා භාවිතයට ගන්නා ද්‍රව්‍ය හා උපකරණ කීපයක්
- විවිධ නාට්‍ය පිටපත් හෝ එවැනි නාට්‍ය කීපයක දෘශ්‍ය පට
- විවිධ ආකාරයෙන් අංගරචනා කළ මානව හෝ සත්ත්ව රූප දැක්වෙන පින්තූර කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ගුණාත්මක යෙදවුම් සඳහා තෝරා ගත් දෑ සිසුන්ට පෙන්වා ඒ පිළිබඳ ඔවුන් හා සාකච්ඡා කිරීම.

- නිර්මාණය කරන ලද නාට්‍ය පෙළෙහි ඇතුළත් චරිත සඳහා ඒ ඒ කුශලතා පිරිපුන් නළුවන් සහ නිළියන් තෝරාගත යුතු බව පැහැදිලි කිරීම.
- මේ සඳහා විවිධ නළු-නිළියන් ගේ පින්තූර හෝ දෘශ්‍ය පට නැරඹීමට සලස්වා සිසුන්ට අවබෝධය ලබාදීම.
- ලියන ලද නාට්‍ය පෙළට ගැළපෙන පරිදි සුදුසු නළු-නිළියන් තෝරා ගැනීම කළ යුතු බව පැහැදිලි කිරීම.
- නළු-නිළියන් තෝරා ගැනීම නළුවරණය වශයෙන් හැඳින්වෙන බව තේරුම් කරදීම.
- නාට්‍ය පෙළෙහි දැක්වෙන චරිත සඳහා වේෂභූෂණ භාවිතය අවශ්‍ය කරුණක් බව පැහැදිලි කිරීම.
- වේෂභූෂණ භාවිතයෙන් නිරූපිත රංගනයට අර්ථවත් බවක් ලැබෙන බව දැක්වීම.
- වේෂභූෂණ පිළිබඳ මින් පෙර පාඩම්වල දී උගත් කරුණු ඇසුරින් ලියන ලද නාට්‍ය පෙළෙහි එන චරිත සඳහා ඇඳුම් පැළඳුම් නිර්මාණය කිරීමට පූර්වයෙන් ඒවා සැලසුම් කළ යුතු බව දැක්වීම.
- නළුවා ගේ රංගන කාර්යයේ දී අර්ථ නිරූපණය සාර්ථක වීම සඳහා අංගරචනා විශාල පිටිවහලක් වන බව පැහැදිලි කිරීම.
- විවිධ ආකාරයෙන් අංගරචනා කරන ලද පින්තූර ශිෂ්‍යයින්ට පෙන්වා ඒවායේ විවිධත්වයන් හා විශේෂත්වයන් පිළිබඳ පැහැදිලි කිරීම.

පියවර 02 මූලික සාකච්ඡාවලින් පසු සිසුන් ලබා ගත් අවබෝධය අනුව සිසුන් විසින් ම නිර්මාණය කරන ලද නාට්‍ය පෙළට අවශ්‍ය නළු-නිළියන් තෝරා ගැනීමටත්, වේෂභූෂණ නිර්මාණ සැලසුම් කිරීමත්, අංගරචනා සැලසුම් කිරීමටත්, උපදෙස් ලබා දෙන්න.

මෙහි දී පන්තියේ සිටින සියලු සිසුන්ගෙන් නළුවරණයෙන් තෝරාගත් සිසුන් හැර ඉතිරි සිසුන් කණ්ඩායම් දෙකකට බෙදා

1. කණ්ඩායමට වේෂභූෂණ සැලසුම් කිරීමටත්
2. කණ්ඩායමට අංගරචනා සැලසුම් කිරීමටත්

අවස්ථාව සලසාදෙන්න.

**පියවර 03**

- නළුවරණයේ දී ඒ ඒ භූමිකාවට ගැළපෙන පරිදි නළුවන් තෝරාගැනීම සම්බන්ධ ව ඇගයීමට ලක් කරන්න.
- වේෂභූෂණ සැලසුම් කිරීමේ දී ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් එම කාර්යය සැලසුම් කර ගැනීමේ සාර්ථක අසාර්ථක බව විමසන්න.
- අංගරචනයේ දී චරිතයේ භාව ප්‍රකාශනයට හා රූපණයට පහසු හා ගැළැපෙන පරිදි ඒවා සැලසුම් කොට ඇත්දැයි විමසන්න.
- පෙළ රචනය නිෂ්පාදනයේ දී උක්ත අංග කොතෙක් දුරට භාවිතයට ගත හැකි ද යන්න විමසීමට ලක් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නළුවරණය යන්න කුමක් දැ යි සාකච්ඡා කරයි.
- නාට්‍ය පෙළක් සඳහා ගැළැපෙන නළු-නිළියන් තෝරාගනියි.
- ඔවුන් සඳහා වේෂභූෂණ සැලසුම් කරයි.
- තෝරා ගත් නළු-නිළියන් ගේ භූමිකාවන් සඳහා අංගරචනා සැලසුම් කරයි.
- සැලසුම් කරන ලද වේෂභූෂණ සහ අංගරචනා නාට්‍ය නිෂ්පාදනයේ දී භාවිතයට ගත හැකි අවස්ථා සැලසුම් කරයි.

පැවරුම :

- ලියන ලද නාට්‍ය පිටපත නිෂ්පාදනය සඳහා සැලසුම් සකස් කරන්න.
- විවිධ භූමිකා රංගනයන් සඳහා අවශ්‍ය වේෂභූෂණ සැලසුම් කරන්න.
- විවිධ චරිත තෝරා ගෙන ඒ ඒ චරිත සඳහා අංගරචනා සැලසුම් කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.7** : වේෂභූෂණ නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** : නිම කළ පෙළ රඟපාන්න - හදමු ඇඳුම් සහ අබරණ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- නාට්‍යයක් සඳහා අවශ්‍ය වන වේෂභූෂණ තෝරාගනී.
- සාමාන්‍ය ජීවිතයේ හඳින පලඳින වස්ත්‍ර සහ ආභරණවලත් නාට්‍යයෙහි වේෂභූෂණවලත් වෙනස දක්වයි.
- ලෝකධර්මී නාට්‍යයක් සඳහා මෙන් ම නාට්‍යධර්මී නාට්‍යයක් සඳහා භාවිත කරන වේෂභූෂණවල වෙනස්කම් ප්‍රකාශ කරයි.
- උචිත අයුරින් වේෂභූෂණ නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍යධර්මී නාට්‍ය කීපයක ඡායාරූප
- ලෝකධර්මී නාට්‍ය කීපයක ඡායාරූප
- වෙනත් පන්තිවල දී (ශ්‍රේණිවල දී) නිර්මාණය කරන ලද නිර්මාණ කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- ගෙනෙන ලද වේෂභූෂණ කීපයක් හෝ අදාළ පින්තූර කීපයක් සිසුන්ට දක්වා ඒවා පිළිබඳ ව සිසු අදහස් විමසමින් පාඩමට පිවිසෙන්න.
- සිසුන් විසින් සකස් කරන ලද නාට්‍ය පෙළ සඳහා සුදුසු වේෂභූෂණ නිර්මාණය කළ යුතු අයුරු පහත කරුණු ද උපයෝගී කරගෙන පැහැදිලි කරන්න.
- එම නාට්‍ය පෙළ ලෝක ධර්මී රංග ශෛලියට අයත් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ සාමාන්‍ය ජීවිතයේ අඳින පලඳින ආකාරයට සමීප අයුරින් වේදිකාවට සරිලන ලෙස සකස් කළ යුතු බව.
- එම පෙළ නාට්‍යධර්මී රංග ශෛලියට අනුව සකස් කරන ලද්දක් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ ස්වාභාවිකත්වයෙන් ඈත් ව කාල්පනිකත්වයෙන් සහ අතිශයෝක්තියෙන් යුක්ත ව නිර්මාණය කළ යුතු බව.
- වඩාත් උචිත ලෙසින් වේෂභූෂණ නිර්මාණය කිරීම නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වන බව.
- නළුවකු නිරූපණය කරන භූමිකාව පිළිබඳ දෘශ්‍ය සංඥා රැසක් එම නළුවා ගේ වේෂභූෂණයෙන් අනාවරණය වන බව.
- චරිතයක් හඳුනාගැනීමට, චරිතයක වයස අනාවරණය කරගැනීමට මෙන් ම චරිතයක ගති ලක්ෂණ ඉස්මතු වී පෙනීමට ද වේෂභූෂණය හේතු වන බව.
- චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කර දැක්වීමට ද වේෂභූෂණ උපකාරී වන බව.

පියවර 02 ඒ ඒ කණ්ඩායම් විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පෙළට අවශ්‍ය වන වේෂභූෂණ කට්ටල කීපයක් නිර්මාණය කිරීමට ඔවුන්ට උපදෙස් දෙන්න.

පියවර 03 සිසුන් විසින් නිර්මාණය කරන ලද වේෂභූෂණවල සාර්ථක අසාර්ථක බව ඒ ඒ කණ්ඩායම් සමග සාකච්ඡා කරන්න. අගය කළ යුතු නිර්මාණ සිසුන් ඉදිරියේ පෙන්වා ඇගයීමට ලක් කරන්න.

එම නිර්මාණ පිළිබඳ ව පහත දැක්වෙන කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.

- නාට්‍ය ශෛලිය හා ඉන් මතු කැරෙන මනෝභාවය පිළිබඳ ව වේෂභූෂණ නිර්මාණ ශිල්පියා තුළ අවබෝධයක් තිබිය යුතු බව.
- ඓතිහාසික යුගයේ චරිත සඳහා වේෂභූෂණ නිර්මාණය කරන්නේ නම් අදාළ යුගයේ වස්ත්‍රාභරණ පිළිබඳ ව මනා අධ්‍යයනයක් කළ යුතු බව.
- රට, ප්‍රදේශය හා සංස්කෘතිය වේෂභූෂණවලින් පිළිබිඹු විය යුතු බව.
- ප්‍රධාන වශයෙන් ම පෙළෙහි එන චරිතයන්ට උචිත ම අයුරින් වේෂභූෂණ නිර්මාණය කළ යුතු බව.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පෙළට උචිත වේෂභූෂණ තෝරාගැනීම.
- පෙළට අදාළ ශෛලියට අනුව වස්ත්‍ර නිර්මාණය කිරීම.
- පෙළට අදාළ ශෛලියට අනුව ආභරණ නිර්මාණය කිරීම.
- වේෂභූෂණවල නිර්මාණාත්මක බව.
- කණ්ඩායම් හැඟීමෙන් යුතු ව සහයෝගයෙන් ක්‍රියා කිරීමේ හැකියාව.

පැවරුම : නාට්‍යයට උචිත වේෂභූෂණ නිර්මාණය කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.8** : අංගරචනය සැලසුම් කරයි.

**ක්‍රියාකාරකම** : චරිත හොඳින් වෙස් ගන්වමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- අංගරචනය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නම් කරයි.
- පිටපතට අවශ්‍ය චරිත සඳහා උපයෝගී කර ගැනීමට සුදුසු ද්‍රව්‍ය රැස් කරයි.
- අංගරචනය කළ යුතු චරිත වෙන් කරයි.
- අදාළ ශෛලියට අනුකූල ව අංග රචනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ ශෛලීන්ට අදාළ චරිත ඇතුළත් පින්තූර
- අංගරචනා ද්‍රව්‍ය කට්ටලයක්
- අංගරචනා උපකරණ
- අභිනය සිව්වන කලාපයෙන් උපුටා ගන්නා ලද ''නාට්‍ය කලාවේ අංග රචනය පිළිබඳ මූලික සිද්ධාන්ත පැහැදිලි කිරීමක්'' යන ජගත් පද්මසිරිගේ ලිපිය (2007-10 වසර ගුරු අත්පොතේ ද මෙම ලිපිය ඇත)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- පෙර පාඩමේ දී ඒ ඒ කණ්ඩායම් විසින් නිම කරන ලද ඒ ඒ නාට්‍ය පෙළට අදාළ චරිත අංගරචනය කිරීමට සිසුන්ට සිදු වන බැවින් එය සිදු කළ යුතු අයුරු පහත සඳහන් කරුණු උපයෝගී කරගෙන පැහැදිලි කරන්න.
- ඒ ඒ ශෛලීන්ට අදාළ ව අංගරචනය කළ යුතු බව.
- චරිත අනුව, කළ යුතු අංග රචනා වෙනස් වන බව.
- චරිතය ජීවත් වන කාලය, දේශය, යුගය, සාමාජික, ආර්ථික, ආගමික හා අධ්‍යාපනික තත්ත්වයන් පිළිබඳ ව මනා අවබෝධයකින් අංග රචනය කළ යුතු බව.
- චරිතවල බාහිර ස්වරූපයන් පමණක් නොව අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණය කිරීම සඳහා ද අංගරචනය බලපාන බව.
- චරිතය නිරූපණය කරන පුද්ගලයාගේ සමේ වර්ණය, මුහුණේ හැඩය, අංගරචනය සඳහා බලපාන බව.

පියවර 02 අදාළ පිටපත්වලට අවශ්‍ය වන චරිත කීපයක් (කණ්ඩායමකින් චරිත කීපයක් බැගින්) අංගරචනය කරවන්න. ශෛලීන් දෙකට අදාළ ව තිබීම වැදගත් වේ.

පියවර 03 විවිධ චරිතවලට අදාළ ව අංගරචනය කරන ලද සිසුන් ඉදිරියට කැඳවා ඒ ඒ චරිත පිළිබඳ ව සෙසු සිසුන් ගෙන් ද අදහස් විමසන්න. ඔවුන් ගේ අදහස් හා පහත කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- අංගරචනය නියම ආකාරයෙන් සිදු කිරීමට හොඳින් ආලෝකය ඇති ස්ථානයක් තෝරා ගත යුතු බව පැහැදිලි කරන්න.
- අංගරචනා ද්‍රව්‍ය හා උපකරණ පිළිවෙළට තබා ගත යුතු බව පවසන්න.
- එකිනෙක චරිත සඳහා පෙනී සිටින සිසුන්ට තම මුහුණ හොඳින් පිරිසිදු කොට ගෙන අංගරචනය කිරීම සඳහා පැමිණිය යුතු බව පවසන්න.

- අංගරචන ශිල්පියා ද තම දෙඅත් පිරිසිදු ව තබාගත යුතු බව පෙන්වා දෙන්න.
- අංගරචනා කිරීමේ දී නළු-නිළියන් ගේ මුහුණේ සියුම් උපාංගයන්ට හානියක් නොවන පරිදි මනා අවබෝධයකින් යුතු ව හා ඉවසිලිවන්ත ව සිදු කළ යුතු බව පැහැදිලි කරන්න.
- එක් එක් නළුවා ගේ සමේ වර්ණයට ගැළැපෙන පදනම් ආලේපය තෝරා මුහුණේ තැවරිය යුතු බව පෙන්වාදෙන්න.
- අංගරචනා ද්‍රව්‍ය මුහුණෙන් ඉවත් කිරීම සඳහා ''බේබි ඔයිල්'' භාවිත කළ යුතු බව පවසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- අංගරචනා ද්‍රව්‍ය තෝරාගැනීම.
- චරිත සඳහා කළ යුතු අංගරචනා හඳුනාගැනීම.
- චරිතයට අවශ්‍ය පරිදි අංගරචනා කිරීම.
- පෙළෙහි ශෛලියට අනුකූල ව අංගරචනය කිරීම.
- චරිතය මතුකොට පෙන්වීමෙහි ලා අංගරචනයෙන් ලද දායකත්වය.

පැවරුම : 2.5 යටතේ රචනා කරන ලද නාට්‍ය පෙළට අදාළ චරිත සඳහා අංගරචන සැලසුම් කරන්න.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.9** : වේදිකා පසුතල සැලසුම් කරයි.

**ක්‍රියාකාරකම** : වේදිකා පසුතල නිර්මාණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- සිසුන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයට ගැළපෙන වේදිකා පසුතල සකසන අයුරු සාකච්ඡා කරයි.
- උචිත පසුතල නිර්මාණ සැලසුම් කරයි.
- නාට්‍යෝචිත පසුතල නිර්මාණය කරයි.
- වේදිකාවට සහ නාට්‍ය ශෛලීන්ට උචිත ලෙස පසුතල සකස් කරයි.
- අඩු වියදමින් හා නිර්මාණශීලී ව උචිත පසුතල සකස් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ නාට්‍යයන්හි පසුතල නිර්මාණවල පින්තූර
- සජීවී ලෙස පසුතලය මැවීමට සකස් කරන ලද නිර්මාණ
- නාට්‍ය කීපයක සංයුක්ත පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- වෙනත් නාට්‍යයක පසුතල නිර්මාණයක් හෝ පසුතල නිර්මාණයක පින්තූර පත්‍රිකා කිපයක් සිසුන්ට පෙන්වා ඒ පිළිබඳ ව සිසුන් ගෙන් කරුණු විමසන්න. සිසුන් ගේ අදහස් ද පහත කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිසුන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයට උචිත අයුරින් පසුතල සැලසුම් කළ යුතු බව.
- නාට්‍යයේ ශෛලියට ගැළපෙන අයුරින් පසුතල නිර්මාණය තිබිය යුතු බව.
- බොහෝ විට ලෝකධර්මී නාට්‍ය සඳහා පසුතල ස්වාභාවිකත්වයට සමීප අයුරින් සකස් කළ යුතු බව.
- නාට්‍යධර්මී නාට්‍යවල දී බොහෝ විට වාචික ව, සංකේතාත්මක ව පසුතල මවන බව. (උදාඃ මනමේ නාට්‍යයේ වනාන්තරය ''ප්‍රේමයෙන් මන රංජිත වේ'' ගීතයෙන් අදාළ පසුතලය මවාපාන අයුරු දක්වන්න)
- නළු-නිළියනට රංගනයෙහි යෙදීමට බාධා නොවන අයුරින් වේදිකා පසුතල සකස් කළ යුතු බව.
- පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි අයුරින් පසුතල නිර්මාණය කළ යුතු බව.
- පසුතල නිර්මාණ සඳහා නළු-නිළියන් යොදාගන්නා අවස්ථා ද ඇති බව (උදාඃ මිනිසුන් යොදා ගෙන ගස්, කඳු, යන්ත්‍රෝපකරණ ආදිය සංකේතවත් කරන බව)
- ආලෝකය උපයෝගී කරගනිමින් විනිවිදක මගින් ද පසුතල සංකේතවත් කරනු ලබන බව (උදාඃ පන්සලක දර්ශනයක දී බෝගස, චෛත්‍ය, සඳ වැනි දේ මෙසේ දක්වන අවස්ථා ඇති බව.)
- නූර්ති වැනි නාට්‍යවල දී චිත්‍රවස්ත්‍ර මගින් පසුතල මැවූ බව.

පියවර 02
ඉහත කරුණු ද සැලකිල්ලට ගෙන තම කණ්ඩායම් නාට්‍යය සඳහා පසුතල කීපයක් සැකසීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**පියවර 03** සිසුන් විසින් නිර්මාණය කරන ලද පසුතල යොදා ගෙන නාට්‍ය පිටපතේ අවස්ථා කීපයක් රඟපෑමට අවස්ථාව දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වේදිකා පසුතල නිර්මාණ යන්න පැහැදිලි ලෙසින් හඳුනාගැනීම හා යොදාගැනීම.
- උචිත ලෙස පසුතල යොදාගැනීම.
- පසුතල නිර්මාණවල ඇති අපූර්වත්වය.
- පසුතලවලින් නාට්‍යයට ලැබුණු ආලෝකය
- පසුතල නිර්මාණවල ඇති නිර්මාණශීලී බව හා කණ්ඩායම්වල සාමූහික හැඟීමෙන් කටයුතු කිරීමේ හැකියාව.

**නිපුණතාව 2.0** : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම 2.10** : කෙටි නාට්‍ය සංකල්පය හඳුනාගැනීම.

**ක්‍රියාකාරකම** : කෙටි නාට්‍යයක් රචනය කර නිෂ්පාදනය කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- ''කෙටි නාට්‍ය සංකල්පය'' යන්න නිර්වචනය කරයි.
- කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා විස්තර කරයි.
- සුදුසු තේමාවන් රැස් කරයි.
- කෙටි නාට්‍ය පෙළක් රචනා කරයි.
- කෙටි නාට්‍යයක් නිෂ්පාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- විවිධ නිර්මාණකරුවන් ගේ කෙටි නාට්‍ය කෘති
- මංගල සේනානායක - කෙටි ම කෙටි නාට්‍ය
- ධනංජය කරුණාරත්න - කෙටි නාට්‍ය
- ධනංජය කරුණාරත්න - ඔබ සාපේක්ෂයි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- කෙටි නාට්‍ය කෘති නම් කරමින් හෝ සංයුක්ත තැටි ආධාරයෙන් කෙටි නාට්‍යයක් නැරඹීමට අවස්ථාව සලසමින් හෝ පාඩමට ප්‍රවේශ විය හැකි ය.
- ''කෙටි නාට්‍ය'' යනු හැම අංශයකින් ම සංක්ෂිප්ත බව ඇඟවෙයි. මේ අනුව නාට්‍යයේ රංග කාලය සහ සිදුවීමට ගතවන කාලය කෙටි වන අතර, ආකෘතිය, සන්දර්භය, ශිල්පක්‍රම හා භාෂාව යන අංශ එයට අදාළ ව සකස් විය යුතු බව පවසමින් සාකච්ඡාව සඳහා පහත සඳහන් කරුණු ද සහාය කර ගන්න.

පියවර 02
- කෙටි නාට්‍ය යනු ඒකාංක නාට්‍යයන් ය. මේවා නිර්මාණය වී ඇත්තේ එක් හරවත්, සරල තනි දර්ශනයකිනි. ඉතා හොඳින් වින්‍යාසගත කරන ලද මෙම නාට්‍ය එක් තීරණාත්මක අවසානයක් කරා යොමු වේ. මෙම අපූරු සංක්ෂිප්ත බව නිසා නාට්‍යයෙන් කියැවෙන දෙයට වඩා වැඩි යමක් ගම්‍ය වේ.
- ජීවිතයේ කිසියම් සංසිද්ධියක් පාදක කරගෙන කෙටි නාට්‍යයක් රචනා කළ හැක. මිනිස් සිතේ ඇතිවන ගැඹුරු හා අපූරු ස්වභාවයන් එළි පෙහෙළි කිරීම මෙහි අරමුණ යි.
- සීමිත චරිත සංඛ්‍යාවක් යොදාගැනීම සුවිශේෂ ය. විශේෂ සංගීතයක් නොමැත. එහෙත් පෙළ තුළ ගොඩනැගෙන සංවාද අතර තිබෙන නිහඬ කාලය එක ම සංගීතය ලෙස යොදාගැනෙන අවස්ථා බොහෝ ය. සරල වේදිකාවක් තුළ මෙම නාට්‍ය වේදිකාගත කිරීමත්, අඩු නළු-නිළි සංඛ්‍යාවක් යොදා ගැනීමත් නිසා අඩු වියදමකින් ප්‍රදර්ශනය කළ හැකි ය.
- වේදිකා දර්ශන පසුතල, උපකරණ බෙහෙවින් සීමිත ය.
- කෙටි නාට්‍යයක එන ස්වතන්ත්‍ර බව, කෙටි බව, සියුම් හා ගැඹුරු අන්තර්ගතය, සන්දර්භයේ අපූර්වත්වය, ආකර්ෂණීය රූපණය, කාලය හා රංග අවකාශයේ ඒකීය භාවය යන නිර්ණායක වඩා සූක්ෂ්ම වීමෙන් ලැබෙන වින්දනය ද අපූරු ය.
- කෙටි නාට්‍යයක දී, කෙටි කතාවක හෝ කවියක මෙන් අනවශ්‍ය එකදු වචනයක්, දෙබසක්, සිදුවීමක්, වේදිකා උපකරණයක් හෝ චරිතයක් ඇතුළත් නොකළ යුතු ය.

**පියවර 03** කෙටි නාට්‍යයකට සුදුසු සිදුවීමක්, සිතුවිල්ලක් ලේඛනගත කරන ලෙස සිසුන්ට දනුම් දෙන්න.

සුදුසු අවස්ථා තෝරා, වැරදි නිවැරදි කරමින් පෙළ රචනයට පොළඹවන්න.
අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කෙටි නාට්‍ය සංකල්පය පැහැදිලි කිරීම.
- කෙටි නාට්‍යයෙහි සුවිශේෂතා විස්තර කිරීම.
- සුදුසු තේමාවක් ලේඛනගත කිරීම.
- කෙටි නාට්‍ය පෙළ රචනය කිරීම.
- උචිත තේමා රැස් කිරීම.

පැවරුම : පන්ති මට්ටමින් තෝරාගත් නාට්‍ය පෙළ කිහිපයක් නිෂ්පාදනය කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල යෙදෙයි.

**ක්‍රියාකාරකම** : රංග අභ්‍යාසවල වැදගත්කම හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- රංග අභ්‍යාසවල නියැළෙයි.
- රංග අභ්‍යාසවල යෙදීමෙන් ලැබෙන ප්‍රයෝජන සඳහන් කරයි.
- රංග අභ්‍යාස රංගනයට ප්‍රයෝජනවත් වන අයුරු වටහාගනියි.
- රංග අභ්‍යාස වර්ග ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** : •

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- ළමයින් හිස් අවකාශයට රැගෙන යන්න. හිස් අවකාශයේ නිදහස් ව ඇවිදීමට සලස්වන්න. සංඥාවකින් ඔවුන් එකවරට නවත්වන්න (ගල් ගැසීම) කිහිප වරක් මෙම ක්‍රියාවලියේ යොදවන්න. වේගයෙන් සෙමින් ඇවිදීමට විධානය කරන්න. එක වරට සංඥාවකින් නවත්වන්න. විවිධ ඉරියව් සහ ක්‍රියාකාරකම් කරමින් ඇවිදීමට යොමු කරවන්න. මෙම අභ්‍යාසය සිරුර උණුසුම් වන අකාරයට විනාඩි 20 ක් පමණ කරවන්න.

පියවර 02
- අභ්‍යාසය අවසානයේ සිසුන් අවකාශයේ රවුමකට සිටුවා කරන ලද අභ්‍යාසය ගැන විමසන්න. එයින් සිසුන්ට දනුණු දෙය සහ එමගින් ලබා ගත හැකි ප්‍රයෝජන විමසන්න.

පියවර 03
- සිසුන් ගේ අදහස් ද සැලකිල්ලට ගනිමින් රංග අභ්‍යාසවල ඇති වැදගත්කම මගින් රංගන ශිල්පියාට ලැබෙන පිටිවහල සාකච්ඡා කරන්න.

  නළුවකු හෝ නිළියක විසින් යම් රංග කුශලතාවක් වර්ධනය කරගනු පිණිස කායික සහ මානසික යෝග්‍යතාව ගොඩනැගෙන අයුරින් සිදු කරනු ලබන අභ්‍යාස රංග අභ්‍යාස ලෙස හැඳින්විය හැකි බව ප්‍රකාශ කරන්න.
- තාපන ව්‍යායාම, ශිථිලකරණ අභ්‍යාස, ශ්වසන අභ්‍යාස, කටහඬ අභ්‍යාස, සංවේදන අභ්‍යාස, රංග ක්‍රීඩා වශයෙන් රංග අභ්‍යාස රැසක් ඇති බව පෙන්වා දෙන්න.
- මෙම රංග අභ්‍යාසවලින් සබකෝලය නැති කර ගැනීමට, හැකියාව දියුණු කර ගැනීමට, සාමූහික ව කටයුතු කිරීමට, සහෝදර සිසුන් අතර හොඳ අන්තර් සම්බන්ධතා පැවැත්වීම හුරු වීමට, පුද්ගල පෞරුෂය දියුණු වීමට, ගායන, නර්තන කුශලතාවන් දියුණු කර ගැනීමට බෙහෙවින් ම උපකාරී වන බව පෙන්වාදෙන්න.
- නළුවා තුළ ඉහත ගුණාංග වර්ධනය වීම නිසා දක්ෂ රූපණ ශිල්පියකු වීමට හැකියාව ලැබෙන බවත්, ඔහු තුළ පවතින ආධුනික ගති ලක්ෂණ වෙනස්වන බවත් පෙන්වාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග අභ්‍යාස යනු කුමක් ද යි ප්‍රකාශ කිරීම.
- රංග අභ්‍යාස වර්ග නම් කිරීම.
- රංග අභ්‍යාසවලින් ඇති ප්‍රයෝජන විස්තර කිරීම.

- රංග අභ්‍යාසවල යෙදීම.
- රංග අභ්‍යාසවලින් නිර්මාණාත්මක අවස්ථා ගොඩ නැගීම.

**පැවරුම** : සිසුන් කණ්ඩායම් කිහිපයකට බෙදා කණ්ඩායම් වශයෙන් අංග චලන පමණක් භාවිත කර නිශ්චිත කාලයක් තුළ පැහැදිලි අදහසක් එන ක්‍රියාකාරකමක් කර දක්වන්න.
උදා : පෙරහරක්

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1** : රංග අභ්‍යාසවල යෙදෙයි.

**ක්‍රියාකාරකම 3.1.2** : ශාරීරික අභ්‍යාස, මානසික අභ්‍යාසවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- ශාරීරික අභ්‍යාස පිළිබඳ ව පැහැදිලි කරයි.
- ශාරීරික අභ්‍යාසවල යෙදෙයි.
- මානසික අභ්‍යාස පිළිබඳ ව විස්තර කරයි.
- මානසික අභ්‍යාසවල යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්** :
-

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. අවකාශයේ විසිරී ඇවිදීමට යොමු කරන්න. මුලින් ම සාමාන්‍ය ඇවිදීමක යොදවන්න. ඉන්පසු වේගයෙන්, සෙමෙන් ඇවිදීමට යොමු කරන්න. පසුව ගුරු විධානයට අනුව ඉහළ ඇති යමක් එකවර ම උඩ පැන අල්ලමින් ඇවිදීමට යොමු කරන්න. ගුරු විධානයට අනුව බිම ඇති යමක් අල්ලමින් ඇවිදින්නට විධානය දෙන්න. වේගයෙන් උඩ සහ පහළ යන ස්ථාන අල්ලමින් ඇවිදීමට යොමු කරවන්න. සිසුන් හොඳට මහන්සි වන තුරු මෙය කරවන්න. අවකාශය තුළ වේගයෙන් ඇවිදවීම, එකවර චලනය නැවැත්වීම ආදිය කරවමින් සිසුන් ගේ සිරුර හොඳින් උණුසුම් කරවීමට සලස්වන්න.

පියවර 02
- ශාරීරික උණුසුම් ක්‍රියාවලියෙන් පසු ව සිසුන්ට අවකාශය තුළ නිදහස් ව බිම වැතිරී සිටීමට අවස්ථාව සලසා දී සියලු දෙනාට ම නිදහස් ව බිමෙහි වැතිරී දෙනෙත් පියාගෙන සිටීමට යොමු කරවන්න. එසේ සිටින අතර ගුරු විධානයන් කෙරෙහි අවධානය යොමු කරවන්න. මෙහි දී සෑම අයකුට ම ඔහු ගේ හිසෙහි සිට පාදය දක්වා අවයව සිහිපත් කර දී එහි ඇති දැඩි ගතිය මනසින් ලිහිල් කරගන්නා ලෙස ප්‍රකාශ කරන්න. මේ ආකාරයට සිරුරේ සියලු අවයව ලිහිල් කරමින් මානසික සැහැල්ලුවක් ලබා දෙන්න.

පියවර 03
අභ්‍යාස අවසානයේ සිසුන් සමග කෙටි සාකච්ඡාවක යෙදෙන්න. අභ්‍යාසවල යෙදීමෙන් ඔවුන් ලද අත්දැකීම් ප්‍රකාශ කිරීමට අවකාශය සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සිරුර උණුසුම් කිරීමේ අභ්‍යාස විස්තර කිරීම.
- සිරුර උණුසුම් කිරීමේ අභ්‍යාසවල නියැළීම.
- මානසික ලිහිල් භාවය ලබා ගැනීමේ අභ්‍යාස ප්‍රකාශ කිරීම.
- මානසික ලිහිල් භාවය ඇති වන අභ්‍යාසවල යෙදීම.
- අභ්‍යාස නිර්මාණාත්මක ලෙස යොදාගැනීම.

පැවරුම : මානසික ස්වභාවය වර්ධනය කරන රංග අභ්‍යාසවලට කණ්ඩායම් යොමු කරවන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.1.2.2**: රංග අභ්‍යාසවල යෙදෙමු.

**ක්‍රියාකාරකම** : රංග ක්‍රීඩාවල යෙදෙමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- රංග ක්‍රීඩා විශේෂ පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- රංග ක්‍රීඩාවල යෙදෙයි.
- රංග ක්‍රීඩාවලින් ලබන ප්‍රයෝජන ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
-

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. රංග ක්‍රීඩාවක් කිරීම සඳහා සූදානම් කරන්න. සියලු ම සිසුන් අවකාශය තුළ කවාකාර ව සිටීමට සලස්වා එක් සිසුවෙක් කවයෙන් පිටතට යවා අනෙක් අයට නොපෙනෙන ලෙස රඳවන්න. ඉන් පසු කවාකාරව සිටින පිරිසෙන් එක් අයකු නායකයකු බවට (මූලිකයකු) පත් කරන්න. ඔහු විවිධ ඉරියව් ප්‍රකාශ වන චලන ඉදිරිපත් කළ යුතු වේ. අනෙක් පිරිස එය අනුකරණය කළ යුතු ය. නායකයා සෑම මොහොතක ම තම ඉරියව් වෙනස් කිරීම ද කළ යුතු ය. පිටතට ගිය සිසුවා පැමිණ මෙහි විවිධ ඉරියව් අනෙක් අයට ඉදිරිපත් කරන්නා සෙවිය යුතු ය. නායකයා ඉරියව් වෙනස් කළ යුත්තේ පිටත සිටි සිසුවාට නොපෙනෙන ලෙස ය. වෙනස් කරන අය සෙවීම සඳහා අවස්ථා දෙකක් දෙනු ලැබේ. නම් කිරීමට නොහැකි වුවහොත් නායකයා ජයග්‍රහණය කරයි. මෙසේ කිහිප දෙනෙකු වරින් වර කවයෙන් පිටතට යවා නායකයින් වෙනස් කරමින් ක්‍රීඩාව කරගෙන යා හැකි ය.

පියවර 02 අවසානයේ සිසුන් සමග රංග ක්‍රීඩාව පිළිබඳ ව සාකච්ඡාවක් කළ හැකි ය. සිසුන්ගෙන් ම අදහස් විමසමින් මෙවැනි රංග ක්‍රීඩාවකින් ලබාගත හැකි ප්‍රයෝජන පිළිබඳ ව අවබෝධයක් ලබාදෙන්න.

පියවර 03 කාලවේලාව පිළිබඳ ව සලකා බලා තවත් රංග ක්‍රීඩාවක් හඳුන්වා දී සිසුන්ට එය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

උදාහරණ : බල්ලා සහ මස් කටුව

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංග ක්‍රීඩා හඳුනාගැනීම.
- රංග ක්‍රීඩාවක යෙදීම.
- රංග ක්‍රීඩාවල ප්‍රයෝජන වටහාගැනීම.
- විවිධ රංග ක්‍රීඩා නම් කිරීම.
- රංග ක්‍රීඩා නිර්මාණය කිරීම.

පැවරුම : රංග ක්‍රීඩාවක යෙදීමට සැලැස්වීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.2** : නාට්‍ය පෙළ කියවයි.

**ක්‍රියාකාරකම** : නාට්‍යයක මූලිකාංග වටහා ගනිමින් ''විකෘති'' නාට්‍ය පෙළ කියවමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- නිර්දිෂ්ට නාට්‍ය පෙළට අදාළ මූලිකාංග හඳුනාගනිමින් නාට්‍ය පෙළ කියවයි.
- කියැවීමේ දී නාට්‍ය පෙළෙහි බස්වහර, රංග විධාන ශෛලිය, ගැටුම් අවස්ථා, නාට්‍යෝචිත අවස්ථා, චරිතවල ස්වභාවය, තේමාව ආදී අංග කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි.
- උක්ත අංග පිළිබඳ වැටහීමෙන් යුතු ව පෙළ කියවා රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :
- ''විකෘති'' නාට්‍ය පිටපත
- වෙනත් නාට්‍ය පෙළ කීපයක්
- විකෘති නාට්‍යයේ දර්ශන ඇතුළත් වීඩියෝ පටයක්
- නාට්‍යයේ සිත්ගත් නාට්‍යෝචිත අවස්ථා සිතුවමට නැගූ පින්තූර කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 විකෘති නාට්‍යයේ දර්ශන කීපයක් ඇතුළත් (දෘශ්‍ය) වීඩියෝ පටයක් සිසුන්ට නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.

නැතහොත් නාටකීය ගුණයෙන් අනූන අවස්ථාවන්හි පින්තූර කීපයක් ශිෂ්‍යයින්ට නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 02 ''විකෘති'' නාට්‍ය පෙළ සිසුන්ට ලබා දී එය කියැවීමට සලස්වන්න.

පියවර 03
- නාට්‍ය පෙළ කියවා අවසන් වූ පසු ශිෂ්‍යයින් ගෙන් පොදුවේ නාට්‍යයේ තේමාව පිළිබඳ විමසන්න. මෙහි දී ශිෂ්‍යයින් විවිධ අදහස් ඉදිරිපත් කරනු ඇත.

  (උදා: වැඩිහිටියන් ගේ අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීම සඳහා බාල පරපුර සතු සිතුම් පැතුම් හා අපේක්ෂාවන් බිලිදෙන ආකාරය පෙන්නුම් කිරීම ආදී වශයෙන්)
- විකෘති නාට්‍යය, සෝමලතා සුබසිංහ නාට්‍යවේදිනිය ගේ නිර්මාණයක් බව කියාදීම.
- නාට්‍ය පෙළෙහි වැදගත්කම පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කිරීම.
- නාට්‍ය පෙළෙහි භාෂාවේ ප්‍රබල බව සංවාද මගින් ප්‍රකට වන බව පැහැදිලි කිරීම.
- සිසුන්ට එක් එක් භූමිකාව බැගින් ලබා දී සමස්ත පෙළ සංවාද කියවන ශෛලියෙන් රංගනයෙන් තොර ව කියවීමට අවස්ථාව ලබා දී නාට්‍යයේ චරිත පිළිබඳ කෙටි විග්‍රහයක යෙදීම.
- නාට්‍ය පෙළෙහි එන චරිත කීපයක් පිළිබඳ සිසුන් ගෙන් අදහස් විමසීම.

  උදා: ප්‍රියංගනී, හිල්ඩා, කරුණාරත්න සම්පත් ......................
- නාට්‍ය පෙළ නිශ්ශබ්ද ව මෙන් ම නාට්‍යෝචිත ශෛලියකින් ශබ්ද නගා කියවිය හැකි බව සංවාදවල එකිනෙකට වෙනස් උච්චාරණ විධි අනුව කියවීම තුළින් අවබෝධ වීමට ඉඩ සැලසීම.

- විවිධ ශෛලීන්ට අයත් නාට්‍යවල සංවාද එකිනෙකට වෙනස් බව පැහැදිලි කිරීම.

  උදා : මනමේ නාට්‍යය, කැළණි පාලම

- චරිතයෙන් චරිතයට භාවිත වන සංවාදවල වෙනසක් ඇති බව කියැවීමෙන් අවබෝධ වීමට ඉඩ ලබාදීම හා ඒ පිළිබඳ සිසුන්ට අවධාරණය කර දක්වීම.
- නාට්‍යයේ සංවාද මගින් එක් එක් චරිතයේ අපේක්ෂාවන්, ඇවතුම් පැවතුම් මානසික ස්වභාවය ආදිය හෙළිදරව් වන බව පැහැදිලි කිරීම.
- පෙළ කියවීමේ දී රංග විධාන, විරාම ලකුණු හා විරාමයන් පිළිබඳ අවබෝධයෙන් යුක්ත ව කියවිය යුතු බව පෙන්වා දෙන්න.

  උදා: (සරණපාල කල්පනා කරමින් වාඩි වී සිටියි. සෙමින් දොර ඇරගෙන එතැනට එන සම්පත්)

  සම්පත් : ආ ........ සරණපාල වන්නිආරච්චි ............. හුග කලකින් දක්කෙ නැති නිසා බලන්න කියල ආවා.

- නිර්දිෂ්ට නාට්‍ය පෙළෙහි දර්ශනයෙන් දර්ශනය වෙනස්වන අවස්ථාවල දී එක් එක් ස්ථාන නාට්‍යයේ විකාශයට බලපාන ආකාරය පිළිබඳ සිසුන්ට අවබෝධයෙන් කියැවීමට උපදෙස් ලබා දෙන්න.

  උදා : 2 වන දර්ශනය - නැටුම් පන්තිය
  3 වන දර්ශනය - ප්‍රියංගනී ගේ ගෙදර
  4 වන දර්ශනය - සම්පත් ගේ ගෙදර
  5 වන දර්ශනය - හිල්ඩා ගේ කන්තෝරුව

- පෙළ කියැවීමේ දී චිත්තරූප මැවෙන බව පැහැදිලි කිරීම.
- යමකුට පෙළ කියවීමෙන් පමණක් ම නාට්‍යයක් රස විඳීමට හැකියාවක් ඇති බවට අත්දැකීම් ලබා දීම.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිර්දිෂ්ට නාට්‍ය පෙළ නිශ්ශබ්ද ව හෝ ශබ්ද නගා කියැවීම.
- නාට්‍ය පෙළෙහි එන විවිධ චරිත අධ්‍යයනය කිරීම.
- වෙනත් නාට්‍ය පෙළ කියවීමට උනන්දුව දක්වීම.
- නාට්‍ය පෙළ රසවිඳීමට උත්සාහ ගැනීම.
- විවිධ නාට්‍ය පෙළෙහි එන විවිධ තේමාවන් හඳුනාගැනීමට උත්සාහ කිරීම.

පැවරුම :

- නිර්දිෂ්ට නාට්‍ය පෙළ විවිධ ආකාරයෙන් කියැවීමට ඉඩ සැලැස්වීම.
- නිශ්ශබ්ද ව / ශබ්ද නගා / නාට්‍යානුසාරයෙන්
- නිවැරදි උච්චාරණයෙන් යුතු ව සංවාදයේ යෙදීමට අවස්ථා ලබා දීම.
- විවිධ ශෛලීන්ට අයත් වෙනත් නාට්‍ය පෙළ කීපයක් කියවීමට ඉඩ සැලැස්වීම.
- නාට්‍ය පෙළෙහි එන විවිධ චරිත අධ්‍යයනය කිරීම.
- වෙනත් නාට්‍ය පෙළ කියවීමට උනන්දුව දක්වීම.
- නාට්‍ය පෙළ රසවිඳීමට උත්සාහ ගැනීම.
- විවිධ නාට්‍යයන්හි එන විවිධ චරිත නිරූපණයට ඉඩකඩ සැලැස්වීම.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.3** : සංවාද භාවිතයෙහි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : අර්ථවත් ව සංවාද භාවිත කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- නාට්‍යයේ ගලා යාමට සංවාද භාවිතය රුකුලක් වන බව පවසයි.
- අර්ථවත් ව සංවාද භාවිත කරයි.
- සංවාද සඳහා උචිත හා ජීව ගුණය කැටි කර ගත් භාෂාවන් භාවිතයට පෙළඹෙයි.
- විවිධ නාට්‍ය ශෛලීන්ට අනුරූපී ව සංවාද භාවිත කරයි.

**ගුණාත්මක යෙදවුම්** : වේදිකා නාට්‍ය සංවාද කොටස් ඇතුළත් සංයුක්ත තැටි හෝ නාට්‍ය පිටපත් (හුණුවටයේ කතාව, කපුවා කපෝති, සිංහබාහු, මනමේ, සක්කාය දිට්ඨී, බෙරහඬ, ජනේලය)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01

විවිධ සංවාද කොටස් ඇතුළත් සංයුක්ත තැටි වාදනය කර, සිසුන්ට ශ්‍රවණය කිරීමට සැලැස්වීමෙන් පාඩමට ප්‍රවේශ විය හැකි ය.

වේදිකා නාට්‍යයක සංවාද භාවිතයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

- සතර අභිනයට අයත් වාචික අභිනය යනුවෙන් හඳුන්වන්නේ නාට්‍ය පෙළ සාහිත්‍යයෙහි දැකිය හැකි දෙබස් හා ගීතය.
- නාට්‍යයක් ඉදිරියට ගලා යන්නේ සංවාද භාවිතය මගිනි.
- සංවාද ආශ්‍රයෙන් මවාගන්නා චිත්තරූප නළු කාර්යය සාර්ථක කරගැනීමට ඉවහල් වේ.
- නාට්‍යයක් සාර්ථක වීම සඳහා සංවාදවල ඇති ප්‍රබලත්වය ප්‍රධාන වශයෙන් හේතු වේ.
- සංවාද භාවිත කරන ආකාරය මගින් චරිතය ප්‍රේක්ෂකයා වෙත සමීප කළ හැකි ය.

පියවර 02

- සංවාද භාවිත කිරීමේ දී සැලකිය යුතු කරුණු කෙරෙහි ද අවධානය යොමු කරවන්න.
- සංවාද පැහැදිලි ව උච්චාරණය විය යුතු ය.
- රංගයට උපකාර වන අයුරින් සංවාද හැසිරවිය යුතු ය.
- සංවාද භාවිතයේ දී වචනවල ජීවගුණය ඉස්මතු වන ආකාරයෙන් කළ යුතු ය.
- භාෂාව සහ කතා විලාසය මනා සේ හැසිරවීම සංවාද භාවිතයේ දී වැදගත් වෙයි.
- අදාළ භාව ප්‍රකාශනය සංවාදවලින් ඉස්මතු විය යුතු වේ.

පියවර 03

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර දෙබස් ඛණ්ඩ භාවිතය සඳහා පවරන්න. ඉදිරිපත් කිරීම් අගය කරන්න.

  ''ශූෂා - විස්ස තිහ වුණත් මට කමක් නෑ. මම කියල දෙන්නම් ඔහේගෙ නීතිය ගැන. ඔහේ දන්න ඉටි ගෙඩියක් නෑ නීතිය ගැන. ඔහේ නිකම් බෙරි වෙච්ච එෑණු බිකක් (වක්කඩ කැඩුවා සේ)

මොකක් ද ඔහේට තියෙන යුතුකම අපට මේ විධියට නින්දා කරන්න. හරියට ඔහේ නඩුකාරකම වින්නඹු අම්මගෙන් අරගෙන ආව වගේ! ඔහේ නඩුකාරයෙක් උනේ පරණ පිනක් පල දීල! අරුන්ගෙ මුන්ගේ අතන මෙතන ලෑටි ගාලා! දූන් ඉඳගෙන උන්ට ආවඩනව! ඔහේ පගාකාරයෙක් කුණු ගොඩවල් අවුස්සන කැරපොත්තෙක්''.

(පිටු අංක 98 - හුණුවටයේ කතාව)

- ''**සේපාලිකා** - (තමාටම) කොච්චර අපූරු මහත්මයෙක් ද? දූනුයි මට එයා හොඳට දූන ගන්ඩ පුළුවන් උනේ කතා බස් කරපුවාම කාට උනත් ආසා හිතෙනවා. කොච්චර හැදිච්ච නිවිච්ච මහත්මයෙක් ද? ඔය වගේ අය හොයා ගන්ඩ බෑ තමයි, මිස්ට කරුණාරත්න කියාපු එක ඇත්ත. මෙච්චර ඉක්මණට යන්ඩ ගිය එකයි වැරැද්ද. තව එක පැයක්වත් කතා කර කර ඉන්ඩ ලැබුණා නම් කොච්චර අගේ ද? අනිත් ඔක්කෝටම වැඩියෙ හොඳ, අනිත් මිනිස්සු වගේ වාචාලයෙක් නොවන එකයි. මටත් වචනයක් දෙකක් කියා ගන්ඩ ඕනෑකම තිබුණා, නමුත් ලැජ්ජාව හින්දා කියාගන්ඩ බැරි උණානේ. කොච්චර අපූරු මහත්මයෙක් ද? යන්ඩ ඕනෑ ඇන්ටි එක්කලා කියන්ඩ. (ගෙතුළට යයි) කරුණාරත්න, ගුණතිලක ඇදගෙන යයි)''

(පිටු අංක 91 - කපුවා කපෝති)

- ''**ගුරු** (පුංචාගෙන් ශබ්දයක් නැති බව හැඟී ඒ පැත්ත බලයි. කාරණය වැටහෙයි. ප්‍රේක්ෂකයන් වෙත සිනහවක් පා, පැංචා වෙත ගොස්) බොල මෝඩයෝ ..... තුන්වැනි පාදය කියන්නෙ ..... මේ ශ්ලෝකයේ තුන්වැනි පාදය (පැංචාට යළිත් ගසන්නට යයි)

ස්වදේගේ පූජ්‍යශේ රාජාතේ
මුළු රටේම පූජාව ලබන්නෙ රජ්ජුරුවො
මහා රජ්ජුරුවෝ
විද්වත් සර්වත්‍ර පූජ්‍යතෙ
සර් ර් ර් ර් ව ජනී ජනයා පූජාව දෙන්නේ
(තමන්ට බව අභිනයෙන් දක්වයි.''

(පිටු අංක 31 - සක්කාය දිට්ඨි)

- ''**ඇබිත්තයා** ඃ ඔන්න මම තේ වතුර වත්කරගෙන ආහම මේ මහත්තුරු එක්කෙනෙක්වත් නෑ. තේ බොන්ඩ මතක නැතිව ඇවිදින්ඩ යන්ඩ ඇති. ඔහොම තමයි ඕගොල්ලගෙ හැටි. වීදුරු දෙකක් තිබුණ. ඒකෙනුත් එකක් කඩලා. දැං තියෙනනේ මේ වීදුරුව විතරයි. ඒකත් මගේ වීදුරුව. හ්ම් ! ඒක කිව්වමයි මතක් උනේ. මමත් බොන්ඩ එපායැ තේ වතුර එකක්. (බොයි) යන්තං ඇඟට පන ටිකක් ආවා. එක්කො මං ආකාස මහත්තයගෙ කාර් එක හෝදල දෙනව. (ආකාස සන්තෝෂයෙන් හිස වනමින් එයි) එක්කො මං ආකාස මහත්තයගෙ කාර් එක හෝදල දෙන්නං!''

(පිටු අංක 19 - ජනේලය)

- ''සිඳගන -

ඇයි ද යකුනි තොපි පෙරළි කරන්නේ ?
කැකෝ ගහමින් බෙරි හඬ දෙන්නේ
නිසංසලේ අපි මෙතන සිටින්නේ
එහෙව් අපට ඇයි තොප ඉන්ට නොදෙන්නේ

''හොරා හොරා'' කියමිං හඬ දෙන්නේ
ඒ ඇහිලයි මම එළියට පැන්නේ
දනිව් යකුනි තොපි මම කවු ද කියන්නේ
මේ වනයට මම පතිනිය වන්නේ

(පිටු අංක 52 - බෙරහඬ)

- ''**සිංහබාහු** -

නැත පියාණෙනි කිසිදු මන දොළ
සමා වුව මැන දොසක් වී නම්
වෙසෙන සඳ මේ පාලු ලෙන තුළ
නෙක් දිසා සිත පියාඹා යයි

නොමද සිතුවිලි සීන බියකරු
භූත වෙස් ගෙන මා පෙළයි නිති
මාගෙ මව හා නැගණියන් ගැන
සිතේ නිරතුරු ඇත රැඳී බිය

වලට ගොස් ම පියාණෙනි උතුම්
කිසි දිනක පෙරළා නොආවොත්
මේ ලෙනේ සිර වී සිටින්නා
බැහැර යන්නට මග නොදන්නා

නැගණියන් හා මව ද දෙදෙනා
සමග වන්නෙමි ගොදුරු මරු හට''

(පිටු අංක 21 - සිංහබාහු)

- ''**කුමරා වචනය** -

''වසන්ත ශ්‍රීයෙන් අලංකාර වූ, මගුල් මඩුවකට බඳු වූ වනාන්තරයේ ශෝභාව නරඹමින් යන විට, ගමන් විඩාව ඉබේම මග හැරේ, සොඳුර. වන රජින ද උත්සව විලාසයෙන් නෙක් විසිතුරු පාන්නී අප දෙදෙනාගේ විවාහය නිසා සතුටු වන්නා සේ ය.''

(පිටු අංක 24 - මනමේ)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සංවාද භාවිතයේ වැදගත්කම ලේඛනගත කිරීම.
- අර්ථවත් ව සංවාද භාවිත කිරීම.
- ලෝකධර්මී ශෛලියට අදාළ ව සංවාද උච්චාරණය කිරීම.
- නාට්‍යධර්මී ශෛලියට අදාළ ව සංවාද උච්චාරණය කිරීම.
- වාචික අභිනය පෑමට අනුරූපී ව රූපණයෙහි යෙදීම.

පැවරුම : නිර්දිෂ්ට ග්‍රන්ථයට අයත් සංවාද අර්ථාන්විත ව උච්චාරණය කරන්න.

**අතිරේක උදව්** : සංවාද භාවිතයට ගැනීමට වඩාත් සුදුසු නාට්‍ය පෙළ

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.4** : නාට්‍ය ගීත ගායනා කරමු.

**ක්‍රියාකාරකම** : ගී ගයමින් රඟුම් රඟමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- විවිධ නාට්‍ය ගීත රැස් කරයි.
- පැරණි හා නව නාට්‍ය ගීත තෝරාගනී.
- භාවාත්මක ව ගායනා කරයි.
- නියම ශ්‍රැති හා තාල අනුව ගයයි.
- ඒ ඒ නාට්‍ය ගී වලට ආවේනික නාදමාලාවට අනුව ගයයි.
- නාට්‍ය ගී ගයමින් රඟයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාට්‍ය ගීත ඇතුළත් පොත්, පත්‍රිකා
- නාට්‍ය ගීත අඩංගු සංයුක්ත තැටි
- නාට්‍ය ගීත රඟන අවස්ථාවල පින්තූර
- විවිධ නාට්‍ය ගීත රංගන ඇතුළත් වීඩියෝ පට

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ගුරුවරයා නාට්‍ය ගීතයක් නියම නාදමාලාව අනුව ගායනා කරමින් හෝ ඒ සඳහා දක්ෂතා ඇති අයකු ලවා ගායනය කරවමින් හෝ ගීත අඩංගු සංයුක්ත පට මගින් නාට්‍ය ගීයක් සිසුන්ට ඇසීමට / නැරඹීමට සලස්වන්න. එම ගීතය පිළිබඳ ව විමසමින් පාඩමට පිවිසෙන්න.

පියවර 02 හැකි නම් සරල ගීයක කොටසක් ද ගායනා කර පෙන්වා සරල ගීතය හා නාට්‍ය ගීතය අතර සිසුන් ට දැනුණු වෙනස්කම් පිළිබඳ ව විමසන්න. පහත සඳහන් කරුණු ද උපයෝගී කරගෙන සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නාට්‍ය සංගීතයේ කොටසක් වුව ද නාට්‍ය ගීත ගායනය, වාචික අභිනයට අයත් වන බව.
- නාට්‍ය ගීත ඒ ඒ නාට්‍ය ශෛලීන්ට අනුව වෙනස් වන බව.
- මෙම ගීත නාට්‍යෝචිත ව, භාවාත්මක ව ගායනා කළ යුතු බව.
- නාට්‍ය ගීතයක් අසා රස විඳීමට නො ව බලා, අසා (ශ්‍රව්‍ය දෘශ්‍ය) රස විඳීමට හැකි විය යුතු බව.
- සොකරි ගී, කෝලම් ගී, නාඩගම් ගී, නූර්ති ගී, නව නාට්‍ය ගී යනුවෙන් විවිධ නාට්‍ය ගී ප්‍රභේද ඇති බව.
- ඒ ඒ ගීතවලට ආවේනික නාදමාලා ඇති බව.
- ඒ ඒ නාට්‍ය ගීවලට යොදා ගන්නා සංගීතය ද විවිධාකාර බව.

පියවර 03
- සොකරි, කෝලම්, නාඩගම්, නූර්ති, නව නාට්‍ය ආදි වර්ගවලින් එක් වර්ගයකින් එක ගීයක් බැගින් වත් සිසුන් සමග ගායනා කරන්න.

  (පාසලේ සංගීත ගුරුභවතා ගේ සහාය ද ලබා ගැනීමට හැකිනම් වඩාත් අගනේ ය.)

  මෙම නාට්‍ය ගීත ගායනය සමග උචිත රංගනයන් ද සිසුන්ට හුරු කරවන්න. මෙහි දී විවිධ නාට්‍යවල ගීතමය ජවනිකා සිසුන්ට පෙන්විය හැකි නම් වඩාත් ප්‍රයෝජනවත් වේ.

පියවර 04 • සිසුන් කණ්ඩායම් කීපයකට බෙදා ඔවුන්ට විවිධ ශෛලීන්ට අයත් නාට්‍ය ගීත ගායනයට හා රංගනයට අවස්ථාව දෙන්න.

ඒ ඒ කණ්ඩායම් විසින් රඟ දක්වන ලද නාට්‍ය ගීත අනෙක් කණ්ඩායම් විසින් ද රඟ දැක්වීමට පුහුණුවන ලෙස උපදෙස් දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ ශෛලීන්ට අයත් නාට්‍ය ගීත තෝරාගැනීම.
- නියම නාදමාලාවලට අනුකූල ව ගීතය ගායනය කිරීම.
- තාලය හා ශ්‍රැතිය නියම ලෙස පවත්වාගැනීම.
- උචිත රංගනයන් ඉදිරිපත් කිරීම.
- භාවයන් ප්‍රකාශ වන පරිදි ගායනය හා රංගනය

**පැවරුම** : නාට්‍ය ගීත එකතුවක් සකස් කරන්න.

**අතිරේක උදව්** : 6-11 ශ්‍රේණි සඳහා විවිධ අවස්ථාවන්හි යොදා ගත් නාට්‍ය ගීත.

| | |
|---|---|
| කුමට ද සොබනියෙ | |
| ඇහැළ මලින් | නරිබෑණා නාට්‍යය |
| දන්න වංහුං | ශ්‍රී වික්‍රම නූර්තිය |
| අද වෙස්සන්තර | වෙස්සන්තර නූර්තිය |
| දීකිරි දීකිරි<br>යස ඉසුරු | රතු හැට්ටකාරී නාට්‍යය |
| සවන් දී පෙර රාම | රාමායණය නූර්තිය |
| සෝබාවදේ මෙපුර | තාරාවෝ ඉගිලෙති |
| උත්තමවන් ලොව | ජොහානා නාඩගම |
| ගම්භිර තෙදැති | බැලසන්ත නාඩගම |
| අපි ගමට යමු<br>ආලෙබැන්ද මාගෙ | කාලගෝල නාඩගම |
| ඉදින් බබෝ ඉදින් | බැලසන්ත නාඩගම |
| සිරිසංසබෝධි | සිරිසඟබෝ නූර්තිය |
| සොකරි එන්නී | සොකරි නාට්‍යය |
| ආලවෙලා පියසේ පටන්<br>මං ලෙස සොබනා<br>පෙර සිට පැවත එන | ජස ලෙංචිනා |
| මෙම ගිම්හාන | විධුර නූර්තිය |
| රකිනු ඊශ්වරා | රාමායණය නූර්තිය |
| අ, ආ, ඇ, ඈ | ගුරුතරුව නාට්‍යයෙන් |
| පරසක්වල අපෙ | සෙක්කුව නාට්‍යයෙන් |
| සත්සියක් කපු | කුවේණි නාට්‍යයෙන් |
| මුහුදු පතුල | මූදු පුත්තු නාට්‍යයෙන් |
| ලප නොමවන් | මනමේ නාට්‍යයෙන් |
| හතික වරෙව් | බෙරහඬ නාට්‍යයෙන් |

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.5** : චරිත ප්‍රතිනිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍ය පෙළක එන චරිත විවිධ රංග ශෛලීන්ට අනුව ප්‍රතිනිර්මාණය කරමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නාට්‍ය පෙළෙහි රංග ශෛලිය නම් කරයි.
- නාට්‍ය පෙළක එන චරිත නම් කරයි.
- විවිධ චරිත නිරූපණය කරයි.
- චරිතවල විවිධතා වෙන් කර දක්වයි.
- චරිත ප්‍රතිනිර්මාණය කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : කාලගෝල, විකෘති, හුණුවටයේ කතාව, කැළණි පාලම, මනමේ නාට්‍ය වැනි නාට්‍ය පිටපත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 සිසුන් නිදහස් අවකාශයකට රැගෙන යන්න. කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන් කරන්න. සපයා ගෙන ඇති නාට්‍ය කෘතිවලින් තෝරාගත් කොටස් ඒ ඒ කණ්ඩායම්වලට ලබා දෙන්න. මුලින් ගුරුවරයා විසින් ලකුණු කර දී ඇති කොටස හොඳින් කියවා අධ්‍යයනය කරන්න.

පියවර 02 කණ්ඩායම එහි ඇති චරිත එකිනෙකට වෙන් කරගන්න. තෝරාගත් නාට්‍යමය අවස්ථාවේ ඇති චරිත කණ්ඩායම් සාමාජිකයන් විසින් ප්‍රතිනිරූපණය කරන්න. මෙහි දී පිටපතෙහි දෙබස්වලට අදාළ ම හෝ පිටපතෙහි දෙබස් නොසලකා අදාළ චරිත රඟපා පෙන්වීම සිදු කරන්න.

පියවර 03 සිසුන් විසින් නිර්මාණය කරගත් චරිතය හා එයට අදාළ රංග ශෛලිය වෙනස් කර රඟපෑමට යොමු කරවන්න. උදා : මනමේ නාට්‍යයේ චරිතය ස්වාභාවික ආකාරයටත් කැළණි පාලම හෝ විකෘති නාට්‍යයේ චරිත නාට්‍යධර්මී ලෙසත්, එනම් තාලානුකූල සංවාද හා චලන භාවිත කරමින් රඟපෑම සඳහා යොමු කරවන්න.

පියවර 04
- මෙම චරිත ප්‍රතිනිර්මාණයේ දී මුලින් ම පිටපත කියවාගැනීම, ඉන් පසු සංවාද හඬනගා කියවාගැනීම සහ අවසාන සංවාද සමග චලනය එක් කරමින් චරිත නිරූපණයට පිවිසීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කරන්න.
- සිසුන් කණ්ඩායම් වශයෙන් කරනු ලැබූ චරිත ප්‍රතිනිර්මාණය නරඹා එහි ඇති අඩුපාඩු පෙන්වා දීම සහ එය නැවත සලසා ගෙන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍ය පෙළක එන චරිත හඳුනාගැනීම.
- විවිධ චරිතවලට අදාළ ව ශෛලීන් නම් කිරීම.
- චරිත නිරූපණය ක්‍රමානුකූල ව ඉදිරිපත් කිරීම.
- විවිධ චරිත ප්‍රතිනිර්මාණය කිරීම.
- චරිත කිහිපයක් රංගනය කිරීම.

පැවරුම : සිසුන් කණ්ඩායම් සඳහා විවිධ චරිත ඇතුළත් අවස්ථාවක් හෝ සිද්ධියක් නිරූපණය කරවීමට යොමු කරන්න.

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.6** : නව නාට්‍ය පෙළ නිෂ්පාදනය කරයි.

**ක්‍රියාකාරකම** : රූපණයේ දී රංග භූමිය භාවිත කළ යුතු අයුරු ප්‍රායෝගික ව අත්විඳීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- රංගභූමියේ ප්‍රධාන බෙදීම් පැහැදිලි කරයි.
- රංගනයේ දී වේදිකාව භාවිත කරන අයුරු දක්වයි.
- භූගෝලීය වශයෙන් රංගභූමිය කොටස් 09 (නවය) ලෙස දැක්වීම මනඃකල්පිත වුව ද හොඳ ප්‍රේක්ෂාවක් ලබා දීමට මෙය ඉවහල් වන ආකාරය පැහැදිලි කරයි.
- රංගභූමියේ පසුතල නිර්මාණ තිර භාවිතය පිළිබඳ ව දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** : සංයුක්ත තැටි, රංගභූමිවල රූපසටහන්, රංගභූමියේ ප්‍රධාන බෙදීම් සහිත රූපසටහනක්, විවිධ රංගන අවස්ථා සහිත පින්තූර

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 නාට්‍ය කීපයක කොටස් කිපයක් සංයුක්ත පට මගින් සිසුන්ට නැරඹීමට සලස්වන්න. එසේ නැත්නම් වේදිකාව සාර්ථක අයුරින් භාවිතා කර ඇති නාට්‍ය දර්ශනයක පින්තූරයක් හෝ සිසුන්ට පෙන්වා, ඒ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 02 රංගභූමිය භාවිත කිරීම පිළිබඳ ව දැක්වෙන පහත කරුණු ද උපයෝගී කරගෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් කීපයක් කරවන්න.

- ලෝකයේ විවිධ රංගභූමි ඇතත් ඒ අතරින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් භාවිතා වන්නේ පින්තූර රාමු වේදිකාව බව.
- පින්තූර රාමු වේදිකාවේ මනඃකල්පිත වශයෙන් බෙදීම නාට්‍ය අධ්‍යක්ෂවරයාට, නළුනිළියන්ට මෙන් ම ආනුෂංගික ශිල්පීන්ට ද වැදගත් වන බව.
- රංගභූමිය මත රංග ශිල්පීන් ස්ථානගත කරවීම අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු බව.
- නළු-නිළියන් වේදිකාවේ ස්ථානගත කිරීම නාට්‍යයේ එන සිදුවීමට හේතුඵල සම්බන්ධතාව රැකෙන ලෙස සිදු විය යුතු බව.
- රංගභූමියේ සමබරතාව රැකගත යුතු බව.
- රංගභූමියට ප්‍රවේශ වීම් හා පිටවීම් ද ඊට අදාළ දිශාවන් පිළිබඳ ව ද නිසි අවබෝධයක් තිබිය යුතු බව.
- රංගභූමිය ඇතුළත යොදා ඇති පැති තිර පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු බව.
- රංගභූමියේ රංගාලෝකය ප්‍රධාන වශයෙන් පතිත වන ස්ථාන නළුනිළියන් විසින් අවබෝධ කොට ගෙන තිබිය යුතු බව.
- පසුතල නිර්මාණ, නාට්‍යෝපකරණ යොදා ගන්නේ නම් ඒවා තබා ඇති ස්ථාන භාවිත කරන අන්දම පිළිබඳ ව අවබෝධයක් ද නළුනිළියන්ට තිබිය යුතු බව.

පියවර 03

- සිසුන් කණ්ඩායම් වශයෙන් වේදිකාවට ගෙන්වා භූගෝලීය මනඃකල්පිත බෙදීම හඳුන්වා දෙන්න.
- නාට්‍ය කොටස් කීපයක් සිසුන්ගේ කණ්ඩායම් මගින් රඟ දක්වන්න.

**පියවර 04** සිසුන් විසින් රඟදක්වන ලද නාට්‍ය කොටස් පිළිබඳ ව ඒ ඒ කණ්ඩායම් විසින්, අනෙක් කණ්ඩායම් වේදිකාව භාවිතා කළ අයුරු පිළිබඳ ව විමසීමක් කරන්න. සිසුන්ගේ අදහස් ද සැලකිල්ලට ගෙන පහත කරුණු ද උපයෝගී කරගෙන ඇගැයීමක් කරන්න.

- රංගභූමිය භාවිත කිරීමේ දී නළුනිළියන් තමන් ඉදිරියේ සිටින ප්‍රේක්ෂකයින් හට අපූර්වත්වයෙන් යුක්ත නාට්‍ය අත්දැකීමක් ලබා දිය යුතු බව.
- ප්‍රධාන වශයෙන් ම සියලු ම ප්‍රේක්ෂකයින්ට සියලු ම නළුනිළියන් හොඳින් දිස් වන ලෙසින් වේදිකාවේ ස්ථානගත විය යුතු බව.

උදාහරණයක් ලෙස

භූගෝලීය බෙදීම මෙන් ම මේ දෘශ්‍යමය රේඛාව ද මනඃකල්පිත වේ.




ඉදිරිපස අසුන් පෙළ

වේදිකාවේ ඉදිරිපස අසුන් පෙළෙහි දෙකෙළවර සිටින ප්‍රේක්ෂකයින්ට හොඳින් පෙනෙන ලෙස (දෘශ්‍යමය රේඛාවෙන්) මැදි වී ඇති කොටස වේදිකාවේ ප්‍රබල ස්ථාන ලෙස නම් කළ හැකි බව.

නළුනිළියන් හා ප්‍රේක්ෂක සහසම්බන්ධය තබාගැනීමෙහි ලා වේදිකාවේ ස්ථානගත වීම සෘජු ව ම බලපාන බව.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- රංගභූමියේ ප්‍රබල ස්ථාන පිළිබඳ හඳුනාගැනීම.
- රංගභූමියේ නිසි ලෙස ස්ථානගත වීම.
- වේදිකාවේ සමබරතාව රැකීම.
- ප්‍රබල ප්‍රේක්ෂාවක් ලබා දීමේ හැකියාව.
- ප්‍රේක්ෂකයින්ට අපූර්වත්වයෙන් යුක්ත නාට්‍ය අත්දැකීමක් ලබා දීම.

පැවරුම : ඔබ විසින් රචනා කරන ලද පිටපත්වල නළුනිළියන් ස්ථානගත විය යුතු ආකාරය සලකුණු කරන්න. (නිෂ්පාදන පිටපතෙහි)

**නිපුණතාව 3.0** : නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**නිපුණතා මට්ටම 3.7** : ප්‍රකාශනාත්මක නිරූපණයන්හි යෙදෙයි.

**ක්‍රියාකාරකම** : තාලාන්විත රූපණ

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- වාද්‍ය ඛණ්ඩය රස විඳියි.
- වාද්‍ය ඛණ්ඩය සඳහා අර්ථ සපයයි.
- තාලාන්විත ව රංගනයෙහි යෙදෙයි.
- එක ම වාද්‍ය ඛණ්ඩයකට විවිධ අර්ථ නිරූපණ ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- වාද්‍ය සංගීත ඛණ්ඩ රැගත් සංයුක්ත තැටි
- සංයුක්ත තැටි වාදනය කරන උපකරණය (VCD player)

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 වාද්‍ය ඛණ්ඩය ශ්‍රවණය කිරීමට හැකි, නිදහස් අවකාශයක් සහිත ස්ථානයකට සිසුන් රැගෙන යන්න. සියලු ම සිසුන් බිම වාඩි කරවා, වාද්‍ය ඛණ්ඩය ශ්‍රවණය කිරීමට අවස්ථාව සලසන්න. දෑස් පියාගැනීමට උපදෙස් දීමෙන් වැඩි අවධානයකින් යුතු ව වාද්‍ය ඛණ්ඩය ශ්‍රවණය කළ හැකි බව අවධාරණය කරන්න.

පියවර 02 වාද්‍ය ඛණ්ඩය ශ්‍රවණය කිරීමේ දී ඒ පිළිබඳ ව සිසුන් තුළ ඇති වූ සිතුවිලි, මතකයන්, අත්දැකීම් ප්‍රකාශ කිරීමට, සාකච්ඡා කිරීමට අවකාශ ලබාදෙන්න.

පියවර 03 එකම වාද්‍ය ඛණ්ඩයකට විවිධ අර්ථ ගැබ් කොට තාලාන්විත ව නිරූපණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

පියවර 04 කාලය, අර්ථාන්විත බව, ආරම්භය, නිමාව, තාලාන්විත බව, අවකාශ භාවිතය කෙරෙහි ද අවධානය යොමුවිය යුතු බව පවසන්න.

පියවර 05
- සිසුන් කණ්ඩායම් කරන්න.
- විවිධ වාද්‍ය ඛණ්ඩ සිසුන් අතර බෙදාදෙන්න.
- වාද්‍ය ඛණ්ඩයට අදාළ ව අර්ථාන්විත රූපණයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් එය අගය කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- වාද්‍ය ඛණ්ඩයට අර්ථ සැපයීම
- අර්ථවත් ව නිරූපණය කිරීම
- විවිධ අර්ථ ගැන්වීම
- තාලාන්විත බව
- විවිධ වාද්‍ය ඛණ්ඩනවලට අදාළ ව අර්ථාන්විත ව රූපණයෙහි නිරත වීම.

පැවරුම : විවිධ වාද්‍ය ඛණ්ඩයනට ගැළපෙන සේ අර්ථාන්විත රූපණ ඉදිරිපත් කිරීම. මෙවන් අභ්‍යාසයන්හි නිරත වීමෙන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රායෝගික පරීක්ෂණය (ශ්‍රවණ) සඳහා පෙරහුරුවක් ලබා ගත හැකි ය.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1.1** : දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : ''කංකාරි රඟ ලකුණු විමසමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- කංකාරිය යනු කුමක්දැයි හඳුනාගනියි.
- කංකාරියෙහි අරමුණු විමසයි.
- කොහොඹා කංකාරියෙහි නාට්‍යමය ලක්ෂණ මතු කොට දක්වයි.
- එම නාට්‍යමය අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- එම අන්තර් රංග අවස්ථා නව නිර්මාණ සඳහා යොදාගනියි.
- දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : කොහොඹා කංකාරියේ දර්ශන අඩංගු සංයුක්ත තැටි, ඡායාරූප හා චිත්‍ර සටහන්. අදාළ විෂය කරුණු ඇතුළත් පොත්පත්, අදාළ ශාන්ති කර්මවලින් උපුටාගත් කොටස්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- කොහොඹා කංකාරියේ දර්ශන අඩංගු සංයුක්ත තැටියක් හෝ රංග අවස්ථා දක්වෙන ඡායාරූප / පින්තූර හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසා දෙන්න.
- කංකාරි ශාන්තිකර්ම යනු දෙවියන් උදෙසා කරනු ලබන ශාන්තිකර්ම විශේෂයක් බවත්, කොහොඹා දෙවියන් වෙනුවෙන් කරනු ලබන පුද පූජා විශේෂයක් වන කොහොඹා කංකාරිය උඩරට නැටුම් සම්ප්‍රදායට අයත් දේශීය ලක්ෂණවලින් පෝෂිත වූවක් බවත් සිසුන්ට පහදා දෙන්න.

පියවර 02
කොහොඹා කංකාරියේ උපත් කතාව සිසුන්ට සැකෙවින් පහදාදෙන්න. විජය රජු කුවේණියට දුන් ප්‍රතිඥාව කඩ කිරීම හේතුවෙන්, ඔහුගෙන් පසුව රජ වූ පඬුවස් දෙව් රජුට දිවි දෝෂය වැළඳුණු බවත්, එම දිවි දොස් දුරු කිරීම සඳහා මෙම යාගය කරන ලද බවත් පැහැදිලි කරන්න. පසුකාලීන ව මෙය වෙනත් අරමුණු සඳහා එනම් අපල උපද්‍රව දුරු කිරීම, සෙත් ශාන්තිය ලබා දීම, සශ්‍රීකත්වය හා සෞභාග්‍යය උදෙසා දෙවියන්ගේ පිහිට පැතීම, භාවිත කළ බව සඳහන් කරන්න. විශේෂයෙන් උඩරට ප්‍රදේශවලට ආවේණික ශාන්ති කර්මයක් වන කොහොඹා කංකාරිය, හත්කෝරළය, සතර කෝරළය, උඩුනුවර, යටිනුවර, දුම්බර, හේවාහැට ආදී ප්‍රදේශවල ප්‍රචලිතව තිබූ පූජා කර්මයක් වන අතර වර්තමානයේ එය අභාවයට යමින් පවතින බව ද පැහැදිලි කරන්න.

පියවර 03
කොහොඹා කංකාරියෙහි එන නාට්‍යමය ලක්ෂණ සහිත අන්තර් රංග අවස්ථා - එනම් ඌරායක්කම, නයා යක්කම, වැදි යක්කම, සීතා යක්කම සහ දර්පණ යක්කම යන යක්කම් පහ, ගබඩා කොල්ලය, ගුරුගේ මාලාව යන අවස්ථාවල ඇති නාට්‍යමය ලක්ෂණ හඳුනාගැනීමට අවස්ථාව ලබා දෙන්න. ඒ අනුව අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, අනුකරණය, අනුරූපණය, සමාරෝපය, රංග උපකරණ භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය ආදී නාට්‍යමය ලක්ෂණ ඉහත කී අන්තර් රංග අවස්ථාවල යොදාගෙන ඇති අයුරු සාකච්ඡා කරන්න. උක්ත සාකච්ඡාවෙන් අනතුරු ව සිසුන් කණ්ඩායම්වලට බෙදා (ඒ ඒ සංවාද ඛණ්ඩවලට අවශ්‍ය වන සංඛ්‍යාව අනුව) අන්තර් රංග අවස්ථාවල භාවිත වන සංවාද ඛණ්ඩ ප්‍රතිනිර්මාණය කිරීමට අවස්ථාව ලබාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කොහොඹා කංකාරිය හා සම්බන්ධ පුරාවෘත්තය දැනගනියි.
- කොහොඹා කංකාරියේ එන නාට්‍යමය (අවස්ථා) පෙළපාළි මතුකර පෙන්වයි.
- එම නාට්‍යමය පෙළපාළිවල දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි.
- සංවාද භාවිත කිරීම ප්‍රගුණ කරයි.
- කොහොඹා කංකාරිය ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.

**පැවරුම** : කොහොඹා කංකාරියේ උපත් කතාව ලියා එහි එන නාට්‍යමය පෙළපාළි (යක්කම් පහ ගබඩා කොල්ලය හා ගුරුගේ මාලාව) විස්තර කරන්න.

**අතිරේක උදව්** : සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1.2 :** දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි.

**ක්‍රියාකාරකම** : ''මඩු රඟ ලකුණු විමසමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :

- මඩු ශාන්තිකර්මයේ අරමුණු හා උපත් කතා විමසයි.
- මඩු ශාන්තිකර්මය යනු කුමක් ද යි හඳුන්වයි.
- මඩු ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ විමසයි.
- එම නාට්‍යමය අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- එම නාට්‍යමය අවස්ථා නව නිර්මාණ සඳහා යොදාගනියි.
- දේශීය සංස්කෘතික හර පද්ධති අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : මඩු ශාන්තිකර්මයේ දර්ශන අඩංගු සංයුක්ත තැටි, ඡායාරූප හා චිත්‍ර සටහන්. අදාළ විෂය කරුණු ඇතුළත් පොත්පත්.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01

- මඩු ශාන්තිකර්මවල දර්ශන අඩංගු සංයුක්ත තැටියක් හෝ රංග අවස්ථා දක්වෙන ඡායාරූප / පින්තූර හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසා දෙන්න.
- මඩු ශාන්තිකර්මය ද අදෘශ්‍යමාන බලවේගයන්ගෙන් පිළිසරණක් පතා කරනු ලබන පූජාමය ක්‍රියාවලියක් බව පහදාදෙන්න.

පියවර 02

- මඩු යාග කර්ම වර්ග කීපයක් ඇති බවත්, එනම් ගම්මඩු, දෙවොල් මඩු, පහන් මඩු, කිරි මඩු, පූනා මඩු, ගී මඩු, හැල්ලුම් මඩු ආදී වශයෙන් පවත්නා බවත්, මේ අතරින් වර්තමාන සමාජයේ වඩාත් අසන්නට දකින්නට ලැබෙන්නේ ගම්මඩු සහ දෙවොල් මඩු යාග පමණක් බවත් මෙය පොදු ශාන්තිකර්මයක් බවත් පැහැදිලි කර දෙන්න.
- ගම්මඩුවේ දෙවොල් මඩුවේ උපත් කතාව සැකෙවින් දක්වන්න. දඹදිව සේරමානන් නමැති රජ කෙනෙකු ගෝනෙකුට විද මැරීමෙන් අනතුරුව වෛරී වූ ගෝනා රජුගේ මානෙල් විලේ මැඩියකු වී උපන් බවත්, දිනක් රජ මානෙල් මලක් කඩා නාසයට ළං කරද්දී මැඩියා නාසය දිගේ මොළයට ගොස් කරන ලද පීඩාව හේතුවෙන් රජුට හිසරදයක් ඇති වූ බවත්, ප්‍රතිකාරවලින් සුවයක් නොලද අතර, රාත්‍රී හීනෙන් දුටු කාන්තාවක් පිළිබඳ බමුණන් කළ විග්‍රහයකට අනුව ලංකාවට පැමිණ රුවන්වැල්ලේ දී මෙම යාගය කළ බවත් උපත් කතාවේ සඳහන් වී ඇති බව පැහැදිලි කරන්න.
- ඉන්දියාවේ සිට ලක්දිවට පැමිණෙමින් සිටි දෙවොල් හත් දෙනාගේ නැව මුහුදුබත් වීමෙන් පසු තොටමුණුවලට ගොඩ බැසීමට වෙනත් දෙවිවරුන් බාධා කළ බවත්, අවසානයේ සීනිගමට ගොඩ බට අවස්ථාවේ පත්තිනි දේවිය ගිනි කඳු 7 ක් මවා දෙවි තෙද පරීක්ෂා කළ අවස්ථාවේ ඒ මැදට පැන ප්‍රාතිහාර්ය පා පුද කැප ගන්නට අවසර ලබාගත් බවත්, ගිනි පෑගීමෙන් එය සිහිපත් කෙරෙන බවත්, සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 03** අඹ විදමන, මරා ඉපැද්දීම, රාමා මැරීම, ඇත්බන්ධනය, මී බන්ධනය, දෙවොල් ගොඩ බැසීම, නාට්‍යමය පෙළපාලි මඩු ශාන්තිකර්මල ඇත. අඹ විදමනෙන් පත්තිනිය අඹයෙන් උපත් කතා ප්‍රවෘත්තියක්, මරා ඉපැද්දීමෙන් පත්තිනි දේවියගේ පුරුෂයා වන පාළඟ කුමරු පිළිබඳ කතා ප්‍රවෘත්තියත්, රාමා මැරීමේ දී සොරකමකට සැක කරනු ලබන රාමා මරා දමා පැන යාමට තැත් කරන හෙට්ටියා අල්ලා ඔහු ලවා ම රාමාට පණ ඉපැද්දීමත්, හාස්‍ය ජනක ආකාරයෙන් ඇතකු ඇල්ලීම හා මීමකු ඇල්ලීමත් ආදි වශයෙන් නාට්‍යානුසාරයෙන් අවස්ථා නිරූපණය කරනු ලබන බව පැහැදිලි කරන්න.

**පියවර 04** මීට අමතර ව, මංගර කුමරු මී කැඩීමට වනයට ගිය විට කුළුමීමකු මුණ ගැසී ඔහු හා සටන් වැද පැරදී මිය යන අයුරුත්, මංගර කුමරුට යළි පණ දෙන උපායක් සිතන දළ කුමරු මීමා මරා උගේ අවයව උපයෝගී කරගෙන කිරිමැස්සක් තනා කිරි උතුරුවා ඒ කිරි ඉසීමෙන් මංගර කුමරුට මෙන් ම මීමාට ද යළි පණ ලබා දෙන අයුරුත් කියැවෙන කතා පුවත ''කිරිමඩුව'' ශාන්ති කර්මයට පාදක වන බව පැහැදිලි කරන්න. එසේ ම පූනා මඩුවේ දී පූනාවට වස් දොස් එකතු කොට ගවයකු ගේ හිසට ගසා පූනාව බිඳ දැමීම සිදු වන බවත් සැකෙවින් දක්වන්න. අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, අනුකරණය, සමාරෝපය, වේෂභූෂණ ප්‍රේක්ෂක සහභාගිත්වය, සතර අභිනය, රංග භූමිය, අනුරූපණය යන නාට්‍ය ලක්ෂණ මෙම පූජාකර්මවල අන්තර්ගත වී ඇති බව පැහැදිලි කරන්න.

ඉහත කී සියලු කරුණු ඇතුළත් වන ආකාරයෙන් ප්‍රශ්න මාලාවක් සකස් කොට පිළිතුරු සැපයීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

විශේෂ සටහන : මෙම පූජාකර්ම පිළිබඳ ව අතිරේක උදව් යටතේ දී ඇති පොත් අධ්‍යයනය කොට අවශ්‍ය කරුණු තවදුරටත් සොයාගන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- මඩු ශාන්තිකර්මවල උපත් කතා දැනගැනීම.
- මෙම ශාන්ති කර්මවල අරමුණු ප්‍රකාශ කිරීම.
- මඩු ශාන්තිකර්මවල නාට්‍යමය අවස්ථා මතු කිරීම.
- මඩු ශාන්තිකර්මවල නාට්‍යමය ලක්ෂණ හඳුනාගැනීම.
- සංවාද හා අවස්ථා සාර්ථක ව ප්‍රතිනිර්මාණය කිරීම.

**පැවරුම :** මඩු ශාන්තිකර්ම හා සබැඳි උපත් කතා ඇසුරින් නිර්මාණාත්මක පොත් පිංචක් සකස් කරන්න.

**අතිරේක උදව් :** සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : දේශීය ජන නාට්‍ය කලාව හඳුනාගනියි.

**ක්‍රියාකාරකම 4.2.1** : ''සොකරි හඳුනාගනිමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගැනුම් පල** :
- සොකරි ජන නාටකයක් ලෙස හඳුනාගනියි.
- සොකරි කතාව විස්තර කරයි.
- සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ හඳුනාගනියි.
- සොකරි නාට්‍යයේ අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.
- ගැමි සංස්කෘතියේ හර පද්ධති අගයයි.

**ගුණාත්මක යෙදවුම්** :
- සොකරි නාට්‍යයේ දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, ඡායාරූප හා පින්තූර
- සොකරි පෙළ

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- සොකරි සංයුක්ත තැටිය හෝ ඡායාරූප රූප සටහන් හෝ සිසුන්ට නැරඹීමට අවස්ථාව සලසාදෙන්න.
- පෙර සූදානම් කරන ලද සිසුවකු හෝ කණ්ඩායමක් මගින් සොකරි නාටකයේ එන කවි කීපයක් ගායනා කරවන්න.
- ශ්‍රී ලංකාවේ පැරණිතම ජන නාටකය සේ සැලකෙන සොකරි නාටකයේ පරමාර්ථ වශයෙන් විනෝදාස්වාදය, පලදාව, සශ්‍රීකත්වය හා සෞභාග්‍යය උදා කරගැනීම යන කරුණු දැක්විය හැකි බව පැහැදිලි කරන්න. මෙම ගැමි නාටකය උඩරට ප්‍රදේශවලට ආවේණික බවත්, මෙය පත්තිනි පූජාව මුල් කොට ගන්නක් බවත් සඳහන් කරන්න.

පියවර 02
- සොකරි සෙසු ගැමිනාටකවලින් වෙනස් වූවක් බවත්, කෝලම්, නාඩගම් වැනි අනෙකුත් ගැමිනාටක විවිධ කතා පුවත් ආශ්‍රය කර ගනිමින් කරනු ලබන බවත්, සොකරි නාට්‍යයේ එක ම කතා පුවතක් යොදාගැනීමත් එහි ප්‍රධාන චරිතයේ නාමය නාට්‍යයේ නාමය වීම විශේෂත්වය වන බවත් තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එහි උපත් කතාව විස්තර කරන්න.

  ''සොකරිය, ගුරුහාමි හා පරයා ලංකාවට පැමිණ පදිංචි වීමට තැනක් සොයන අතර තඹරාවිට නම් ගමේ වෙදරාළ කෙනෙක් ඔවුනට ඉඩම් කැබැල්ලක් දෙයි. ඔවුන් එහි ගෙයක් තනා ගෙන වාසය කරන අතර පැන් සොයන්නට යන ආඬිගුරු වෙදරාළගේ බල්ලා විසින් සපා කනු ලබයි. වෙදකමට එන වෙදරාළ සොකරි හා පලා යයි. අවසානයේ ආඬිගුරු විසින් සොකරිය සොයාගනු ලබන අතර, ඇය ඒ වන විට ගැබ් ගෙන සිටියි. පසු ව සියල්ලෝ ම සාමදාන වෙති''.
- මෙම කතා සාරය ප්‍රාදේශීය වශයෙන් සුළු සුළු වෙනස්වීම්වලට භාජන වී ඇති බව නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.
- සොකරි, ආඬිගුරු, පරයා, කාලි ප්‍රධාන චරිත බව ද ඊට අමතර ව වෙදරාළ, පච්චමීරා ආදී චරිත ද ඇති බව කතාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
- මෙහි රංග ලක්ෂණ ලෙස අනුකරණය (නැව තැනීම, නැව දියත් කිරීම, ගෙය සෑදීම ආදිය) නාට්‍යධර්මී ලක්ෂණ සහිත වීම. (ගුරුන්නාන්සේ කවි ගායනය, නර්තනය මගින් රංගනය, රංග භූමිය (කමත) චරිත නිරූපණය

(සියලු ම චරිත පිරිමින් විසින්) වේෂභූෂණ (සරල වෙස් මුහුණු භාවිතය) රංග භාණ්ඩ (පොලු කැල්ලක්, වේදිකාවේ වංගෙඩිය) අභිරූපණ (පැදුරු විවීම, බල්ලා සපා කෑම හා බෙහෙත් කිරීම, දෙහි කැපීම ආදිය) දැක්විය හැකි බව කතාව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

**පියවර 03** සිසුන් කණ්ඩායම් 2 කට බෙදන්න. සම්පූර්ණ පාඩම ආවරණය වන සේ ප්‍රශ්න උත්තර ගොනුවක් සකස් කරන්න. එය සම සේ කණ්ඩායම් දෙකට බෙදා දී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් මගින් තරගයක් පවත්වා ඒ ඒ කණ්ඩායම්වලට ලකුණු ලබාදෙන්න. (ඒ සඳහා උචිත ක්‍රමවේදයක් (නිර්ණායක) යොදා ගන්න).

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- සොකරි නාටකයේ කතාව ඉදිරිපත් කිරීම.
- සොකරි නාට්‍යයේ විශේෂ ලක්ෂණ ප්‍රකාශ කිරීම.
- සොකරි නාට්‍යයේ චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කිරීම.
- සොකරි ප්‍රචලිත ව තිබූ ප්‍රදේශ ප්‍රකාශ කිරීම.
- සොකරි නාට්‍යයේ පරමාර්ථ විස්තර කිරීම.

**පැවරුම** : ''ශ්‍රී ලංකාවේ පැරණි ම ජන නාටකය ලෙස සැලකෙන සොකරි'' මාතෘකාව යටතේ සොකරි නාටකය පිළිබඳ ව පුවත්පතකට / සඟරාවකට ලිපියක් සකස් කරන්න.

**අතිරේක උදව්** : සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල
සොකරි පෙළ
සොකරි හෙවත් ගුරු හටන - එන්. ජේ. කුරේ

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.2** : දේශීය ජන නාට්‍ය කලාව හඳුනාගනියි.

**ක්‍රියාකාරකම 4.2.2** : ''කෝලම් වගතුග විමසමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- කෝලම් යනු කුමක්දැයි හඳුන්වයි.
- කෝලම් උපත් කතාව විස්තර කරයි.
- කෝලම්වල විශේෂ ලක්ෂණ විමසයි.
- කෝලම් රංගභූමියක රූපසටහනක් අඳියි.
- කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ හඳුන්වයි.
- දේශීය ජන නාටක නැරඹීමේ ඇල්මක් දක්වයි.

**ගුණාත්මක යෙදවුම්** :
- කෝලම් දර්ශන ඇතුළත් සංයුක්ත තැටි, ඡායාරූප හා චිත්‍ර සටහන්
- කෝලම් පිටපත් සහ ඒ ඒ චරිත භාවිත කරන ගායනා
- කෝලම් රංගභූමියෙහි රූපසටහනක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01
- ඔබට තිබෙන පහසුකම් අනුව කෝලම් පිළිබඳ දෘශ්‍ය පටයක් / ඡායාරූප හෝ චිත්‍ර සටහන් ආදියෙන් එක් දෙයක් ප්‍රදර්ශනය කොට පාඩමට අවතීර්ණ වන්න. සිසුවකුට කෝලම් චරිතයක් පුහුණු කොට රඟ දැක්වීම කළ හැකි නම් එය වඩාත් සිසුන් ආකර්ෂණය කරගැනීමට හේතු වනු ඇත.
- ඉහතින් දක්වන ලද දර්ශන නැරඹීමෙන් පසු, ඒ දේශීය ජන නාට්‍ය විශේෂයක් වන කෝලම් බව ද, ''කෝලම්'' යන්න වෙස්මුහුණු පැළඳ නැටීම යනුවෙන් අර්ථ ගැන්වෙන බව ද, මෙම ජන නාට්‍ය විශේෂය පහත රට ප්‍රදේශවල ප්‍රචලිත ව තිබූවක් බව ද සඳහන් කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 02 උක්ත දර්ශන අනුසාරයෙන් පහත දැක්වෙන පරිදි කෝලම්වල විශේෂ ලක්ෂණ හඳුනාගැනීම සඳහා සිසුන්ට සහාය වන්න.

- වෙස් මුහුණු බැඳ නැටීම හා සියලු චරිතවලට නිශ්චිත වෙස් මුහුණු තිබීම.
- දේශීය ගැමි ගායනා ඇතුළත් ව තිබීම.
- නර්තනය බහුල ව යොදා ගැනීම හා සියලු චරිතවලට අනන්‍ය වූ නර්තන ශෛලියක් තිබීම.
- හාස්‍යෝත්පාදක පූර්ව රංගයක් හා නාට්‍යමය ගුණයෙන් යුක්ත අපර රංගයක් තිබීම.
- පහත රට ශාන්තිකර්මවල ආභාසය කෝලම්වල ද දක්නට ලැබීම.
- ආංගික, වාචික සහ ආහාර්ය අභිනය උපයෝගී කරගනිමින් හාස්‍යෝත්පාදනය කිරීම.
- සමාජයේ දුබලතා හාස්‍යයට හා තියුණු උපහාසයට ලක් කිරීම.
- විනෝදස්වාදය හෝ පූජාර්ථය පරමාර්ථ කොට කෝලම් රඟ දක්වන්නට ඇතැ යි යන අදහස සාකච්ඡා කිරීම.

කෝලම් උපත් කතාව සිසුන්ට පැහැදිලි කර දෙන්න.

''මහා සම්මත රජුගේ බිසවට නැටුම් සිනා කෙළි දැකීමට උපන් දොළදුක කිසි ම නැටුමකින් සන්තර්පණය කළ නොහැකි වූ බවත්, ඒ පිළිබඳ ව මහත් සේ තැවෙන රජතුමා දැක ශක්‍රදිව්‍ය රාජයා ගේ පඬුපුල් අසුන උණු වූ බවත්, හේතුව වටහා ගත් ශක්‍රයා එක් රාත්‍රියක රජගේ මගුල් උයනේ කෝලම් මුහුණු තබා ගිය බවත්, නළුවන් ඒවා බැඳගෙන නටා බිසවගේ දොළ සංසිඳවූ බවත් මෙහි උපත් කතාවේ සඳහන් වන බව පැහැදිලි කරන්න.

**පියවර 03** ඔබ සකස් කර ගෙන ඇති කෝලම් රංගභූමිය ආශ්‍රය කර ගනිමින් පහත සඳහන් කරුණු හඳුන්වා දෙන්න.

එළිමහන් රංගභූමියක් වූ කෝලම් රංගභූමිය ''තානායම් පොළ'' නමින් ද හැඳින්වේ. එය කවාකාර හැඩයක් ගනියි.




කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

1. තොරතුරු කතා කාරයා, කාරිය කරවන රාල හෙවත් සබේ විදානේ
2. අණබෙර කෝලම
3. හේවා කෝලම
4. පොලිස් කෝලම
5. ආරච්චි රාළ
6. පේඩිරාළ හෙවත් ජස කෝලම හා ලෙන්චිනා
7. මුදලි

(ඇතැම් අවස්ථාවල දී මෙම චරිත සබයට පැමිණෙන අනුපිළිවෙලේ වෙනස්කම් ඇති බව ද පවසන්න)

අපර රංගය : රජු සහ බිසව ගේ සම්ප්‍රාප්තිය
කෝලම් කතාව රඟ දැක්වීම. (මනමේ කතාව, ගෝඨයිම්බර කතාව. සඳකිඳුරු කතාව වැනි කතා)

පාඩම අවසානයේ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා උපදෙස් ලබාදෙන්න.

1. කෝලම් උපත් කතාව විස්තර කරන්න.
2. කෝලම් යන වචනයෙහි අර්ථය දක්වා කෝලම් ප්‍රචලිත වී ඇති ප්‍රදේශ හඳුන්වන්න.
3. කෝලම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවා ද?
4. කෝලම් රංගභූමියක රූප සටහනක් ඇඳ එහි විශේෂ ස්ථාන නම් කොට ඒ ඒ ස්ථානවල වැදගත්කම සඳහන් කරන්න.
5. කෝලම් ඉදිරිපත් කරන අනුපිළිවෙළ දක්වන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- කෝලම් යනු කුමක් දැ යි හඳුනාගැනීම.
- කෝලම් උපත් කතාව ප්‍රකාශ කිරීම.
- කෝලම්වල විශේෂ ලක්ෂණ ඉදිරිපත් කිරීම.

- තානායම් පොළ හා එහි කාර්යයන් නිවැරදි ව සඳහන් කිරීම.
- කෝලම් රංගයක් ඉදිරිපත් කරන ආකාරය අනුපිළිවෙළින් දක්වීම.

**අතිරේක උදව් :** කෝලම් පිටපත්
සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල
කෝලම් නාටක සහ ලංකාවේ වෙස් මුහුණු - ඇම්.එච්. ගුණතිලක
කෝලම් නාටක සාහිත්‍යය - ඇම්.එච්. ගුණතිලක
සිංහල කෝලම් සම්ප්‍රදාය - ගාමිණී දැල බණ්ඩාර

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.3** : නාඩගම් කලාව පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම** : ''මොනව ද මේ නාඩගම්''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- නාඩගම්වල ප්‍රභවය සොයයි.
- ශ්‍රී ලංකාවේ නාඩගම් ප්‍රචලිත ප්‍රදේශ නම් කරයි.
- නාඩගම් රංගභූමිය හෙවත් ''කරළිය'' පිළිබඳ ව විමසයි.
- නාඩගම්වල විශේෂ ලක්ෂණ හඳුන්වයි.
- නාඩගමක් ඉදිරිපත් කැරෙන අනුපිළිවෙළ ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- නාඩගම් පිටපත්
- ජනප්‍රිය නාඩගම් ගීත සහ එම ගීත ඇතුළත් ශ්‍රව්‍ය / දෘශ්‍ය පට, ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01

- සිසුන්ට නාඩගම් ගීතයක් ශ්‍රවණය කිරීමට සලස්වමින් පාඩමට පිවිසෙන්න. (ආලෙ බැන්ද මාගෙ රම්‍යවන් ගීතය හෝ වෙනත් ගීතයක්) මෙය ගුරුවරයා හා ශිෂ්‍යයින් එක්ව ගායනා කිරීමෙන් සිසුන් වඩාත් ප්‍රබෝධමත් වනු ඇත.

  එම ගායනය ඇසුරින් උක්ත ගීතය නාඩගම් ගීතයක් බවත්, ගැමි කලාවක් වශයෙන් සැලකෙන නාඩගම්වල දක්ෂිණ භාරතීය ''තෙරුක්කූත්තු'' හෙවත් වීථි නාට්‍යවල ආභාසය දක්නට ලැබෙන බවත් සිසුන් හා සාකච්ඡා කරන්න. කෝට්ටේ හා මහනුවර රාජධානි යුගවල ඇති වූ ද්‍රවිඩ බලපෑම් හේතුවෙන් ඉන්දියාවේ ගැමි නාට්‍ය විශේෂයක් වූ නාඩගම් ලංකාවේ ද ප්‍රචාරය වූ බවත්, පසුව දේශීය නාට්‍ය විශේෂයක් ලෙස නාඩගම් වර්ධනය වූ බවත් පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාවේ රඟ දැක් වූ ප්‍රථම සිංහල නාඩගම ලෙස සැලකෙන්නේ පිලිප්පුසිඤ්ඤෝ විසින් නිෂ්පාදනය කරන ලද ''ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම'' බවත් එය 1824 දී පමණ වේදිකාගත කළ බවත් පැහැදිලි කරන්න.

  ශ්‍රී ලංකාවේ යාපනය, හලාවත, කොළඹ, වැලිගම, මාතර, තංගල්ල වැනි මුහුදුබඩ ප්‍රදේශවල නාඩගම් ප්‍රචලිත ව පැවති බව පහදාදෙන්න.

පියවර 02

නාඩගම් රඟ දක්වනු ලැබූ රංගභූමිය ''කරළිය'' නමින් හැඳින් වූ බවත් එය පස් පුරවා උස්ව සකස් කරගත් අර්ධ වෘත්තාකාර රංග භූමියක් බවත් කරළිය ආසන්නයේ නේපථ්‍යාගාරය ලෙස භාවිත කළ මඩුවක් ද, කරළිය හා මඩුව අතර කඩතුරාවක් ද තිබූ බවත් පැහැදිලි කරන්න. (රූප සටහන් ආශ්‍රයෙන්)

අංග සම්පූර්ණ නාට්‍ය පිටපතක් තිබීමත්, දෙමළ හා සංස්කෘත වචන මිශ්‍ර කයෝර භාෂාවක් භාවිත කිරීමත් නාඩගම්වල විශේෂ ලක්ෂණ සේ සැලකිය හැකි බව නිදසුන් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

පියවර 03

නාඩගම් රංග ශෛලිය පිළිබඳ ව පහත සඳහන් කරුණු යටතේ සාකච්ඡා කරන්න.

- නාඩගම ඉදිරිපත් කිරීමේ දී පූර්වරංගයේ දී බහුබූතයා (කෝලමා, කෝණංගියා), සෙල්ලම් ළමා, බෙර වයන්නන්, අනාගත වෘක්තෘ සහ

හඬ දූතයන්, පිළිවෙළින් කරළියට පිවිසීම අනතුරුව රජ සභාවේ ඇමතිවරුන් හා රජුගේ සම්ප්‍රාප්තිය සිදුවීම සහ නාඩගමේ කතා පුවත රඟ දැක්වීම.

- දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ රාගතාල අනුව ගීත හා සංගීතය නිර්මාණය වී තිබීම.
- පොතේ ගුරු හා ගායක කණ්ඩායම විසින් නාට්‍යය ඉදිරිපත් කරනු ලැබීම.
- නාඩගම් කතාව දින 3-7 අතර කාලයක් රඟ දැක්වීම.
- ගැහැනු චරිත ද පිරිමින් විසින් නිරූපණය කරනු ලැබීම.
- කිට්සන් පහන් හා පන්දම් ආලෝකය භාවිතා කිරීම.
- වාද්‍ය භාණ්ඩ වශයෙන් හොරණෑව, මද්දලය, කයිතාලම, රවිකිඤ්ඤය ආදිය භාවිත කිරීම.

පහත සඳහන් නාඩගම් හා නාඩගම්කරුවන් පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

ඇහැලේපොල හෙවත් සිංහලේ නාඩගම<br>
සිංහවල්ලී, සාන්ත ජෝෂප්<br>
සුසෙව්, හෙලේනා, විශ්වකර්ම } පිලිප්පු සිඤ්ඤෝ<br>
මාතලන්, සෙනගප්පු, රජතුන් කට්ටුව<br>
සුලඹාවතී, ස්ථාක්කි

බ්‍රම්පෝඩ් නාටකය, බැලසන්ත - වී. ක්‍රිස්තියන් පෙරේරා<br>
මියුරින්, මිලිනා, පරවුර - මෝදර පැලිස් අප්පුහාමි<br>
රංගවල්ලි, මැරිනා, කාංචි - ගල්කිස්සේ හෙන්ද්‍රික් අප්පුහාමි

ඉයුජින්, දඹදෙනි කතාව<br>
ප්‍රෝටියන් සහ වැලන්ටයින් පී. පීරිස්<br>
දිනකර නාඩගම<br>
සෙලෙස්තිනා චාර්ලිස් ද ආබ්‍රෙව්<br>
ලියනෝරා එන්.ඩී. තෝමස් සිල්වා

මෙතෙක් උගත් කරුණු ආශ්‍රය කරගනිමින් පහත සඳහන් වගුව පිරවීම සඳහා සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| නාට්‍ය වර්ගය | |
| රඟපාන ලද ස්ථානය | |
| යොදාගත් සංගීතය | |
| භාවිත කළ වාද්‍ය භාණ්ඩ | |
| මුල් ම සිංහල නාඩගම | |
| මුල් ම සිංහල නාඩගම් රචකයා | |
| ස්ථාවර පාත්‍රයන්ගේ නම් | |
| ප්‍රචලිත වූ ප්‍රදේශ | |
| ප්‍රසිද්ධ නාඩගම්කරුවෝ (කීප දෙනෙක්) | |
| විශේෂ ලක්ෂණ | |
| රංග ශෛලිය (කරුණු 3 ක්) | |

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාඩගම්වල ප්‍රභවය දැන සිටීම.
- නාඩගම් ප්‍රචලිත ප්‍රදේශ නම් කිරීම.
- රංගභූමිය විස්තර කිරීම.
- නාඩගම්වල විශේෂ ලක්ෂණ හා රංග ශෛලිය හඳුනාගැනීම.
- නාඩගම් හා නාඩගම්කරුවන් නම් කිරීම.

**පැවරුම** : නාඩගම් ගීතයක් රංගනය සහිත ව පුහුණු වී ඉදිරිපත් කරන්න.

**අතිරේක උදව්** :

සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව - රෝලන්ඩ් අබේපාල
නාඩගම් පිටපත්
සිංහල නාඩගම් හා දමිළ කුත්තු - ඇම්.එච්. ගුණතිලක

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.4** : නූර්ති කලාවේ විශේෂ ලක්ෂණ විමසයි.

**ක්‍රියාකාරකම** : ''නූර්ති හඳුනාගනිමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- නූර්ති නාට්‍ය සංක්‍රමණික නාට්‍ය කලාවක් ලෙස පැහැදිලි කරයි.
- විශේෂිත නූර්ති නාට්‍යකරුවන් හා ඔවුන් ගේ නිර්මාණ නම් කරයි.
- නූර්ති සඳහා යොදාගත් කතා වස්තුන් වර්ග කරයි.
- නූර්ති රංග ශෛලිය හඳුනාගනියි.
- නූර්ති සංගීතය අගයයි.

**ගුණාත්මක යෙදවුම්** : නූර්ති ගීත ඇතුළත් සංයුක්ත තැටි, ශ්‍රව්‍ය දෘශ්‍ය පට, නූර්ති නාට්‍ය කීපයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ගුරුතුමා හෝ ගුරුතුමිය හෝ දක්ෂ සිසුවකු ලවා නූර්ති ගීතයක් ගායනා කරමින් පාඩමට පිවිසෙන්න. නූර්ති නාට්‍ය පිටපත් හා ශ්‍රව්‍ය/දෘශ්‍ය පට සිසුන්ට ඇසීමට නැරඹීමට අවස්ථාව සලසාදෙන්න.

පියවර 02 1877 බොම්බායේ සිට පැමිණි බලිවලා නම් පාර්සි ජාතිකයා ප්‍රමුඛත්වයෙන් නූර්ති නාට්‍යකලාව මෙරට ප්‍රචලිත වී ඇති බව සාකච්ඡා කරන්න.

පියවර 03 දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට, පෝෂණයට නූර්ති කලාව බලපෑ අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

පියවර 04
- මුල් ම සිංහල නූර්තිය ''රොලීනා'' බවත් මුල්ම සිංහල නූර්ති රචකයා සී. දොන් බස්තියන් වගත් සිසුන්ට පැහැදිලි කරන්න.
- නූර්ති සම්ප්‍රදායයේ ජනප්‍රියම නූර්ති රචකයා ජෝන් ද සිල්වා වන අතර ඔහුගේ නාට්‍ය කෘතීන් අතර රාමායණය, සිරිසඟබෝ, දස්කොන්, දුටුගැමුණු, නලරාජ චරිතය හා ශ්‍රී වික්‍රම ජනප්‍රිය බවත් පෙන්වා දෙන්න.
- චාල්ස් ඩයස් දක්ෂ නූර්ති ශිල්පියෙක් වූ අතර පණ්ඩුකාභය, නාගානන්ද, කුස ජාතකය, පද්මාවතී ආදී ජනප්‍රිය නූර්ති ඔහුගේ කෘතීන් බවත් එම නූර්ති හා බැඳුණු ප්‍රසිද්ධ රඟහල, ''ටවර් හෝල්'' නම් වූ බවත් පැහැදිලි කරන්න.
- නූර්ති සඳහා යොදාගත් කතා වස්තුන් දේශානුරාගය දනවන නාට්‍ය, ඓතිහාසික සිද්ධීන් පාදක කොටගත් කාලීන සමාජ සිද්ධීන් ඇතුළත් නාට්‍ය වශයෙන් වර්ග කළ හැකි බව කෙටි සාකච්ඡාවකින් පැහැදිලි කර දෙන්න.
- ආගමික හා ජාතික වශයෙන් හැඟීම් ඇති කිරීම උදෙසා ලාංකීය ඉතිහාසය සහ ජනප්‍රවාද පාදක කරගනිමින් කරන ලද සිරිසඟබෝ, දුටුගැමුණු ආදී නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.
- නූර්ති රංග ශෛලියේ විශේෂ ලක්ෂණ වශයෙන් රචනා කරන ලද නාට්‍ය පිටපතක් කියවීම, මුදල් අයකර රඟහලක් තුළ පෙන්වන ලද මුල්ම නාට්‍ය නූර්ති වගත්, උත්තර භරතීය සංගීතය යොදා ගැනීම, කාන්තා චරිත කාන්තාවන් විසින් ම රඟපෑම, නාට්‍ය සඳහා විචිත්‍රවත් ලෙස චිත්‍ර වස්ත්‍ර භාවිතා කිරීම, වෙස්මෝස්තර, රංගභූමි අලංකරණ, නාට්‍යෝපකරණ විචිත්‍රවත් ලෙස යොදා ගැනීම ආදී කරුණු සාකච්ඡා කරන්න.

- නූර්ති ගීත දෘශ්‍ය පට ඇසීමට සලස්වා නූර්ති ගීත ගායනයට සහ ගීත රස වින්දනය සඳහා සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නූර්ති හඳුනාගැනීම.
- නූර්ති නාට්‍යකරුවන් හා නූර්ති නාට්‍ය වර්ග කර හඳුනාගැනීම.
- නූර්ති නාට්‍යවල විශේෂ ලක්ෂණ හඳුනාගැනීම.
- නූර්ති නාට්‍ය ගීත ගායනයට හා ඇසීමට කැමැත්තක් දැක්වීම.

**පැවරුම** : නූර්ති නාට්‍ය ගීත පදමාලා එකතු කර පොතක් සකස් කරන්න.

**අතිරේක උදව්** : සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
සිංහල නාට්‍ය වංශය - විජේරත්න පතිරණ
ජෝන් ද සිල්වා හා සිංහල නාට්‍ය - විමල් දිසානායක

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.5.1 :** නූතන නාට්‍යයේ ගමන් මග පිළිබඳ ව විමසයි.

**ක්‍රියාකාරකම** : ''නූතන නාට්‍ය ගමන් මග දකිමු''

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල** :
- නූතන නාට්‍යයේ ගමන් මග සකස් කිරීමට දායක වූ නාට්‍යකරුවන් විමසයි.
- කාලීන සමාජ පසුබිම අනුව විවිධ නාට්‍ය ප්‍රවණතා ඇති වූ බව ප්‍රකාශ කරයි.
- නූතන නාට්‍ය ප්‍රවණතා හඳුන්වයි.
- ඒ ඒ යුගයට අදාළ නාට්‍ය නිර්මාණ නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :
- බ්‍රිස්ටල් බෝඩ්, ප්ලැටිග්නම්
- නාට්‍යවල නම් සඳහන් කළ කාඩ්පත්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** පෙර පාඩමේ දී ඉගෙනගත් අයුරු සිංහල නාට්‍ය කලාවේ නූතන යුගය ඇරඹෙන්නේ නූර්ති නාට්‍ය සම්ප්‍රදාය සමග බව සිසුන් සමග සාකච්ඡා කරමින් පාඩමට පිවිසෙන්න.

පැරණි ගැමි නාට්‍යවල නොතිබුණු, එහෙත් නූතන නාට්‍යවල දක්නට ලැබෙන සීමිත කාලයක් තුළ ප්‍රදර්ශනය කිරීම. ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින් ම රඟපානු ලැබීම, රංගශාලා භාවිතය, පසුතල නිර්මාණ, රංගාලෝකය වැනි ආනුෂංගික අංග එක්වීම වැනි නව නාට්‍ය ප්‍රවණතාවල ආරම්භය නූර්තිය සමග සිදු වූ බව සිහිපත් කරවන්න. පොදු සමාජයේ එසේ සිදුවෙද්දී විශ්ව විද්‍යාලය පාදක කොට ගෙන බිහි වන නාට්‍ය කලාවක් ද තිබූ බව පැහැදිලි කරන්න.

**පියවර 02** නූතන සිංහල නාට්‍ය කලාවේ මුල් ම අවස්ථාව වන්නේ ආදි විශ්ව විද්‍යාලය නාට්‍ය බවත්, එය අදියර දෙකක් (1933-1942 සහ 1943-1952) යටතේ විකාශනය වූ බවත් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. මෙම කාලය තුළ ඉංග්‍රීසි නාට්‍ය මෙන් ම පරිවර්තන හා අනුවර්තන නාට්‍ය මගින් ද සිංහල නාට්‍ය කලාව සංවර්ධන වූ බව පැහැදිලි කරන්න.

ඉන්පසු යුගයේ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පර්යේෂණාත්මක නාට්‍ය සිංහල නාට්‍ය කලාවේ පෝෂණයට බලපෑ ආකාරයත්, හැටේ දශකයේ දී නාට්‍යධර්මී හා ලෝකධර්මී ශෛලියෙන් පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය වූ බවත්, එම නිර්මාණවලට ජනකතා, ඓතිහාසික කරුණු ඇතුළත් කතා, දේශපාලන හා පන්ති ගැටුම් නිරූපිත සිද්ධීන්, ආදී විවිධ තේමාවන් පාදක වී ඇති බවත් පැහැදිලි කරන්න. (අතිරේක උදව් යටතේ මේ පිළිබඳ කරුණු සැකෙවින් දක්වා තිබේ).

**පියවර 03** ආදි විශ්ව විද්‍යාලයීය ඉංග්‍රීසි හා සිංහල නාට්‍ය, මහාචාර්ය සරච්චන්ද්‍ර නාට්‍ය හැට දශකයේ සහ හැත්තෑව දශකයේ නාට්‍යවල නම් වෙන වෙන ම පත්‍රිකාවල ලියා එක් ගොඩකට තබන්න. සිසුන් කණ්ඩායම් හතරකට බෙදා ඒ ඒ කණ්ඩායම ඒ ඒ යුගයට අයත් නාට්‍ය එම ගොඩෙන් වෙන් කොට තෝරා ගන්න සකස් කරගත් පුවරුවක උචිත ක්‍රමයකට එම නම් ඇතුළත් කරන්න. (රැඳවීමෙන්, ඇලවීමෙන් හෝ ලිවීමෙන්)

| | |
|---|---|
| විශ්ව විද්‍යාලයීය නාට්‍ය සංගමයේ ඉංග්‍රීසි නාට්‍ය (ඊ.එෆ්.සී. ලුඩොවයික් නිෂ්පාදන) | 1<br>2<br>3<br>4<br>5 |
| විශ්ව විද්‍යාලීය සිංහල සමිතියේ නාට්‍ය | 1<br>2<br>3<br>4<br>5 |
| සරච්චන්ද්‍ර නාට්‍ය | 1<br>2<br>3<br>4<br>5 |
| 1960 සහ 1970 දශකවල නාට්‍ය | 1<br>2<br>3<br>4<br>5 |

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- ඊ.එෆ්.සී. ලුඩොවයික් ගේ ඉංග්‍රීසි නාට්‍ය හැඳින්වීම.
- නූතන නාට්‍යයේ ගමන්මග සකස් කිරීමට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගැනීම.
- කාලීන සමාජ පසුබිම අනුව විවිධ නාට්‍ය ප්‍රවණතා ඇති වූ බව ප්‍රකාශ කිරීම.
- නූතන නාට්‍ය ප්‍රවණතා හැඳින්වීම.
- ඒ ඒ යුගයට අදාළ නාට්‍ය නිර්මාණ නම් කිරීම.

**පැවරුම** : උක්ත පාඩම ආශ්‍රිත ව ප්‍රශ්නෝත්තර සංග්‍රහයක් සකස් කරන්න.

**අතිරේක උදව්** : විශ්ව විද්‍යාලයීය නාට්‍ය වංශය - තිස්ස කාරියවසම්
සිංහල නාට්‍ය වංශය - විජේරත්න පතිරාජ

**විශ්ව විද්‍යාල ඉංග්‍රීසි නාට්‍ය කීපයක් (ඊ.එෆ්.සී. ලුඩොවයික් නිෂ්පාදන)**

| | | |
|---|---|---|
| 1933 | Where Women Rule | ක්වින්ටෙරෝ සහෝදරයෝ |
| 1934 | The Rivals | ෂෙරිඩන් |
| 1935 | Imaginary Invalid | මෝලියර් |
| 1936 | The Ladies from Alfaqueque | ක්වින්ටරෝ සහෝදරයෝ |
| 1937 | The Servant of Two Masters | කාලෝ ගොල්ඩොනි |
| 1938 | Arms and the Man | බර්නාඩ් ෂෝ |
| 1939 | The Red Maned steed | Hsiung චීන නාට්‍යකරු |
| 1940 | The Merry Wives of Windsor | ශේක්ස්පියර් |
| 1941 | Peace and Quiet | ක්වින්ටෙරෝ සහෝදරයෝ |
| 1942 | Marco Millions | යුජීන් ඔනිල් |
| 1943 | The Simpleton of the Unexpected Isles | බර්නාඩ් ෂෝ |
| 1945 | Right you are (If you think so) | ලුයිජි පිරැන්ඩෙලෝ |

**විශ්වවිද්‍යාලයේ සිංහල සමිතිය මගින් රඟ දක්වූ නාට්‍ය**

1936 ඉබේ වෙදා (මෝලියර්) ආචාර්ය මලලසේකර
1939 යන්තම් ගැලවුනා ආචාර්ය මලලසේකර
1941 පුදුම බේරිල්ල එල්. යූ. ජයසිංහ
1943 මුදලාලිගේ පෙරළිය (මෝලියර්) ඊ.ආර්. සරච්චන්ද්‍ර, ඒ. පී. ගුණරත්න
1945 කපුවා කපෝති නිකොලායි ගොගොල්
1949-50 හැංගි හොරා (ඔස්කා වයිල්ඩ්) සරච්චන්ද්‍ර
1951 මගුල් ප්‍රස්තාව අන්තන් චෙකොව්
1951 වලහා අන්තන් චෙකොව්
1951 බහින කලාව හෙවත් සංස්කෘතික කොමසාරිස්
1953 වෙද හටන මෝලියර්
1954 රහස් කොමසාරිස් නිකොලායි ගොගොල්
1955 වඳින්න ගිය දේවාලේ මහාචාර්ය සරච්චන්ද්‍ර

**මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය කීපයක්**

1956 මනමේ
1958 රත්තරං
1958 කදා වළලු
1959 එලොව ගිහින් මෙලොව ආවා
1960 වෙල්ලවැහුම්
1961 සිංහබාහු
1960 හස්තිකාන්ත මන්තරේ
1961 ඒකට මට හිනා හිනා
1967 මහාසාර
1969 පේමතෝ ජායතී සෝකෝ
1988 භව කඩතුරාව

**1960 සහ 1970 දශකයේ නිෂ්පාදනය වූ ප්‍රසිද්ධ නාට්‍ය කීපයක්**

බෝඩිංකාරයෝ - සුගතපාල ද සිල්වා
හරිම බඩුහයක් - සුගතපාල ද සිල්වා
ජනේලය - හෙන්රි ජයසේන
හුණුවටයේ කතාව - හෙන්රි ජයසේන
නරිබෑණා - දයානන්ද ගුණවර්ධන
බෙරහඬ - බන්ධුල ජයවර්ධන
සුබ සහ යස - සයිමන් නවගත්තේගම
දූන්න දූනු ගමුවේ - සුගතපාල ද සිල්වා
කැළණි පාලම - ආර්. ආර්. සමරකෝන්

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.5.2** : නාට්‍ය වර්ග පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍ය වර්ග හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- පරිවර්තන යනු කුමක් ද යි ප්‍රකාශ කරයි.
- අනුවර්තන හඳුන්වයි.
- ස්වතන්ත්‍ර නාට්‍ය විස්තර කරයි.
- පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය නම් කරයි.
- එම නාට්‍යවල සුවිශේෂතා විමසයි.

**ගුණාත්මක යෙදවුම්** :
- පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය පෙළ කීපයක්
- එම වර්ගවලට අයත් නාට්‍යවල ජවනිකා ඇතුළත් සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය දර්ශන නැරඹීමට සැලැස්වීම හෝ එම නාට්‍ය පෙළ හඳුන්වා දීම හෝ මගින් පාඩමට පිවිසෙන්න.

කිසියම් නාට්‍ය කෘතියක කතා වස්තුව, මුඛ්‍යාර්ථය, චරිත, ස්ථාන නාම ආදිය වෙනස් නොකොට භාෂාව පමණක් වෙනත් භාෂාකවට පෙරළීම ''පරිවර්තනයක්'' බවත්,

මුල් කෘතියේ එන චරිත හා ස්ථාන නාම වෙනස් කරමින්, මූලික සිද්ධිය උකහා ගෙන පරිසරයට ගැළපෙන ආකාරයෙන් සකස් කරනු ලබන කෘතිය ''අනුවර්තනයක්'' බවත්,

තමන් විසින් ම නිර්මාණය කරගනු ලබන ඓතිහාසික, සාහිත්‍ය හෝ ජනවේදයේ එන කතාවක් හෝ සමාජ සංසිද්ධියක් තේමා කොටගත් නිර්මාණය ''ස්වතන්ත්‍ර'' කෘතියක් ලෙස හඳුන්වන බවත් සිසුන්ට පැහැදිලි කර දෙන්න.

පියවර 02 පරිවර්තන නාට්‍ය කෘතියක් සෑම අතින් ම (සංගීතය, ආලෝකකරණය, වේෂභූෂණ, ආනුෂංගික කලා) මුල් කෘතියට සමාන විය යුතු බවත්, ජාත්‍යන්තර වශයෙන් උසස් ගණයේ නාට්‍ය අපට නැරඹිය හැකි ආකාරයට මුල් භාෂාවෙන් හෝ වෙනත් පරිවර්තිත භාෂාවකින් සිංහලයට නැඟීමේ දී මුල් කෘතියට හානියක් නොවන පරිදි පරිවර්තනය කිරීම වැදගත් බවත් පැහැදිලි කරන්න.

උසස් ගණයේ ස්වතන්ත්‍ර නාට්‍යවල අඩුවක් පැවති යුගයේ අනුවර්තනවලින් එම කාර්යය සෑහෙන දුරකට පිරිමැසුණු ආකාරයත්, විදේශීය නාට්‍ය සිංහල ප්‍රේක්ෂකයාට රස විඳීමට පහසුවීම සඳහා අනුවර්තනවලින් ඉටු වූ කාර්යභාරයක් සිසුන් සමග සාකච්ඡා කරන්න. මහාචාර්ය ඊ.එෆ්.සී. ලුඩොවයික්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, ධම්ම ජාගොඩ, රංජිත් ධර්මකීර්ති වැනි අය සාර්ථක අනුවර්තන ඉදිරිපත් කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.

තමා විසින් ම කරනු ලබන නිර්මාණ ''ස්වතන්ත්‍ර නාට්‍ය'' නම් වන බවත් බොහෝ විට එයින් සමකාලීන සමාජය පිළිබිඹු වන බවත් ටීටර් නාට්‍ය රචකයන් වන සිරිසේන විමලවීර මිනර්වා නාට්‍ය ඉදිරිපත් කළ බී.ඒ.ඩබ්ලිව්.

ජයමාන්න යන අය මෙන් ම, එදිරිවීර සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, සයිමන් නවගත්තේගම, දයානන්ද ගුණවර්ධන, ආර්.ආර්. සමරකෝන්, කේ.බී. හේරත්, බන්ධුල ජයවර්ධන ආදී ස්වතන්ත්‍ර නාට්‍යකරුවන් රාශියක් සිටින බවත් පැහැදිලි වන අයුරින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 03 එක් කණ්ඩායමකට සිසුන් පහක් පමණ වන සේ පන්තියේ සිසුන් කණ්ඩායම්වලට බෙදන්න.

4.5.2.1 යටතේ දී ඇති,

(i) ප්‍රහේළිකාව
(ii) උපකාරක පද
(iii) පරිවර්තන නාට්‍ය
(iv) අනුවර්තන සහ නාට්‍ය
(v) ස්වතන්ත්‍ර නාට්‍ය

සඳහන් පත්‍රිකා ගොනුව බැගින් ඒ ඒ කණ්ඩායම්වලට ලබා දී ප්‍රහේළිකාව පිරවීමට අවස්ථාව ලබා දෙන්න. සපයන ලද විස්තර පත්‍රිකා ආශ්‍රයෙන් සියලු පිළිතුරු සැපැයීමට හැකි බව සිසුන්ට පහදා දෙමින් ඔවුන් උක්ත කාර්යය සඳහා යොමු කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පරිවර්තන, අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය හඳුනාගැනීම.
- පරිවර්තන හා අනුවර්තන නාට්‍යවල මුල් කෘති හා මුල් රචකයන් හැඳින්වීම.
- එම කෘතිවල පරිවර්තකයන් හා පරිවර්තිත කෘති නම් කිරීම.
- ස්වතන්ත්‍ර නාට්‍ය හා නාට්‍යකරුවන් හඳුනාගැනීම.
- අනුවර්තන, පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය එකිනෙකට වෙනස් වන්නේ කෙසේ දැ යි විස්තර කිරීම.

පැවරුම : කණ්ඩායම් ක්‍රියාකාරකමේ දී සිසුන් වෙත ලබා දී ඇති විස්තර පත්‍රිකාව ද උපයෝගී කර ගනිමින්

1. පරිවර්තන නාට්‍ය
2. අනුවර්තන නාට්‍ය
3. ස්වතන්ත්‍ර නාට්‍ය යන මාතෘකා යටතේ සවිස්තර සටහන් සකස් කරන්න.

4.5.2.1 (1)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ප | | 2 ව | | | 3 | | | 4 | | | | | 5 | | 6 ෂෙ |
| | | | | | රි | | 7 කු | | | 8 ගො | | | න | | |
| | | | | | | | | | 9 | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | 10 | | | | 11 | | 12 ඉ | | | | | ඉ |
| 13 භ | | | | න් | | | 14 | න | | | | | | | |
| | | ගෙ | | | | | | 15 | | ට | | | | | |
| 16 | ඹ | | | ල් | | | | | | | | 17 ග | | | |
| | | | | | | | 18 | රි | | 19 | ට් | | | | |
| | | | | | | | ං | | | | | | | | 20 |
| 21 ක | | | | 22 | | | | | 23 | | 24 | | 25 රේ | | |
| | | | | | | | | | | 26 | ර් | | | | සි |
| | | 27 ඹ | | ජ | | | 28 | | | | | | 29 | ම | |
| | | | | 30 | | මැ | | | න් | | | | | | |
| 31 සු | | | | | | | | | | 32 | තේ | | | | 33 |
| | | | 34 | | දි | | | | | | | | | | |
| | | | | | | 35 | | 36 | | භ | | | | | රා |
| හ | | 37 පු | | ලෝ | | | | | | | | | | | |
| | | | | | | | | 38 | | | | | 39 | | |
| | | | 40 | | | ත් | | ග | | | | 41 ය | | | යා |

**උපකාරක පද :**

**හරහට**

01. කිසියම් නාට්‍ය කෘතියක කතා වස්තුව, චරිත, ස්ථාන නාම ආදිය වෙනස් නොකොට භාෂාව පමණක් වෙනත් බසකට පෙරළීම මෙසේ හඳුන්වයි.
04. රංජිත් ධර්මකීර්ති විසින් නිෂ්පාදනය කරන ලද ස්වතන්ත්‍ර නාට්‍යයකි.
08. සැමුවෙල් බෙකට්ගේ Waiting for Godot ජේ.ඒ. සෙල්වදොරේ විසින් සිංහලට පරිවර්තනය කළේ මේ නමිනි.
09. ජනප්‍රිය විදේශීය නාට්‍යකරුවකු වන මොහු බර්නාඩ් ................................ නම් වේ.
12. බන්ධුල ජයවර්ධනයන් 'බෙරහඬ' නමින් අනුවර්තනය කරනු ලැබුවේ සොෆොක්ලීස්ගේ මෙම නාට්‍යයයි.
13. මෙම මන්තරේ සරච්චන්ද්‍ර සූරීන්ගේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.
14. බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නගේ නාට්‍ය කණ්ඩායම මෙම නමින් හැඳින්වේ.
15. මෙම ආරක්ෂකයා ද මිනර්වා කණ්ඩායමේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.
16. ප්ලෝටස්ගේ ''රූඩන්ස්'' බන්ධුල ජයවර්ධන සිංහලට පරිවර්තනය කළේ මෙම නමිනි.
17. මෙම පුවත දයානන්ද ගුණවර්ධනගේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.
18. කේ.බී. හේරත්ගේ ප්‍රකට ස්වතන්ත්‍ර නිර්මාණයකි.
21. සේරිවාණිජ කතාව තේමා කොටගත් ස්වතන්ත්‍ර නාට්‍යයකි.
23. සිරිසේන විමලවීරගේ නාට්‍යයකි.

25. Run for your wife මොහුගේ කෘතියකි.

26. රංජිත් ධර්මකීර්ති ''හිරු නැති ලොව'' නමින් සිංහලට පරිවර්තනය කළේ මොහුගේ The Lower Depths නම් කෘතියයි.

29. Run for your wife අනුවර්තනය කරනු ලැබුවේ ''..................... ගිනි ගනී'' කියා ය.

30. ස්වතන්ත්‍ර නාට්‍යයක් වූ චන්ද්‍රසේන දසනායකගේ ''රන්කඳ'' නාට්‍යයට බර්නාඩ් ෂෝ ගේ මෙම කෘතිය ද ආශ්‍රය කොට ගැනුණි.

32. හෙන්රි ජයසේනගේ ස්වතන්ත්‍ර නිර්මාණයකි.

34. ''................................ විසාල'' සුගතපාල ද සිල්වාගේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.

36. ''ඉක් නෙව්ටාඉ'' හි සිංහල අනුවර්තනයයි.

37. නවගත්තේගමගේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.

40. ස්ත්‍රිය, පුස්ලෝඩං සුබ සහ යස මොහුගේ කෘතීන් ය.

41. ''ඔතෙලෝ හෙවත් වැනීසියේ .......................'' ශේක්ස්පියර්ගේ ''Othello - The Moor of Venice'' කෘතියේ පරිවර්තනයයි.

**පහළට**

01. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ කෘතියකි.

02. ප්‍රේමරංජිත් තිලකරත්න ගේ ස්වතන්ත්‍ර නාට්‍යයකි.

03. දයානන්ද ගුණවර්ධන විසින් නිෂ්පාදනය කරන ලද ඉතා ජනප්‍රිය නාට්‍යයකි.

05. චුල්ල ධනුර්ධර ජාතකය තේමා කොට ගෙන නිෂ්පාදිත ජනප්‍රියම ස්වතන්ත්‍ර නාට්‍යයකි.

06. බෝනික්කි ගෙදර නමින් සිංහලට පරිවර්තනය වූ Doll's House මොහුගේ කෘතියකි.

07. හෙන්රි ජයසේනයන් ගේ ජනප්‍රිය ස්වතන්ත්‍ර නාට්‍යයකි.

10. ධවල භීෂණ නාට්‍යයේ මුල් කෘතිය වන Men Without Shadows කෘතිය මොහු විසින් ලියන ලද්දකි. (සාත්‍රෙ අග නම වේ)

11. කේ. බී. හේරත්ගේ ඓතිහාසික කතාවක් තේමා කොටගත් ස්වතන්ත්‍ර නාට්‍යයකි.

16. නිකොලායි ගොගොල්ගේ The Marriage කෘතියේ අනුවර්තනය යි.

18. එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්ගේ පිය සෙනෙහස කුළුගන්වන ස්වතන්ත්‍ර නාට්‍යයේ පුතාගේ චරිතය මෙම ''බාහු'' නම් වේ.

19. ජයලත් මනෝරත්නගේ ජනප්‍රිය ස්වතන්ත්‍ර නිර්මාණය ........................... මල පිපිලා ය.

20. බන්දුල විතානගේ සිංහලට පරිවර්තනය කළ The Merchant of Venice නාට්‍යයට පාදක වූ නගරය

22. සුගතපාල ද සිල්වා ''හරිම බඩු හයක්'' නමින් අනුවර්තනය කළේ මොහුගේ Six Characters in Search of an Author කෘතියයි.

24. ෆෙඩ්රිකෝ ගර්ෂියා ලෝර්කාගේ මෙම කෘතිය මෙම නමින් ම එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන් හා සුනිල් ආරියරත්න සූරීන් විසින් පරිවර්තනය කෙරිණි. ගුණසේන ගලප්පත්ති මූදුපුත්තු නමින් අනුවර්තනය කළේ ද මෙම කෘතියයි.

27. කේ.ජී. කරුණාතිලක පරිවර්තනය කළ ශේක්ස්පියර්ගේ නාට්‍යයකි.

28. ශේක්ස්පියර්ගේ නමට මෙම කොටස ද ඇතුළත් ය.

31. සයිමන් නවගත්තේගම ගේ දේශපාලනමය තේමාවක් රැගත් ස්වතන්ත්‍ර නාට්‍යයකි.

32. සුනන්ද මහේන්ද්‍රයන් විසින් හෙන්රික් ඉබ්සන්ගේ කෘතියක් මෙනමින් පරිවර්තනය කරන ලදී.

33. එව්ගිනි ෂ්වාත්ස්ගේ The Dragon සිරිල් සී. පෙරේරා සිංහලට පරිවර්තනය කළේ මෙම නමිනි.

35. 'මෝදර මෝල' ස්වතන්ත්‍ර නාට්‍යයේ නිර්මාතෘවරයා .......................... ධර්මකීර්ති ය.

38. කේ.බී. හේරත්ගේ ''...................... ගුරුලා'' ස්වතන්ත්‍ර නාට්‍යයකි.

39. සරච්චන්ද්‍ර සූරීන් ගේ ස්වතන්ත්‍ර නාට්‍යයක් වූ මෙය ''....................... කඩතුරා'' නම් වේ.

4.5.2.1 (III)

**පරිවර්තන නාට්‍ය කීපයක්**

| මුල් කෘතිය | රචකයා | පරිවර්තිත නම | පරිවර්තකයා |
|---|---|---|---|
| කොකේසියන් චෝක් - සර්කල් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| වේටිං ෆෝ ගොඩෝ | සැමුවෙල් බෙකට් | ගොඩෝ එනකං | ජේ.ඒ. සෙල්වදොරේ |
| කැට් ඔන් ද හොට් ටින් රූෆ් | ටෙනසි විලියම්ස් | හෙලේ නැග්ග ඩෝං පුතා | සුගතපාල ද සිල්වා |
| ලේඩි ෆ්‍රොම් ද සී | හෙන්රික් ඉබ්සන් | සයුරෙන් ආ ළඳ | සුනන්ද මහේන්ද්‍ර |
| ද පබ්ලික් එනිමි | හෙන්රික් ඉබ්සන් | ජනහතුරා | සුනන්ද මහේන්ද්‍ර |
| ද ලෝවර් ඩෙප්ත්ස් | මැක්සිම් ගෝර්කි | හිරු නැති ලොව | රංජිත් ධර්මකීර්ති |
| මර්චන්ට් ඔෆ් වෙනිස් | විලියම් ශේක්ස්පියර් | වැනීසියේ වෙළෙන්දා | බන්දුල විතානගේ |
| ද ත්‍රි පෙනි ඔපෙරා | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | පැන්ස තුනේ කතාව | විජිත ගුණරත්න |
| ද ඩ්‍රැගන් | එව්ගිනි ෂ්වාත්ස් | මකරාක්ෂයා | සිරිල් සී. පෙරේරා |
| දි එල්ඩර් සන් | ඇලෙක්සැන්ඩර් - වම්පිලෝව් | පුත්‍ර සමාගම | ප්‍රසන්න විතානගේ |
| ඊඩිපස් රෙක්ස් | සොෆොක්ලීස් | ඊඩිපස් රජ | ආරියවංශ රණවීර |
| ඇන්ටිගනී | සොෆොක්ලීස් | ඇන්ටිගනී | ආරියවංශ රණවීර |
| රත්නාවලී නාටිකා | ශ්‍රී හර්ෂ | රත්නාවලී | පියදාස නිශ්ශංක |
| රූඩන්ස් | ප්ලෝටස් | කඹය | බන්ධුල ජයවර්ධන |
| ද ෆාදර් | ඔගස්ට් ස්ට්‍රින්ඩ්බර්ග් | පීතෘ | ප්‍රේමරංජිත් තිලකරත්න |
| ඩෝල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් | බෝනික්කි ගෙදර | සුනිල් විජේසිරිවර්ධන |
| චෙරි ඕර්චාර්ඩ් | ඇන්ටන් චෙකොව් | චෙරිවත්ත | මැන්දිස් රෝහණධීර |
| ඇපල් කාර්ට් | බර්නාඩ් ෂෝ | ඇපල් කරත්තය | පියදාස නිශ්ශංක |

4.5.2.1 (IV)

**අනුවර්තන නාට්‍ය**

| මුල් කෘතිය | රචකයා | අනුවර්තන කෘතිය | අනුවර්තක |
|---|---|---|---|
| සික්ස් කැරැක්ටර්ස් ඉන් සර්ච් ඔෆ් ඇන් ඕතර් | ලුයිජි පිරැන්ඩෙලෝ | හරිම බඩු හයක් | සුගතපාල ද සිල්වා |
| ද ප්‍රොපෝසල් | ඇන්ටන් චෙකොව් | මගුල් ප්‍රස්තාව | යූ.ඒ. ගුණසේකර |
| එව්රිමන් (ජර්මන්-ජෙඩර්මෑන්) | හියුගෝ ෆොන් හොෆ් මන්ස්තාල් | සකල ජන | බන්ධුල ජයවර්ධන |
| ද මැරේජ් | නිකොලායි ගොගොල් | කපුවා කපෝති | ඊ.ආර්. සරච්චන්ද්‍ර<br>ඩී.ජේ. විජයරත්න<br>ඒ.පී. ගුණරත්න |
| රන් ෆෝර් යුවර් වයිෆ් | රේ කුනී | රෝමය ගිනි ගනී | බන්ධුල විතානගේ |
| යෙර්මා | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හිත හොඳ අම්මණ්ඩි | සුගතපාල ද සිල්වා |
| අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් | ටෙනසී විලියම්ස් | වෙස්මුහුණු | ධම්ම ජාගොඩ |
| ඉක් නෙව්ටාඉ | සොෆොක්ලීස් | බෙරහඬ | බන්ධුල ජයවර්ධන |
| ද ග්ලාස් මෙනාජරි | ටෙනසි විලියම්ස් | අහස් මාලිගා | හෙන්රි ජයසේන |
| ද චෙරි ඕර්චාර්ඩ් | අන්තන් චෙකොව් | මහගෙදර | රංජිත් ධර්මකීර්ති |
| ද රෙස්පෙක්ටබල් ප්‍රොස්ටිටියුට් | ෂෝන් පෝල් සාත්‍රෙ | සුබ සැන්දෑවක් | ඩග්ලස් සිරිවර්ධන |

4.5.2.1 (V)

**ස්වතන්ත්‍ර නාට්‍ය**

ස්වතන්ත්‍ර නාට්‍ය යනු නාට්‍යකරුවකු විසින් තමාගේ අත්දැකීම් උපයෝගී කර ගනිමින් බාහිර කෘති අනුකරණයෙන් තොර ව රචනා කරනු ලබන නාට්‍ය යි. පහත දැක්වෙන්නේ එබඳු ස්වතන්ත්‍ර නාට්‍ය කීපයකි.

ඓතිහාසික කතා හා බෞද්ධ කතා බෙහෙවින් අන්තර්ගත වූ නූර්තිවලින් සමකාලීන සමාජය පිළිබිඹු නො විණි. මෙම ඌනතාව සපුරාලීම සඳහා 'ටීටර්' නාට්‍ය බිහිවිය. එහි පුරෝගාමීන් වූයේ සිරිසේන විමලවීර හා බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න යි. ඔවුන් ගේ කෘති බොහෝ විට නිර්මාණය වූයේ ස්වතන්ත්‍ර නාට්‍ය වශයෙනි.

1925-1947 අතර කාලය ටීටර් යුගය ලෙස සැලකේ.

| | |
|---|---|
| සිරිසේන විමලවීරගේ නාට්‍ය | මායාදුන්නේ, මග්ගොම චාලි, සිංහල වීරයා, ලංකා යක්ෂණී, රොඩී කෙල්ල, රොඩී කොල්ලා, ශ්‍රී, විධුර, අම්මා, පිටිසර කෙල්ල, සීදේවි |
| මිනර්වා නාට්‍ය හෙවත් බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නගේ නාට්‍ය | කඩවුණු පොරොන්දුව, පෙරළෙන ඉරණම, වැරදුණු කුරුමානම, සැඟවුණු පිළිතුර, උමතු විශ්වාසය, කපටි ආරක්ෂකයා, හදිසි විනිශ්චය, අයිරාංගනී, වනලිය, සීතල නදිය, කවට අන්දරේ |
| මහචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර | බහින කලාව, පබාවතී, මනමේ, කදාවළලු, රත්තරං, හස්තිකාන්ත මන්තරේ, සිංහබාහු, එලොව ගිහිං මෙලොව ආවා, මහාසාර, වෙල්ල වැහුම්, ඒකට මට හිනා හිනා, පේමතෝ ජායතී සෝකෝ, ලෝමහංස |
| හෙන්රි ජයසේන | ජනේලය, කුවේණි, අපට පුතේ මගක් නැතේ |
| දයානන්ද ගුණවර්ධන | නරිබෑනා, ගජමන්පුවත, ආනන්ද ජවනිකා, මධුර ජවනිකා |
| සුගතපාල ද සිල්වා | බෝඩිංකාරයෝ, තට්ටු ගෙවල්, සත සහ සත, දුන්න දූනු ගමුවේ, නන්දි විසාල |
| ආර්.ආර්. සමරකෝන් | අහසින් වැටුණු මිනිස්සු, ජේලර් උන්නැහේ, කැළණි පාලම, කපුටුබෝ |

බර්නාඩ් ෂෝගේ ''පිග්මැලියන්'' හා ඇලන් ජේ. ලර්නර්ගේ ''මයි ෆෙයා ලේඩි ආශ්‍රය කරගනිමින් ස්වතන්ත්‍ර නාට්‍යයක් ලෙස රඟදැක්වූවකි.

| | |
|---|---|
| චන්ද්‍රසේන දසනායක ගේ | රන් කඳ (මයි ෆෙයා ලේඩි නාට්‍ය අනුවර්තනයකි.) |
| සයිමන් නවගත්තේගම | ස්ත්‍රිය, පුස්ලෝඩං, සුබ සහ යස |
| කේ.බී. හේරත් | සුදු කරල්, සිරිබෝ තට්ටුව, මායාදේවී, නාග ගුරුළා, දෝන කතිරිනා, දෙවැනි මහින්ද |
| ප්‍රේමරංජිත් තිලකරත්න | වහලක් නැති ගෙයක් |
| බන්දුල ජයවර්ධන | සෝෂක වස්තුව, දියසේන නොපැමිණීම, ස්වර්ණමාලි |
| රංජිත් ධර්මකීර්ති | මෝදර මෝල, මේඝ, අංගාරා ගඟ ගලා බසී. (රුසියානු ජාතික ඇලෙක්සි අර්බුසොප් ගේ ''ඉර්කුට්ස් ස්ටෝරි'' නම් නාට්‍යයේ පරිවර්තනයකි). |

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.6** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් හඳුනා ගනියි.

**ක්‍රියාකාරකම** : නාට්‍යකරුවන් හඳුනාගනිමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :
- ජයලත් මනෝරත්න, ආර්.ආර්. සමරකෝන් සහ ගාමිණී හත්තොටුවේගම යන නාට්‍යකරුවන් හඳුනාගනියි.
- එම නාට්‍යකරුවන් විවිධ කලා අංශයන්හි දක්වන ප්‍රවීණත්වය විමසයි.
- ඔවුන්ගේ නාට්‍ය නිර්මාණ නම් කරයි.
- ඔවුන්ගේ නාට්‍ය දෘෂ්ටිය පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- ඔවුන් විසින් නාට්‍ය කලාව අරභයා කරන ලද සේවය පසසයි.

**ගුණාත්මක යෙදවුම්** : ජයලත් මනෝරත්න, ආර්.ආර්. සමරකෝන්, ගාමිණී හත්තොට්ටුවේගම යන නාට්‍ය ශිල්පීන්ගේ ඡායාරූප, ඔවුන්ගේ නාට්‍ය නිර්මාණ පිටපත්, ඔවුන් පිළිබඳ ව ලියැවුණු පත්තර සඟරා ආදිය (ඔවුන්ගේ නිර්මාණවල කොටස් එක්කොට සාදා ගන්නා ලද සංයුක්ත තැටියක් භාවිත කළ හැකි නම් ඉතා වැදගත් ය.) නාට්‍ය ගීත.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ඉහත ගුණාත්මක යෙදවුම්වල සඳහන් කොට ඇති දාශ්‍යාධාර භාවිත කරමින් ජයලත් මනෝරත්න, ආර්.ආර්. සමරකෝන් සහ ගාමිණී හත්තොට්ටුවේගම යන නාට්‍යකරුවන් නාමික වශයෙන් හඳුන්වා දෙමින් පාඩමට අවතීර්ණ වන්න.

පියවර 02 උක්ත නාට්‍යකරුවන් තිදෙනාගේ නිර්මාණ පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. එම සාකච්ඡාවේ දී ඔවුන් ගේ නාට්‍ය දෘෂ්ටිය හා නාට්‍ය කලාවේ ප්‍රගමනය උදෙසා ඔවුන් ගේ සුවිශේෂ දායකත්වය පිළිබඳ ව කරුණු ඉස්මතු වන ආකාරයෙන් සාකච්ඡාව මෙහෙයවන්න.

(1) ''ලෙඩක් නැති ලෙඩෙක්'' නාට්‍යය නිෂ්පාදනය කරමින් නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වන ආර්.ආර්. සමරකෝන් ලෝකධර්මී සාම්ප්‍රදාය ප්‍රධාන වශයෙන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ සුවිශේෂ නාට්‍යකරුවකු බවත්, පීඩිත පන්තියේ දූවෙන ප්‍රශ්න වේදිකාවට ගෙන ආ මොහු සංගීතය නාට්‍යයට අත්‍යවශ්‍ය ම අංගයක් නොකරගත් බවත්, දේශපාලනයේ ස්වභාවය මොහුගේ නාට්‍යවලින් ප්‍රශ්න කෙරෙන බවත්, සමාජ විමර්ශන කාර්යයේ දී ඔහුගේ තියුණු සංවාද භාවිතය විශේෂයෙන් වැදගත් වන බවත් පෙන්වා දී ඔහුගේ නිර්මාණ සිසුන්ට හඳුන්වා දෙන්න.

(2) ජයලත් මනෝරත්න යනු දේශීය නාට්‍ය කලාවට සුවිසල් මෙහෙවරක් කළ සම්මානලාභී නාට්‍යවේදියකු බවත්, නාට්‍ය රචකයකු, නිෂ්පාදකයකු මෙන් ම රංගන ශිල්පියකු වශයෙන් ද සුවිශේෂ දස්කම් දක්වන මොහු හොඳම නළුවා සම්මානයෙන් කිහිප වරක් ම පිදුම් ලබා ඇති බවත්, විවිධ අත්හදා බැලීම් මගින් නාට්‍ය කලාවේ නව මගක් සොයා ගිය මනෝරත්නයන් සංස්කෘතික දෙදරීම හා සෝදා පාළුව ගැන මෙන් ම එකිනෙකට වෙනස් වූ ලක්ෂණ සහිත විවිධ තේමාවන් යටතේ නාට්‍යකරණයෙහි නියැළුණු බවත්, පැහැදිලි කරමින් ඔහු ගේ නාට්‍ය නිර්මාණ සිසුන්ට හඳුන්වා දෙන්න.

(3) ශ්‍රී ලංකාවේ වීදි නාට්‍යයේ පුරෝගාමියා වශයෙන් සැලකෙන ගාමිණී හත්තොට්ටුවේගම වීදි නාට්‍ය මෙන් ම ඉංග්‍රීසි නාට්‍ය ද නිෂ්පාදනය කර ඇති බවත්, 1970 දශකයේ මුල් අවධියේ දී ශ්‍රී ලංකාවේ නිශ්චිත වශයෙන් වීදි නාට්‍ය හමු වන අතර, 1974 පොසොන් පෝදා අනුරාධපුර දුම්රිය වේදිකාවේ දී මෙම නාට්‍යකරුවා ඇතුළු කණ්ඩායම ඉදිරිපත් කළ වීදි නාට්‍යය මෙරට නාට්‍ය ක්ෂේත්‍රයට නව අත්දැකීමක් වූ ආකාරයත්, පර්යේෂණාත්මක නාට්‍ය නිෂ්පාදකයකු වූ මොහු නව රංග ආකෘතියක් ගොඩ නැගීමට දායක වූ ආකාරයත්, මොහුගේ ''විවෘත වීදි නාට්‍ය කණ්ඩායම'' විසින් අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස මෙන් ම ජනතාවාදී නාට්‍ය කලාවක් ලෙස වීදි නාට්‍ය භාවිත කෙරුණු ආකාරයත්, දේශපාලනික, සමාජීය හා ආර්ථික අංශ මෙමගින් තියුණු විවේචනයට හාස්‍යයට හා උපහාසයට ලක් කෙරුණු ආකාරයත් නිදසුන් සහිත ව සාකච්ඡා කරමින් ඔහුගේ නිර්මාණ සිසුන්ට හඳුන්වාදෙන්න.

**පියවර 03** ඉහත දක්වා ඇති කරුණු උපයෝගී කරගනිමින් සම්පූර්ණ පාඩම ආවරණය වන සේ ප්‍රශ්න සහ පිළිතුරු ගොඩ නගන්න. (අතිරේක උදව් අංක 01 යටතේ නිදසුන් සපයා ඇත.) ඒවා වෙන වෙන ම කාඩ්පත්වල ලියන්න. පන්තියේ සිසුන් A, B යනුවෙන් කණ්ඩායම් දෙකකට බෙදා ප්‍රශ්න සඳහන් වන කාඩ්පත් A කණ්ඩායමටත්, පිළිතුරු සඳහන් වන කාඩ්පත් B කණ්ඩායමටත් ලබාදෙන්න.

A කණ්ඩායම අසන ප්‍රශ්නයට පිළිතුර, B කණ්ඩායම සිය කට්ටලයෙන් තෝරා ශබ්ද නගා කියවා එම ප්‍රශ්නය හා පිළිතුර එක් සිසුවකු අතට පත් කිරීමටත් මේ ක්‍රමයට ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සොයාගත් පසු එක් එක් ළමයා තමා අත ඇති ප්‍රශ්නය හා පිළිතුරු ඇසුරින් වාක්‍යයක් සකස් කොට ශබ්ද නගා කියවීමටත් සලස්වන්න. අතිරේක උදව් - අංක 02 යටතේ නිදසුන් සපයා ඇත) පන්තියේ සියලු ම සිසුන්ට එම වාක්‍යය ලියාගැනීමට උපදෙස් දෙන්න. (මෙම ක්‍රියාකාරකම අවසන් වන විට පාඩමට අදාළ සටහනක් සකස් වී, එය සිසුන්ගේ සටහන් පොත්වල ලියැවී තිබිය යුතු ය.)

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පාඩමේ දී විස්තර කෙරුණු නාට්‍යකරුවන් හඳුනාගැනීම.
- ඔවුන්ගේ නාට්‍ය දෘෂ්ටීන් හඳුනා ගැනීම හා විස්තර කිරීම.
- දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට මෙම නාට්‍යවේදීන්ගෙන් ලැබුණු දායකත්වය ප්‍රකාශ කිරීම.
- මෙම නාට්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනාගැනීම.
- මෙම නාට්‍යකරුවන් විවිධ කලා ක්ෂේත්‍රවල දැක්වූ ප්‍රවීණත්වය වටහාගැනීම.

අතිරේක උදව් : 01. **A කණ්ඩායම** **B කණ්ඩායම**

| | A කණ්ඩායම | B කණ්ඩායම |
|---|---|---|
| 01 | ''ලෙඩක් නැති ලෙඩෙක්'' නාට්‍යය නිෂ්පාදනය කළේ කවරෙක් ද? | ආර්.ආර්. සමරකෝන් |
| 02 | ආර්.ආර්. සමරකෝන්ගේ සුප්‍රකට නාට්‍ය කෘතියක් කියන්න. | කැළණි පාලම |
| 03 | ''තල මල පිපිලා'' නාට්‍යය කාගේ කෘතියක් ද? | ජයලත් මනෝරත්නගේ |

02. (අ) ''ලෙඩක් නැති ලෙඩෙක්'' නාට්‍යය ආර්.ආර්. සමරකෝන්ගේ නිර්මාණයකි.

(ආ) ''කැළණි පාලම'' ආර්.ආර්. සමකෝන්ගේ සුප්‍රකට නාට්‍යයකි.

03. i. ආර්.ආර්. සමරකෝන්ගේ කෘති

ලෙඩක් නැති ලෙඩෙක්

අහසින් වැටුණු මිනිස්සු (මෙය 1971 වසරේ දී සම්මාන 4 ක් දිනා ඇත)

චරිත දෙකක්, ගමනක්, ඉඩම, කැළණි පාලම, ජේලර් උන්නැහේ, උතුරේ රාහුල, කපුටුබෝ, දූවිලි, රජ කතාව

නාට්‍ය රචකයෙක්, නළුවකු හා නිෂ්පාදකයකු ලෙස ප්‍රවීණත්වය දක්වා ඇත.

ii. ජයලත් මනෝරත්න

1974 රතු හැට්ටකාරී
1990 තල මල පිපිලා
1990 සොක්‍රටීස්
1991 ද්විත්ව
1995 පුත්‍ර සමාගම

මෙම නාට්‍යවල රංගනය වෙනුවෙන් ''හොඳම නළුවා'' සම්මාන ලබා ඇත.

මෝදර මෝල, නෙළුම් පොකුණ, මේස, නාග ගුරුළා, උක්දඬු ගින්න යන නාට්‍යවලට ද රංගනයෙන් දායක වී ඇත.

ජයලත් මනෝරත්නගේ නාට්‍ය නිර්මාණ කීපයක් පහත දැක්වේ.

1980 මහගිරිදඹ
1985 පුත්‍ර සමාගම
1988 තලමල පිපිලා
1993 අන්දරේලා
1996 ගුරුතරුව
2001 ලෝකය තනි යායක්

දේශපාලන, සංස්කෘතික හා සමාජ තත්ත්ව විග්‍රහය මොහුගේ නාට්‍ය දෘෂ්ටිය හා බැඳී පවතී.

ජයලත් මනෝරත්න 25 වසරක් තුළ රඟ පෑ භූමිකා 50 ක් අතුරින් තෝරාගත් නාට්‍ය 8 ක් ඇතුළත් කොට තුන්වැනි සීනුව

(Third Bell) නමින් නාට්‍ය උළෙලක් පැවැත් වූ අතර, එහි දී එකිනෙකට වෙනස් භූමිකා 8 ක් නිරූපණය කළ අයුරු දක්නට ලැබිණි.

ජයලත් මනෝරත්න ගේ ''තලමල පිපිලා'' නාට්‍යය (රංබරණ)
රංජිත් ධර්මකීර්ති ගේ ''මෝදර මෝල'' නාට්‍යය (ලියන මහත්මයා)
නිමල් ඒකනායක ගේ ''උක්දඬු ගින්න'' නාට්‍යය (කාර් බහුරූපියා)
ප්‍රසන්න විතානගේ ගේ ''ද්විත්ව'' (අන්තෝනියෝ බෙරුද්දී)
කේ.බී. හේරත් ගේ ''මායා දේවී'' නාට්‍යය (මුදලාලි)
ජයලත් මනෝරත්න ගේ ''පුත්‍ර සමාගම'' නාට්‍යය (සරාප්නොව්)

iii. ගාමිණී හත්තොට්ටුවේගම
''විවෘත වීදි නාට්‍ය කණ්ඩායම'' විසින් රඟ දක්වන ලද වීදි නාට්‍ය කීපයක්

1974 බෝසත් දැක්ම, රජ දැක්ම, පෝලිම, මිනිහෙකුට එල්ලිලා මැරෙන්න බැරි ද?
1975 රූකඩයෝ, ලෝක ආහාර සම්මේලනය
1976 බීජ දැක්ම
1977 පිං පෙට්ටිය
1978 අපිත් අඳුනා ගන්න. රටක් අඳුනා ගන්න.
1979 ඔංචිල්ලාව, වෙසක් දැක්ම, ජේසු දැක්ම, රටේ දැක්ම
1984 උතුමාණෝ නැවත පැමිණේ. ගැම්මා නැව පැමිණේ
1985 රංකුකුළෝ, පර්ෂින් කුරුල්ලා අපට එපා
1986 නුරුස්සන හඬ
1987 වෙන්දේසිය, පිබිදීම
1988 එළඟ, මෝරනවා
1989 මනමේ, ඔබදුටුවා
1990 නීතියේ කන්‍යාව
1991 කමිසය
1994 මලට මල, විශ්ව විද්‍යාල දැක්ම

**වැඩිදුර කියවීම සඳහා**


ශ්‍රී ලංකාවේ නාට්‍ය උත්සව ඉතිහාසය - 1990-2008
- නාලන් මෙන්ඩිස් -

නාට්‍ය හා රංග කලාව සරල විග්‍රහයක් - රංජිත් ධර්මකීර්ති

ලංකාවේ වීදි නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශනය - 2006
- චන්ද්‍රි රණතුංග -

ආලෝකය යට හමුවීම - ගාමිණී ජයලත්

එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය යුගය - 1947-1997 දෙවන භාගය
- රත්නපාල ද සිල්වා - 1997

''අභිනය'' සඟරා

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.7** : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංග ශිල්පීන් පිළිබඳ ව විමසයි.

4.7.1 රත්නා ලාලනී ජයකොඩි
4.7.2 නීල් අලස්
4.7.3 මැණිකේ අත්තනායක
4.7.4 රම්‍යා වනිගසේකර
4.7.5 දීපානි සිල්වා
4.7.6 චාන්දනී සෙනෙවිරත්න
4.7.7 සුමින්ද සිරිසේන
4.7.8 හෙන්රි ජයසේන

**ක්‍රියාකාරකම** : ''රංගන ශිල්පීන් හඳුනාගනිමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගැනුම් පල** :

- ඡායාරූප ඇසුරින් රංගන ශිල්පීන් හඳුනාගනියි.
- ඔවුන්ගේ රංගන කුශලතා අගයයි.
- ඔවුන් රඟපෑ නාට්‍ය නම් කරයි.
- චිත්‍රපට සහ රූපවාහිනී මාධ්‍යන්හි ඔවුන්ගේ රංගන දායකත්වය සාකච්ඡා කරයි.

**ගුණාත්මක යෙදවුම්** : රත්නා ලාලනී ජයකොඩි, මැණිකේ අත්තනායක, රම්‍යා වනිගසේකර, දීපානි සිල්වා, චාන්දනී සෙනෙවිරත්න, නීල් අලස්, සුමින්ද සිරිසේන, හෙන්රි ජයසේන යන නළු-නිළියන් ගේ ඡායාරූප. ඔවුන් රඟ පෑ නාට්‍ය පිටපත්, ඔවුන් පිළිබඳ ව ලියා ඇති පුවත්පත්, සඟරා ආදිය, නාට්‍ය පිළිබඳ ප්‍රචාරක දැන්වීම්. ඔවුන් ගේ රඟපෑම් ඇතුළත් සංයුක්ත තැටි. ඔවුන් නිරූපණය කළ චරිතවලට අදාළ නාට්‍ය ගීත.

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 ඉහත ගුණාත්මක යෙදවුම්වල සඳහන් කොට ඇති දෘශ්‍යාධාර එකක් හෝ කීපයක් භාවිත කරමින්,

රත්නා ලාලනී ජයකොඩි
නීල් අලස්
මැණිකේ අත්තනායක
රම්‍යා වනිගසේකර
දීපානි සිල්වා
චාන්දනී සෙනෙවිරත්න
සුමින්ද සිරිසේන
හෙන්රි ජයසේන යන රංගන ශිල්පීන් සිසුන්ට හඳුන්වාදෙන්න. සකස් කරගත් පුවරුවක (කොටස් පහකට බෙදා) එම ශිල්පීන්ගේ ඡායාරූප රඳවමින් පාඩමට පිවිසෙන්න.

පියවර 02 ඉහත සඳහන් රංගන ශිල්පීන් විසින් රඟපාන ලද නාට්‍ය නම් කරමින් පුවරුවේ ශිල්පියා ගේ ඡායාරූපය රඳවනු ලැබූ කොටසේ අදාළ නාට්‍යයේ නම සඳහන් කරන්න. මේ සඳහා ඔබ විසින් සපයාගනු ලැබූ ගුණාත්මක යෙදවුම් පරිහරණය කරන්න. (අතිරේක උදව් යටතේ ද තොරතුරු සැකෙවින් දක්වා ඇත.)

ඔවුන් ගේ රංගන කුශලතා පිළිබඳ ව සාකච්ඡා කරන්න. ඔවුන් රඟ පෑ චරිතවලින් වඩාත් ජනප්‍රිය වූ චරිත පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

ඉහත සඳහන් ශිල්පීන් ගේ රංගනයෙහි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කරන්න.

උක්ත ශිල්පීන් වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයෙහි පමණක් නො ව සිනමාව, ටෙලි නාට්‍ය ආදී ක්ෂේත්‍රයන්හි ද ප්‍රවීණත්වය දක්වන බව සඳහන් කොට එබඳු අවස්ථා, නිර්මාණ හා චරිත පිළිබඳ ව සාකච්ඡා කරන්න.

මෙම සාකච්ඡාව සිදු වන අතර ඒ ඒ ශිල්පීන් සඳහා වෙන් කරන ලද කොටසෙහි අදාළ කරුණු සටහන් කරන්න. පාඩම අවසාන වන විට ඔබ විසින් සකස් කරගනු ලැබූ පුවරුවෙහි ඒ ඒ රංගන ශිල්පියා පිළිබඳ විස්තරයක් ගොඩ නැගී ඇත.

පියවර 03 ඉහත සඳහන් පුවරුව ආශ්‍රයෙන් අදාළ ශිල්පීන් පිළිබඳ විස්තර තම සටහන් පොත්වල ලියාගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- පාඩමෙහි සඳහන් කොට ඇති රංගන ශිල්පීන් හඳුනා ගැනීම.
- ඔවුන්ගේ රංගන කුශලතා සාකච්ඡා කිරීම.
- ඔවුන් රඟ පෑ නාට්‍ය නම් කිරීම.
- ඔවුන් ගේ රංගනයෙහි සුවිශේෂ ලක්ෂණ දැක්වීම.
- නාට්‍යකරුවන් පිළිබඳ තොරතුරු රැස් කිරීම.

පැවරුම : 4.6 නිපුණතා මට්ටමට අදාළ නාට්‍යකරුවන් හා
4.7 නිපුණතා මට්ටමට අදාළ රංගන ශිල්පීන්
පිළිබඳ තොරතුරු ඇතුළත් කොට පොත් පිංචක් සකස් කිරීමට සිසුන් මෙහෙයවන්න. (ඒ ඒ ශිල්පීන් ගේ ඡායාරූප, ඔවුන්ගේ රංගන අවස්ථා දැක්වෙන ඡායාරූප, ඔවුන් රඟ පෑ වඩාත් ම සිත් ගන්නාසුළු නාට්‍යවල සංවාද ඛණ්ඩ සහ ගීත ආදිය ඇතුළත් කොට නිර්මාණාත්මක ව පොත සකස් කිරීම සඳහා සිසුන්ට උපදෙස් ලබා දෙන්න.)

**අතිරේක උදව් : වැඩිදුර කියවීම සඳහා**

ශ්‍රී ලංකාවේ නාට්‍ය උත්සව ඉතිහාසය - 1990-2008 නාලන් මෙන්ඩිස්

නාට්‍ය හා රංග කලාව - සරල විග්‍රහයක් - රංජිත් ධර්මකීර්ති

ලංකාවේ වීදි නාට්‍ය කලාවේ ආරම්භය හා විකාශනය - 2006
- චන්ද්‍රි රණතුංග

ආලෝකය යට හමුවීම - ගාමිණී ජයලත්

එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය යුගය 1947-1997 දෙවන භාගය
- රත්නපාල ද සිල්වා - 1997

''අභිනය'' සඟරා

**අතිරේක කියවීම් : 4.7.1 රත්නා ලාලනී ජයකොඩි**

බන්දුල විතානගේ ගේ 'වැනීසියේ වෙළෙන්දා' නාට්‍යයෙන් වේදිකාවට පිවිසි රත්නා ලාලනී ජයකොඩි රංගනයට මෙන් ම නර්තනයට හා ගායනයට ද එක සේ දස්කම් දක්වයි. අවුරුදු 10 ක් තුළ නාට්‍ය 25කට රංගනයෙන් දායක වූ ඇය එයින් භූමිකා 07ක් එක් කොට "අසූ එක - අනූ

එක" නමින් නාට්‍ය උළෙලක් සංවිධානය කළ අතර, දශක තුනක කාලයක් තුළ නාට්‍ය 50ක පමණ රඟ පා තිබේ.

ඩග්ලස් සිරිවර්ධන ගේ 'සුබ සැන්දෑවක්' (ලීසා), කපිල කුමාර කාලිංග ගේ 'නෙලුම් පොකුණ' (සිල්වියා), මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ 'පේමතෝ ජායතී සෝකෝ' (ස්වර්ණ තිලකා) සහ 'මනමේ' (මනමේ කුමරිය) කේබී හේරත් ගේ 'මායා දේවී' (ලක්ෂ්මී), ජයලත් මනෝරත්න ගේ 'තලමල පිපිලා' (මහේෂිකා) 'අන්දරේලා' (අන්දරේවතී) සහ 'ගුරුතරුව' (සංගීත ගුරුවරිය), ශ්‍රියන්ත මෙන්ඩිස් ගේ 'වර්ණ' (රෝස්) යන නාට්‍යයන්හි ප්‍රේක්ෂකයාට අමතක නොවන චරිත ඇය විසින් රඟ පා ඇත.

එමෙන් ම උදිත ශ්‍රී ලාල් ගේ 'තිරිවානා අතරින්' (ශ්‍යාමලී), කේ. බී. හේරත් ගේ 'මායා දේවී' (ලක්ෂ්මී) ජයලත් මනෝරත්න ගේ 'පුත්‍ර සමාගම' (නීනා), යන නාට්‍යවල රංගනය වෙනුවෙන් විශිෂ්ට කුශලතා සම්මානය ද, සෝමපාල පතිරගේ ගේ 'තුංමංසල', බන්දුල විතානගේ ගේ 'රෝමය ගිනි ගනී' සුනන්ද ද සිල්වා ගේ 'පාරාජිකා' සහ දිවයින සාම නාට්‍ය උළෙලේ ද හොඳ ම නිළියට හිමි සම්මානය දිනා ගනු ලැබුවේ ඇය විසිනි.

මීට අමතර ව ටෙලිනාට්‍ය හා චිත්‍රපට රාශියකට රංගනයෙන් දායක වී ඇති රත්නා ලාලනී ගුවන් විදුලියේ ළමා වැඩ සටහන්වලට හා ගුරුකුලය, ලන්දේසි පුවත, රූකඩ පැංචා, ගුවන් විදුලි රඟමඬල ආදී වැඩ සටහන්වලට ද දායකත්වය සපයා ඇත.

### 4.7.2. නීල් අලස්

1971 දී අහඹු ලෙස වේදිකා නාට්‍යයට සම්බන්ධ වන මොහු දයා වයමන් ගේ 'අම්මයි පුතයි' වේදිකා නාට්‍යයෙන් ප්‍රසිද්ධ වේදිකාවට අවතීර්ණ විය. දයානන්ද ගුණවර්ධන ගේ 'ගජමන් පුවත' (ජෝන් ඩොයිලි), මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ 'වෙස්සන්තර' (සඳ මහ රජු), ආර්.ආර්. සමරකෝන් ගේ 'කැලණි පාලම' (චුට්ටෙ අය්යා), රංජිත් ධර්මකීර්ති ගේ 'මෝදර මෝල' (ලක්දාස), ධර්මසිරි බණ්ඩාරනායක ගේ 'ධවල භීෂණ' (ෂෝන්) සහ 'ට්‍රෝජන් කාන්තාවෝ' (පොසයිඩස්), ජයලත් මනෝරත්න ගේ 'අන්දරේලා' (පිළිමතලව්වේ), කේ.බී. හේරත් ගේ 'දෙවැනි මහින්ද ' (හය වැනි අග්බෝ) ආදී නාට්‍ය රාශියකට ඔහු රංගනයෙන් දායක වී ඇත.

මීට අමතර ව රංජිත් ධර්මකීර්ති ගේ 'හිරු නැති ලොව', 'අංගාරා ගඟ ගලාබසී', 'ආඩි රුලේ අම්බලම', ආර්. ආර්. සමරකෝන් ගේ 'ඉඩම', 'අහසින් වැටුණු මිනිස්සු', 'ජේලර් උන්නැහේ', ලූෂන් බුලත්සිංහල ගේ 'තාරාවෝ ඉගිළෙති', හේමසිරි ලියනගේ ගේ 'නරියා සහ කේජු', ආරියරත්න විතානගේ ගේ 'සිකුරු යුද්දේ', 'තෙල් දෝතක්', ජයලත් මනෝරත්න ගේ 'මහගිරිදඹ', සුසන්ත විතානගේ ගේ 'අවි', අජිත් ජිනදාස ගේ 'යාත්‍රා', කේ.බී. හේරත් ගේ 'වෙස්' යන නට්‍යවල ද නීල් අලස් චරිත නිරූපණය කොට තිබේ. දක්ෂ රංගන ශිල්පියකු වූ මොහු වේදිකා නාට්‍යවලට අමතර ව, ටෙලි නාට්‍ය හා චිත්‍රපට නළුවකු ලෙස ද ප්‍රේක්ෂක අවධානයට දිනා ගත්තෙකි.

### 4.7.3 මැණිකේ අත්තනායක

ආර්. ආර්. සමරකෝන් ගේ 'කැලණි පාලම' වේදිකා නාට්‍යයේ 'රූපවතී' ගේ චරිතයට පණ පොවමින් ප්‍රේක්ෂක අවධානය දිනාගත් මැණිකේ අත්තනායක වේදිකා නාට්‍ය රාශියක චරිත නිරූපණය කළ දක්ෂ රංගන ශිල්පිනියකි.

මහාචාර්ය සරච්චන්ද්‍රයන් ගේ 'ලෝමහංස' දයානන්ද ගුණවර්ධන ගේ 'මධුර ජවනිකා' පුණ්‍යසෝම ගුණසිංහ ගේ 'දික්තල කාලගෝල', රංජිත් ධර්මකීර්ති ගේ 'මෝදර මෝල', අජිත් මෙන්ඩිස් ගේ 'නිශ්ශබ්ද වෙනු' ආදී නාට්‍යවලට ඇය රංගන දායකත්වය දක්වා ඇත. වේදිකා නාට්‍යයට අමතර ව විශේෂයෙන් ම ටෙලි නාට්‍ය නිළියක ලෙස ද, චිත්‍රපට නිළියක ලෙස ද ඇය ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගෙන සිටියි.

### 4.7.4. රම්‍යා වනිගසේකර

ආර්.ආර්. සමරකෝන් ගේ 'කැලණි පාලම' වේදිකා නාට්‍යයේ 'මැටිල්ඩා' ගේ චරිතයට 1978 සිට අවුරුදු 35කට වැඩි කාලයක් පණ දෙමින් ප්‍රේක්ෂකයන් ගේ සිත් තුළ නොමැකෙන චරිතයක් බවට පත් ව සිටියි. 'ලිහිණි' නාට්‍යයේ ඇය විසින් නිරූපණය කරන ලද 'මොලී' ගේ චරිතය වෙනුවෙන් 1995 වර්ෂයේ රාජ්‍ය නාට්‍ය උළෙලේ දී හොඳ ම සහාය නිළියට හිමි සම්මානය ඇය විසින් දිනා ගන්නා ලදී. වේදිකා නාට්‍ය මෙන් ම ටෙලි නාට්‍යවලට හා චිත්‍රපටවලට ද ඇය රංගනයෙන් දායක වී ඇත.

### 4.7.5 දීපානි සිල්වා

වීදි නාට්‍ය ශිල්පිනියක් වශයෙන් නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වූ දීපානි සිල්වා, ගාමිණී හත්තොට්ටුවේගම ගේ 'විවෘත වීදි නාට්‍ය' කණ්ඩායමේ ප්‍රවීණ රංගන ශිල්පිනියකි. දීර්ඝ කාලයක සිට එම වීදි නාට්‍ය කණ්ඩායමට සම්බන්ධ වෙමින් රංගනයෙහි යෙදෙන ඇය 'වීදි රැජිනි' ලෙස විරුදාවලී ලබා ඇත. විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් රඟ දක්වන ලද වීදි නාට්‍ය සියල්ලට ම පාහේ ඇය රංගන දායකත්වය ලබා දී ඇත.

4.6.3 ගාමිණී හත්තොට්ටුවෙගම හා සම්බන්ධ ක්‍රියාකාරකමෙහි අතිරේක උදව් යටතේ දී ඇති වීදි නාට්‍ය නාම ලේඛනය පිළිබඳ ව අවධානය යොමු කරන්න. මීට අමතර ව දීපානි සිල්වා රංගන ශිල්පිනිය ටෙලි නාට්‍ය හා චිත්‍රපට විශාල සංඛ්‍යාවකට සිය රංගන දායකත්වය ලබා දී ඇත.

### 4.7.6 චාන්දනී සෙනෙවිරත්න

වේදිකාව සිනමාව මෙන් ම ටෙලි නාට්‍යවල ද චරිත නිරූපණය කරමින් ප්‍රේක්ෂක අවධානය දිනා ගත් කුශලතා පූර්ණ රංගන ශිල්පිනියක ලෙස චාන්දනී සෙනෙවිරත්න හැඳින්විය හැකිය. සෝමලතා සුබසිංහ ගේ 'විකෘති' නාට්‍යයේ 'හිල්ඩා' ලෙස ද, සුනන්ද මහේන්ද්‍ර ගේ 'සොක්‍රටීස්' නාට්‍යයේ 'සොක්‍රටීස් ගේ බිරිය' ලෙස ද විශේෂ රංගන කුශලතා දැක්වූ ඇය, ජයලත් මනෝරත්න ගේ 'පුත්‍ර සමාගම', 'වරෙන්තු' සහ 'වැලන්ටයින් එනකන්' යන නාට්‍යවලට ද දායකත්වය ලබා දී ඇත. ඇය විසින් රඟපාන ලද ටෙලි නාට්‍ය රාශියකි. එමෙන් ම චිත්‍රපට නිළියක් ලෙස ද ඇය ප්‍රේක්ෂක අවධානය දිනා ගෙන ඇත.

### 4.7.7 සුමින්ද සිරිසේන

මොහු වේදිකා රංගනයට මෙන් ම ටෙලි නාට්‍ය හා චිත්‍රපටවල රඟ පෑමට ද එක සේ දස්කම් දැක් වූ ප්‍රවීණ රංගන ශිල්පියෙකි.

බන්දුල විතානගේ ගේ 'රෝමය ගිනි ගනී' නාට්‍යයේ රංගනය වෙනුවෙන් 'හොඳ ම නළුවාට හිමි සම්මානය' ද, ජයලත් මනෝරත්න ගේ 'අන්දරේලා' සහ රංජිත් ධර්මකීර්ති ගේ 'මේඝ' නාට්‍යයේ රංගනය වෙනුවෙන් 'හොඳ ම සහාය නළුවාට හිමි සම්මානය' ද සුමින්ද සිරිසේන හිමි කර ගෙන ඇත. ඊට අමතර ව, භව කඩතුරා, මීපුර වැසියෝ, කස්පා, ගුරුතරුව යන වේදිකා නාට්‍ය සහ තවත් නාට්‍ය බොහෝවකට මෙම රංගන ශිල්පියා දායක වී තිබේ.

ටෙලි නාට්‍ය රංගන ශිල්පියකු මෙන් ම චිත්‍රපට නළුවකු වශයෙන් ද ඔහු ඉහළ ජනප්‍රියත්වයක් හිමි කර ගෙන ඇත.

**නිපුණතාව 4.0** : නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.8** : සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** : ''අපේ කම සොයායමු''.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විවිධ ජනවර්ගවලට හා ආගම්වලට ආවේණික උත්සව අවස්ථා නම් කරයි.
- එම අවස්ථාවන්ට අදාළ සුවිශේෂ සංස්කෘතික ලක්ෂණ විමසයි.
- එම උත්සව අවස්ථා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
- විවිධ චරිත ප්‍රතිනිර්මාණය කරයි.
- සංස්කෘතික සහයෝගිතාව ප්‍රදර්ශනය කරයි.
- විවිධ සංස්කෘතික හර පද්ධති අන්‍යෝන්‍ය වශයෙන් අගය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : සිංහල - හින්දු අවුරුද්ද හා සම්බන්ධ ගීත, කවි, එම උත්සව දර්ශන සහිත සංයුක්ත තැටි, නත්තල් උත්සවය හා සම්බන්ධ ගීත සහ දර්ශන - රාමසාන් උත්සවය පිළිබඳ තොරතුරු වාර්තා

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 සංයුක්ත තැටියක් උපයෝගි කරගනිමින් හෝ අවුරුදු / නත්තල් / රාමසාන් උත්සව අවස්ථාවකට අදාළ දර්ශන සිසුන්ට නැරඹීමට සලස්වන්න. නොඑසේ නම්, එම උත්සව හා සම්බන්ධ ගීතයක් සිසුන් සමග ගායනා කරමින් පාඩමට පිවිසෙන්න.

උදාහරණ : ඇවිල්ල ඇවිල්ලා - සිංහල අවුරුද්ද ඇවිල්ලා
වරෙල්ල වරෙල්ලා - වැල්ලෙ පදිමු රං ඔංචිල්ලා

එම ගීතයෙන් කියැවෙන සිංහල හින්දු අලුත් අවුරුද්ද හා සම්බන්ධ වන සංස්කෘතික අංග සාකච්ඡා කරන්න. (ආහාර සංස්කෘතිය, කැවුම්, කිරිබත් ආදිය. ජනක්‍රීඩා, රබන් ගැසීම, ඔංචිල්ලා පැදීම ආදිය, දෙගුරුන් නැමදීම් ආදී සාරධර්ම)

පියවර 02 ශ්‍රී ලංකාවේ විවිධ ජාතීන් විසින් සිදු කරනු ලබන සංස්කෘතික උත්සව පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න. සිංහල හා දෙමළ ජනයා සිංහල-හින්දු අලුත් අවුරුදු උළෙල ද, කිතුනුවන් නත්තල් උළෙල ද, ඉස්ලාම් භක්තිකයන් රාමසාන් උළෙල ද ඉහළින් පවත්වන ආකාරය සාකච්ඡා කරන්න. එම සියලු උත්සවවල දී ඒ ඒ ජන වර්ගයට ආවේණික සංස්කෘතික ලක්ෂණ ඉස්මතු වන ආකාරය පැහැදිලි කරන්න. එම සංස්කෘතික ක්‍රියාකාරකම් ඇතුළත් සැලැස්මක් සකස් කරන්න.

පියවර 03 උක්ත සැලැස්ම හා සාකච්ඡාව ආශ්‍රයෙන් නාට්‍යමය අනුභූතියක් ඉස්මතු කරගන්න. එම ජන වර්ග වෙන් වෙන් කොටස් නො ව එක ම ශ්‍රී ලාංකික ජාතියේ අවයවයන් බව වැටහෙන ආකාරයෙන් කටයුතු කරන්න. ඒ ඒ සංස්කෘතිකාංගවලට අන්‍යෝන්‍ය වශයෙන් ගරු කිරීමේ යහපත් පිළිවෙත පෙරදැරි කරගනිමින් නාට්‍යමය සංසිද්ධිය ගොඩ නගා ගැනීමට උපදෙස් දෙන්න.

තමා විසින් විඳිනු ලැබූ අවස්ථා හා දකින ලද චරිත ප්‍රතිනිර්මාණය කරමින් එබඳු සංසිද්ධියක් නාට්‍යාකාරයෙන් / නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විවිධ ජනවර්ගවලට හා ආගම්වලට අයත් උත්සව අවස්ථා නම් කිරීම.
- ඒ හා සම්බන්ධ සංස්කෘතිකාංග හඳුනාගැනීම.
- චරිත ප්‍රතිනිර්මාණය කිරීම.
- සංස්කෘතික සහයෝගිතාව ප්‍රදර්ශනය කිරීම.
- සංස්කෘතික උත්සව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීම.

පැවරුම : විද්‍යාලයීය වාරාවසාන / වර්ෂාවසාන ප්‍රසංගයේ දී රඟ දැක්වීම අරමුණු කොට, සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත නාට්‍ය පෙළක් රචනා කරන්න.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානවහිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම** : නිර්දිෂ්ට පෙළ හෝ වෙනත් පෙළක් නිෂ්පාදනයක් ලෙස රස විඳියි.

**ක්‍රියාකාරකම** : විකෘති නාට්‍යය අධ්‍යයනය කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- විකෘති නාට්‍යය නිෂ්පාදනය රස විඳියි.
- විකෘති නාට්‍යයේ සිත්ගත් ගීත ගයයි.
- විකෘති නාට්‍යයේ එන නර්තන ක්‍රියාකාරකම් අනුකරණය කරයි.
- යොවුන් ගැටලු හඳුනාගනියි.
- යොවුන් ගැටලු වස්තු විෂය කරගත් නාට්‍ය පෙළ රචනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** : ''විකෘති නාට්‍ය පෙළ''
''විකෘති'' නාට්‍ය සහිත සංයුක්ත තැටි

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 විකෘති නාට්‍ය පෙළ පරිශීලනයට සිසුන්ට අවස්ථාව ලබාදෙමින් හෝ නාට්‍යය නැරඹීමට අවස්ථාව සලසාදෙමින් පාඩමට ප්‍රවේශ විය හැකි ය.

පියවර 02 පහත සඳහන් කරුණු ඇතුළත් ව සාකච්ඡාවක් මෙහෙයවමින් ''විකෘති'' නාට්‍යය පරිශීලනය කරන්නට සිසුන්ට මග පෙන්වන්න.

- සෝමලතා සුබසිංහ යෞවන ප්‍රශ්න අළලා නිර්මාණය කළ නාට්‍යයකි.
- සමාජයීය හා ආර්ථික වෙනස සමග අධ්‍යාපනික රාමුව දැඩි විපර්යාසයන්ට භාජනය වූ සමයක දරුවන් ගේ අපේක්ෂා හා වැඩිහිටියන් ගේ අපේක්ෂා අතර ඇති වන ගැටුම හා අවසානයේ ඔවුනොවුන් ගේ ජීවිතවල ඛේදවාචකය ''විකෘති'' නාට්‍යයේ පැහැදිලි කරයි.
- රටේ කුමන සමාජ පංතියකට අයත් වුව ද ප්‍රියංගනී, ජගත් හා සරණපාල යන චරිත ත්‍රිත්වය මෙම අර්බුදයට මුහුණ දෙන ආකාරය නාට්‍යය තුළ මනා ලෙස නිරූපණය කර ඇත.
- විවෘත ආර්ථිකය හේතු කොට ගෙන සමාජයත්, පවුලත් අතර සිදු වන්නා වූ වෙනස්කම්වල හරස්කඩක් ''විකෘති'' නාට්‍යයෙන් ප්‍රකාශිත ය. තරුණ පරපුර පදනම් කරගෙන නිර්මාණය වුවත් එය ඉලක්ක ගත වී තිබෙන්නේ සමස්ත වැඩිහිටි පරපුරත්, තීන්දු තීරණ ගෙන ඒවා ක්‍රියාත්මක කරවන පරිසක් අරමුණු කරගෙන ය.

  ඔවුනොවුන් ගේ වැරදි කළමනාකරණය හා ප්‍රතිපත්ති තීන්දු මුළු මහත් සමාජයක් උඩුයටිකුරු කරන අතර, අවසානයේ එය පලක් නැති වෙහෙසකර කාර්යයක් පමණක් බව ධ්වනිත කරවයි.
- වර්තමාන සමාජ ප්‍රවණතා දෙස විවෘත දෘෂ්ටියකින් යුතු ව බලමින්, 80 දශකයේ ලොව පුරා ව්‍යාප්ත වූ පොප් සංගීත රිද්මයන් හා නර්තන ආභාසය ලබමින් දේශීයත්වයට උචිත පරිදි වඩා සිත්ගන්නා රිද්මයක් සහ රංග වින්‍යාසයක් දැකිය හැකි ය.
- පළමු රංගය ඇරඹෙන්නේ බටහිර රිද්මය මුල්කරගත් සංගීත ඛණ්ඩයකිනි. ඊළඟ පියවරේ දී පහතරට යක් බෙරය මූලික කරගත් අවසර ගැනීමේ යැදුමකට අවතීර්ණ වෙයි. පහතරට නැටුම්වල ඇති හැඩතල ගෙන රංගනය හා සංගීතය සකස් කරගත් ආකාරය පහත සඳහන් නිදසුනෙන් පැහැදිලි වෙයි.

''ටියුෂන් ............ ටියුෂන්
ටියුෂන් ............ පියෝ ......... ටියුෂන් බයෝ
කෙමෙස්ට්‍රි ............ ෆිසික්ස්''

- හුදු විභාග ජයග්‍රහණය ලබා ගැනීමේ අරමුණින් තම දූ දරුවන් මෙහෙයවන ස්වරූපය ටියුෂන් නැටුම හා යක්ෂ නැටුම මගින් ඉදිරිපත් කර ඇත.
- ''විකෘති'' සඳහා පසුතල හා ඇඳුම් නිර්මාණය කරන ලද්දේ සරත් සූර්සේනයන් විසිනි. මෙම පසුතල වේදිකාවේ නිර්මාණය කරන අවස්ථාව අර්ථවත් කිරීමට උපයෝගී කරගෙන ඇත.
- ''අපේ දරුවෝ විතරක් මේ තරගය දිනලා මදි. උන්ගෙ දරුවෝ, ඒ දරුවන්ගේ දරුවෝ, හිතල බලන්න හිල්ඩා මේ තරගය උත්සන්න වෙන කොට'' ''මේ හැමෝ ම කරන දේනෙ මමත් කරන්නේ''

  මෙවන් දෙබස් මගින් රසිකයන්ට සිතන්නට යමක් ඉතිරි කර ඇත.
- නාට්‍යාවසානයේ එන මේ ආයාචනාත්මක ගීත ඛණ්ඩය සමස්ත නාට්‍යයේ ම මුඛ්‍ය තේමාව හෙළිදරව් කරයි.

  ''කෑමට බීමට, ඇඳුම පැළඳුමට
  ගෙයට දොරට, යාන වාහනයට
  තරගයක් නැති ලොවක්
  ළඟා කර දෙන්න ......
  ගුරුනි දෙගුරුනි අපට''

පියවර 03 සිසුන් කණ්ඩායම් කර, පහත දැක්වෙන මාතෘකා ඔස්සේ සාකච්ඡා කිරීමට අවස්ථාව දෙමින් අගය කරන්න.

- නාට්‍යමය අවස්ථා විකාශනය කිරීමෙහි ලා හිල්ඩාගේ චරිතය ක්‍රියාත්මක වන ආකාරය සාකච්ඡා කරන්න.
- නාට්‍යයෙන් පිළිබිඹු වන ප්‍රියංගනී ගේ දක්ෂතා හුවාදක්වන්න.
- ප්‍රියංගනී ගේ මානසික ස්වභාවය ක්‍රමයෙන් වෙනස්වන ආකාරය සාකච්ඡා කරන්න.
- සරණපාල නම් වූ පියා ගේ භූමිකාව පැහැදිලි කරන්න.
- නාට්‍යයේ පසුතල භාවිතය පිළිබඳ සාකච්ඡා කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නාට්‍යයේ ගීත ගායනය කිරීම.
- නර්තන අවස්ථාවක් අනුකරණය කිරීම.
- ප්‍රියංගනී ගේ දක්ෂතා හුවාදැක්වීම.
- හිල්ඩා ගේ භූමිකාව විස්තර කිරීම.
- පසුතල භාවිතය පිළිබඳ අදහස් දැක්වීම.

පැවරුම : විකෘති නාට්‍යය තුළ ඔබ දකින සමාජ පිළිබිඹුව විග්‍රහ කරන්න යන මැයෙන් රචනයක් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

අතිරේක උදව් : විකෘති නාට්‍යය විචාර ලිපි

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානවහිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.3** : නාට්‍ය පෙළ සමස්තයක් වශයෙන් ඇගයීමට ලක් කිරීම.

**ක්‍රියාකාරකම** : විකෘති නාට්‍යය හා එහි නාට්‍ය දෘෂ්ටිය විමසමු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගැනුම් පල** :
- යෞවන නාට්‍ය සංකල්පය හඳුන්වයි.
- විකෘති නාට්‍ය නිර්මාණය කිරීමට බලපෑ සමාජ පසුබිම හඳුනාගනියි.
- නාට්‍ය තේමාව සහ දෘෂ්ටිය වටහා ගනියි.
- චරිත හා අවස්ථා මගින් නාට්‍යයේ ගැටුම් කුළුගන්වන අයුරු විමසයි.
- නාට්‍ය තේමාව හා දෘෂ්ටිය තීව්‍ර කරන අයුරින් රංගනය හා ආනුෂංගික කලාවන් යොදාගැනීම පිළිබඳ විමසයි.

**ගුණාත්මක යෙදවුම්** : නාට්‍ය පෙළ, පෙරවදන සහ එහි ආරම්භයේ ඇති යෞවන නාට්‍ය හා විකෘති පිළිබඳ කෙටි විවරණය, නාට්‍යයේ වීඩියෝ පටයක්, නාට්‍යයේ ඡායාරූප

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

පියවර 01 විකෘති නාට්‍ය පිටපත පෙන්වමින් හෝ විඩියෝ පටයක් මගින් නාට්‍යයේ ඡායාරූප පෙන්වමින් පාඩමට ප්‍රවිෂ්ට වීම. විකෘති යනු යෞවන නාට්‍යයක් බව පෙන්වාදීම. විකෘති නාට්‍යයේ පිටපතෙහි ඇතුළත් යෞවනයා යනු කවරේ ද? යන රචනය ඔවුන් සමඟ කියවා එය සාකච්ඡා කිරීම.

පියවර 02
- විකෘති නාට්‍යයෙන් ප්‍රකාශ වන තේමාව හා දෘෂ්ටිය වටහාදීම, මුලින් ම විකෘති කථා පුවත පිළිබඳ ව සාකච්ඡා කරන්න. එම කථා පුවත තුළින් ප්‍රකාශ වන තේමාව පිළිබද ව අවබෝධයක් ලබාදෙන්න. නූතන තරගකාරී අධ්‍යාපන ක්‍රමය හමුවේ බිඳ වැටෙන යෞවනත්වයේ ඛෙදජනකය මෙහි තේමාව බව පෙන්වාදෙන්න. ප්‍රියංගනීට දරාගැනීමට නොහැකි සහ ඇයට රුචි නොවන අධ්‍යයන මාවතකට දෙමාපියන්ගේ බලපෑම මත ඇයට යොමු වීමට සිදු වන බව පෙන්වාදෙන්න. ප්‍රියංගනි පමණක් නො ව සරණපාල, ජගත් වැනි සෙසු චරිත මගින් ද මේ අදහස ප්‍රකාශ වන බව පෙන්වාදෙන්න.
- නාට්‍යකරුවාගේ මූලික දෘෂ්ටිය වන්නේ විවෘත ආර්ථිකය හේතු කොටගෙන 80 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ සමාජයත්, පවුලත් අතර සිදු වන්නා වූ සට්ටනය ප්‍රේක්ෂක අවධානයට පාත්‍ර කිරීමයි. එමෙන් ම නූතන ලාංකික වැඩිහිටි පරපුරේ අපේක්ෂාවන් සහ බලාපොරොත්තු බවට පත් වී ඇත්තේ අසීමිත භෞතික සම්පත්වලින් පිරුණු විවිධ තාන්න මාන්නවලින් යුත් ජීවිතයන් තම දරුවන්ට ලබාදීම බව පෙන්වා දෙන්න.
- මධ්‍යම පාන්තික පිරිස් තම අරමුණු ඉටු කරගැනීමේ දී විවිධ මිථ්‍යාවන්ට පවා පෙළඹෙන අයුරු පෙන්වාදෙන්න.
- දැඩි ලෙස වාණිජකරණය වූ සමාජයක යහපත් පුරුෂාර්ථයන් විනාශ වී යන බව පෙන්වාදීම නාට්‍යකරුවාගේ දෘෂ්ටිය වේ.

පියවර 03
- නාට්‍යයේ චරිත නිරූපණය සහ අවස්ථා නිරූපණය පිළිබද ව අවබෝධය යොමු කරවන්න. ප්‍රියංගනී ගේ චරිතය සහ හිල්ඩා ගේ චරිතය ප්‍රධාන වශයෙන් ම වඩාත් ප්‍රබල ව නිරූපණය වී තිබීම. නාට්‍යයේ ගැටුම් අවස්ථා ගොඩ නැගීමේ දී මෙම චරිත දෙක ප්‍රධාන වීම. හිල්ඩා ගේ

සිහිනය ප්‍රියංගනී ගේ ජීවිතය ඛේදවාචකයක් වීමට හේතු වන බව පෙන්වා දෙන්න. පියා ගේ චරිතයෙන් ප්‍රශ්න ගැටලු දෙස මැදහත් සිතින් බලන ආකාරයට නිරූපණය වීම. අනෙකුත් චරිත ප්‍රියංගනී සහ හිල්ඩා සමඟ බැඳුණු ක්‍රියාකාරිත්වය කුළු ගැන්වීමට බලපාන අයුරින් නිරූපණය වී තිබීම.

උදා සම්පත්, සුසිලා, ට්‍රික්සි

- අවස්ථා නිරූපණයන් රැසක් නාට්‍ය තුළ ඇති අතර ඒවා තුළින් අධ්‍යාපනික පීඩනය, යෞවනත්වය වටහා නොගැනීම, බලහත්කාරය, යන ආදිය විද්‍යමාන කරයි . ජගත්, සරණපාල අවස්ථාව, ප්‍රියංගනී ගේ නැටුම් පංති නවතා ඇය දැඩි ලෙස ඉගැනුම් ක්‍රියාවලියට යොමු කිරීම ටියුෂන් ලබාදීමේ අවස්ථා නිරූපණය සහ අවසානයේ විවාහය සඳහා ස්වදේශ හා විදේශ පැමිණෙන අවස්ථා.

**පියවර 04** මෙහි රංග ශෛලිය ගොඩ නැගී ඇති අයුරු ද සාකච්ඡා කරන්න. නාට්‍යයෙහි අවස්ථා නිරූපණයක් රැසක් දැකිය හැකි බව එම අවස්ථා නිරූපණයන්හි චරිත හා ක්‍රියා නිරූපණය බොහෝ සෙයින් ම ලෝකධර්මී ස්වභාවයක් ගන්නා අතර ම ඇතැම් අවස්ථාවල දී නාට්‍යධර්මී ලක්ෂණය ද වේ. නාට්‍යයේ ආරම්භයත් ඇතැම් දර්ශනවල දී විවිධ ගීත සහ නර්තනමය කොටස් යොදාගැනීමක් ද පවතින බව පෙන්වාදෙන්න. නාට්‍ය රංගනය ගොඩ නැගෙන්නේ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ රංග ශෛලියෙහි යම් යම් අංග ලක්ෂණවල ආභාසයක් ලබමින් බව පෙන්වාදෙන්න. වේදිකා පසුතල අවම වීම සහ සංකේත යොදාගැනීම, කෙටි දර්ශන ක්ෂණික ව වෙනස් වීම, එය නළු-නිළි රංගනයන් පමණක් හුවා දැක්වීම, අදහස් ප්‍රකාශනය සඳහා ගීත සහ නර්තනය යොදාගැනීම වැනි අවස්ථා පෙන්වාදෙන්න.

- ආනුෂංගික අංග භාවිතයේ දී සංගීතය, නර්තනය, සංකේතාත්මක පසුතල කොටස් යොදාගැනීම රංගාලෝකය භාවිතය තුළින් අවස්ථා තීව්‍ර කරමින් මවා පෑම ද සිදු කරන බව පැහැදිලි කරන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- යෞවන නාට්‍ය යනු කුමක් දැ යි විස්තර කරයි.
- විකෘති නාට්‍යයේ ප්‍රධාන තේමාව සහ අතුරු තේමාවන් විස්තර කරයි.
- විකෘති නාට්‍යයේ දෘෂ්ටිය හඳුනාගනියි.
- චරිත නිරූපණයේ ස්වභාවය විස්තර කරයි.
- ආනුෂංගික අංග භාවිතයේ ස්වභාවය පැහැදිලි කරයි.

පැවරුම : වර්තමාන සිසු අධ්‍යාපන ගැටලු කිහිපයක් නම් කරවා එම ගැටලු හා විකෘති නාට්‍යයේ එන ගැටලු සසඳමින් වගුවක් සකස් කරන්න.

**නිපුණතාව 5.0** : නාට්‍යමය අවස්ථා සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගත වීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.3** : නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ඇගයීමට ලක් කරයි.

**ක්‍රියාකාරකම** : නාට්‍ය නිර්මාණය සමස්තයක් වශයෙන් ගෙන විචාරය කිරීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගැනුම් පල** :
- විකෘති නාට්‍යයෙන් ප්‍රකාශිත තේමාව පැහැදිලි කරයි.
- නාට්‍ය රචනයේ ප්‍රබලතා සහ දුබලතා දක්වයි.
- නාට්‍යයේ රංග ශෛලියේ ස්වභාවය පැහැදිලි කරයි.
- භාෂා හා විනය හා රංගෝචිත බව විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම්** : විකෘති නාට්‍යපෙළ, නාට්‍යයේ ඡායාරූප හෝ වීඩියෝ පටයක්

**ක්‍රියාකාරකම සැලසුම් කිරීම සඳහා උපදෙස් :**

**පියවර 01** විකෘති නාට්‍ය පිටපත, ඡායාරූපයක් හෝ වීඩියෝ පටය භාවිතා කරමින් පාඩම සඳහා පිවිසිය හැකි ය.

විකෘති නාට්‍යයේ කථා පුවත සහ එයින් ප්‍රකාශිත අදහස පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න. විකෘති නාට්‍ය තුළින් නූතන තරගකාරී සමාජයේ අධ්‍යාපනයේ ස්වභාවය සහ එම අධ්‍යාපනය බොහෝ යෞවනියන් ගේ ජීවිත ඛේදවාචකයක් බවට පත් කර ඇති අයුරු ප්‍රකාශ කරවන බව ප්‍රියංගනි, ජගත්, සරණපාල යන චරිත ආශ්‍රයෙන් පෙන්වාදෙන බව ප්‍රකාශ කරන්න.

එසේ ම ''විකෘති'' තුළින් බොහෝ දෙමාපියන් තම අපේක්ෂාවන් ඉටු කරගැනීම සඳහා තම දරුවන් බිල්ලට දෙන අයුරු ද විවෘත ආර්ථිකයත් සමග අසීමිත භෞතික සම්පත්වලින් පිරුණු විවිධ තාන්න මාන්නවලින් පිරුණු ජීවිතයන් කෙරෙහි සමාජය යොමු වී ඇති අයුරු ද නාට්‍ය තුළින් ප්‍රකාශ වන බව පෙන්වාදෙන්න.

**පියවර 02** පියවර 01 න් සඳහන් කළ අරමුණු ඉටු කරගැනීම සඳහා නාට්‍යකරු නාට්‍ය පෙළ සහ රංගය ගොඩ නගාගෙන ඇති අයුරු පෙන්වාදෙන්න. කතාව වර්තමාන මධ්‍යම පාන්තික පවුලක් කේන්ද්‍රකර ගනිමින් කෙටි අවස්ථා නිරූපණයන් රැසකින් යුක්ත ව පෙළ රචනා කර ඇති අයුරු පෙන්වාදෙන්න. අධ්‍යාපනික ක්‍රියාවලියේ ඇති විකෘතිතාව පෙන්වීම සඳහා නාට්‍යයට ගීත කොටස් ද යොදාගෙන ඇති බව පෙන්වාදෙන්න. එසේ ම නාට්‍යය තුළ ශාස්ත්‍රකරු ගේ අවස්ථාව, ටියුෂන් පොළ වැනි අවස්ථාවලින් ද නූතන සමාජීය ස්වභාවයන් ඉදිරිපත් කරන අයුරු සාකච්ඡා කරන්න.

නිදහස් රංග ක්‍රමයක් භාවිතා කර තිබෙන බවත්, පසුතල අවම, ස්ථානීය වෙනස්කම් වචනවලින් හෝ බෝඩ් එකක් පෙන්නුම් කරන ස්වාභාවික සංවාද සහ චලනත් තර්කානුකූල චලන හා තාලානුකූල සංවාද ගීත ගායනයන් යන සියල්ල සම්මිශ්‍රිත ව යොදාගනිමින් රංගය ගොඩ නගා තිබෙන බවත් පෙන්වා දෙන්න.

- සංගීතය සහ නර්තනය යොදාගැනීම තුළින් නාට්‍ය රංගනය තුළ ඇති ඒකාකාරිත්වය මඟ හරවාගෙන ඇති බව පෙන්වාදෙන්න.
- ඇඳුම්, පැළඳුම්, අංග රචනය, සාමාන්‍ය ස්වභාවයක් ගන්නා අතර පසුතල භාවිතය ද ඒ ඒ අවස්ථා සංකේතාත්මක ව දැක්වීමට යොදාගෙන ඇති අයුරු පෙන්වාදෙන්න.

**පියවර 03** විකෘති නාට්‍ය පෙළෙහි දැකිය හැකි සාධනීය ලක්ෂණ මෙන් ම නිශේධනීය ලක්ෂණ ද පෙන්වාදෙන්න.

- නාට්‍ය රචනයක් වශයෙන් ගත් විට එහි දුර්වලතා පවතින බව උදාහරණ කෙටි දර්ශන රැසක් යොදා ගැනීම තුළින් නාට්‍යමය ඒකත්වය බිඳී යෑම. කේන්ද්‍රීය කතා පුවතට එතරම් ම අදාළ නැති අවස්ථා නිරූපණයන් පැවතීම.ස්වාභාවික සංවාද සහ ක්‍රියා නිරූපණ අවස්ථාවන් එක වර ම නර්තන සහ සංගීතමය නිරූපණයන් බවට පත් කිරීම වැනි අංගයන් පෙන්වාදෙන්න.
- විකෘති නාට්‍ය නූතන අධ්‍යාපන ක්‍රමය ගැන ලියැවුණු විශිෂ්ටතමය ස්වභාවයක් ගත් නිරූපණයක් සේ පැවතීම.
- නාට්‍ය සන්දර්භය හා නොගැළපෙන අයුරින් ශාස්ත්‍රකරු, ටියුෂන් පොළ වැනි ඒවා ඉදිරිපත් කිරීම.
- සංවාද සහ අවස්ථා නිරූපණය ගත් විට ද නාට්‍යෝචිත භාවය බොහෝ සෙයින් දුර්වල ව පැවතීම.
- අවුරුදු 7 කට පසුව 10 වන දර්ශනය ඉදිරිපත් වීම. නාට්‍යමය භාවය හීන කරනු ලැබූ දර්ශනයක් වීම යන දුර්වලතා මෙම නාට්‍ය තුළ පවතින බව පෙන්වා දෙන්න.

**පියවර 04** චරිත හැකියා නිරූපණය තුළින් පුද්ගල ස්වභාවයන් එළිදරව් වීමට ඉඩ හරිනවා වෙනුවට ඍජු ව චරිත තම ස්වභාවයන් ගැන ප්‍රකාශ කරන සංවාද ඛණ්ඩ යෙදීම නිසා ද නාට්‍ය රසය හීන වන බව පෙන්වාදෙන්න.

- හිල්ඩා ගේ චරිතය, ප්‍රියංගනී ගේ චරිතය වැනි චරිත ගත් විට ද ඒවා තර්කානුකූල භාවයෙන් ඉදිරිපත් කිරීම මැනවින් සිදු වී නැති අයුරු පෙන්වාදෙන්න.
- සමස්තයක් වශයෙන් විකෘති නාට්‍ය තුළ යෞවන පරපුරටත්, වැඩිහිටි පරපුරටත් වැදගත් වන කරුණු අඩංගු නාට්‍යයක් වනවා සේ ම නූතන පරිභෝජන සමාජයක මිනිස් සිතුම් පැතුම් ක්‍රියාකාරිත්වයේ ස්වභාවය පෙන්නුම් කරන නාට්‍යයක් ලෙස හැඳින්විය හැකි බව පෙන්වාදෙන්න. එසේ නාට්‍ය රචනයක් වශයෙන් ද චරිත ගොඩ නැංවීම තුළින් ද ප්‍රස්තුතය වාර්තා කරන ආකාරයට සිද්ධි ගළපා තිබීම ද මෙහි කැපීපෙනෙන දුර්වලතා බවත් පෙන්වාදෙන්න.
- සමස්තයක් ලෙස නාට්‍යයක් රස විඳීමේ දී ප්‍රේක්ෂකයාට එහි ඇති උසස් නිර්මාණාත්මක ලක්ෂණ මෙන් ම දුර්වලතා ද හඳුනාගනිමින් එය වටහාගැනීම වැදගත් බව පෙන්වාදෙන්න.

**ඇගැයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- විකෘති නාට්‍යන්හි ප්‍රකාශ වන අදහස් විස්තර කිරීම.
- විකෘති නාට්‍ය නූතන සමාජය හා සංසන්දනය කිරීම.
- විකෘති නාට්‍ය තුළ දැකිය හැකි දුර්වලතා ප්‍රකාශ කිරීම.
- විකෘති නාට්‍යයේ රංග ශෛලිය පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීම.
- නාට්‍යයක් පිළිබඳ ව සමස්තය විග්‍රහ කිරීම.

**පැවරුම** : විකෘති නාට්‍ය පිළිබඳ ව පුවත් පතකට ඉදිරිපත් කිරීමට සුදුසු විචාරාත්මක රචනයක් ලියන්න.

**අතිරේක උදව්** : අභිනය 10 කලාපය
ප්‍රකාශය - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## විවිධ සහාය

**වයි. එම්. එම් කේ. යාපා මහත්මිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පළාත් අධ්‍යාපන කාර්යාලය - මහනුවර

**ජගත් පද්මසිරි මයා**
කථිකාචාර්ය
සෞන්දර්ය විශ්ව විද්‍යාලය

**චාමික හත්ලහවත්ත මයා**
ගුරු උපදේශක
පිළියන්දල කලාපය

**රසික ප්‍රසංග බණ්ඩාර මයා**
ගුරු සේවය
ස්වර්ණ ජයන්ති විද්‍යාලය, කෑගල්ල

**ජනකා භද්‍රාංගනී මිය**
ගුරු සේවය
තිවන්තකචෛතිය විද්‍යාලය,
අනුරාධපුර

**කුමාරි එදිරිසිංහ මිය**
ගුරු සේවය
ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, කුරුණෑගල

**රත්නා ලාලනී ජයකොඩි මිය**
ගුරු සේවය
රාජකීය විද්‍යාලය,
කොළඹ

**උදුලා රත්නායක මිය**
ගුරු සේවය
පොරමඩුල්ල ජාතික පාසල,
පොරමඩුල්ල

පරිගණක මෙහෙයුම් : **ඩබ්ලිව්. එම්. ධම්මිකා මිය**
මුද්‍රණාලය, ජාතික අධ්‍යාපන ආයතනය

සහාය : **ඊ. එම්. වික්‍රමනායක මිය**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

**කේ. පී. පෙරේරා මයා**
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය